# THE SIGNALLER

Sri Lanka Signal Corps Journal - 2009


















# කතුවැකිය...

ශ්‍රී ලංකා සංඥා බළකායට වසර 66 ක් සපිරෙන ඓතිහාසික අවස්ථාවේදී වාර්ෂිකව මුද්‍රණය කරනු ලබන "ද සිග්නලර්" සඟරාවෙහි දෙවනවරටද ප්‍රධාන කර්තෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලද සුවිශේෂී භාග්‍යයක් සේ සලකමි.

"තාක්ෂණයෙන් පිරිපුන් හමුදාවක්" ගොඩනැංවීමෙහිලා සංඥා බළකාය වෙතින් ඉටුකරනු ලබන සේවය තවදුරටත් පුළුල් පරාසයක් කරා ගෙනයාමත්, සංඥා බළකායෙහි කාලීන සිදුවීම් පිළිබඳව බලකා සාමාජිකයින් දැනුවත් කිරීම හා සියළුම නිළයින්ගේ ලේඛණ හා නිර්මාණ කුසලතාවයන් වැඩිදියුණු කිරීම මෙම සඟරාවේ මුඛ්‍ය පරමාර්ථය වේ.

ලෝකයේ තරඟකාරී තාක්ෂණික දියුණුව හා සමඟ වන නව සොයාගැනීම් සෘජුවම ආරක්ෂක හමුදාවන්හි භාවිතා කරන තාක්ෂණික උපකරණයන්ගේ ගුණාත්මක වර්ධනයටද ඉඳුරාම බලපානු ලබයි. විශේෂයෙන්ම අනාගතයේදී ඇති විය හැකි "තොරතුරු කේන්ද්‍රගත ගැටුම්" සඳහා (Information – Centric Fight) සාර්ථකව මුහුණදීම පිණිස අපද විශේෂ අවධානය යොමුකල යුතු අතර, ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්ව ඇති යුගයක යුද්ධ හමුදා සන්නිවේදනයේ පෙරගමන්කරුවන් වශයෙන් අපටද එහි විශේෂ කාර්යයභාරයක් නිතැතින්ම හිමිවෙයි.

ඉහත පරමාර්ථයන් මුදුන් පමුණුවාගැනීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ සංඥා බළකා සාමාජිකයින් දැනුවත් කිරීමට "ද සිග්නලර් සඟරාව" ඉදිරියේදී වඩාත් සිත්ගන්නා සුළු අයුරින් හා හරවත් අයුරින් මුද්‍රණය කිරීම සඳහා ඔබ සැමගේ කාලෝචිත හා නිර්මාණශීලී අදහස් හා යෝජනා කර්තෘ මණ්ඩලය වශයෙන් අප ඉත සිතින් අපේක්ෂා කරන්නෙමු.

අවසාන වශයෙන් මෙම වාර්ෂික කලාපය දෙවනවරටද අලංකාර අන්දමින් මුද්‍රණය කොට ඔබ අතට පත්කරන්නට ස්වකීය ශ්‍රමය කැපකල මහනුවර කෙන්ගල්ලෙහි පිහිටි එන්. එන්. ප්‍රින්ටර්ස් ආයතනයේ අධිපතිතුමා ඇතුළු කාර්යය මණ්ඩලයටද මාගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පුදකරමි.

## පටුන


| | පටුන | පිටු |
|---|---|---|
|  | පෙරවදන | 02-05 |
|  | මතක පොතින් | 06-43 |
|  | කෙළිබිම | 44 |
|  | උත්තම පූජා | 45 |
|  | කැටපත් පවුර | 46-53 |
|  | මන්දාකිණිය | 54-62 |
|  | මංගල සීනු | 63 |
|  | සංවේදී | 64 |

පෙරවදන...



# සංඥා බලකාධිපතිගේ පණිවුඩය

ශ්‍රීලංකා සංඥා බලකාය විසින් පළකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 11 වන කලාපය වෙනුවෙන් සංඥා බලකාධිපති වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් ලෙස සලකන අතර, මෙම වසර තුල සංඥා ඒකක තම සංඥා රාජකාරී තුලින්ද ආධාරක ඒකක පාබල රාජකාරී තුලින්ද දක්වන ලද කැපකිරීම් හා දක්ෂතා අගය කිරීමට අවස්ථාවක් කර ගනිමි.

පුරා තිස් වසරකට ආසන්න කාලයක් කුරිරු ත්‍රස්තවාදයෙන් පීඩාවට පත්ව තිබූ අප මව් බිම හා ශ්‍රී ලාංකික ජනතාව එම අඳුරු යුගයෙන් මුදවාගත් අභිමානවත් හමුදාවේ සාමාජික බලකායක බලකාධිපති වශයෙන් මම ද,එම බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබ සැමද පසුගිය වකවානුව තුල අත්විඳ, මුහුණදුන් නොයෙකුත් පීඩාවන්, අපහසුතාවයන්හි ප්‍රතිඵලයක් වශයෙන් අද මුළුමහත් ජාතියටම නිදහස උදාවී ඇති බැව් නොරහසකි. වර්ථමාන ලෝකයේ තාක්ෂණික දියුණුව හා නව සොයාගැනීම් සෘජුවම ආරක්ෂක හමුදාවන්හි භාවිතා කරන තාක්ෂණික උපකරණයන්ගේ ගුණාත්මක නවීකරණයන්ට බෙහෙවින් බලපානු ලබයි. ඒ සමඟින් වූ තාක්ෂණික දියුණුව හා ගෝලීයකරණය ත්‍රස්තවාදීන්ගේ සටන් උපක්‍රම දියුණු කිරීමට මහත්සේ බලපා ඇත. පොදුවේ ගත් කල ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත්, විශේෂයෙන්ම නව තාක්ෂණික උපකරණ භාවිතයේදී ශ්‍රී ලංකා සංඥා බලකායටත් ඉහත අභියෝගයන් වෙත නිරතුරුවම මුහුණ දිය යුතුවේ. එසේ බලන කල,පසුගිය වකවානුව තුල ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්කරන ලද නව සංඥා උපකරණ ක්‍රියාත්මක කරවීම, නඩත්තු කිරීම හා ත්‍රස්තවාදීන්ගේ නව තාක්ෂණික භාවිතයන් සඳහා ප්‍රතිතාක්ෂණික නිර්මාණයන් තුලින් සංඥා බලකා සාමාජිකයින් විසින් දැක්වූ හැකියාවන් පිළිබඳව, ගෞරවණීය ඉතිහාසයක් ඇති බලකායක් වශයෙන් අප සැමටම අද මෙන්ම මතු දිනයකදී අභිමානයෙන් යුතුව සැමරිය හැකි බැව්ද දන්වා සිටිනු කැමැත්තෙමි.

අප බලකාය යුද්ධ හමුදාව වෙතින් දියත් කරනු ලැබූ සියළු මානුෂික මෙහෙවර සඳහා රුදුරු ත්‍රස්තවාදීන්ට එරෙහිව වීරෝධාර හමුදා ඒකක සමග උරෙන් උර ගැටී නිවැරදි සංඥා සම්බන්ධතා සපයා දෙමින්ද, ආධාරක ඒකක පාබල රාජකාරී තුලින් යුධ පිටියේදී දක්වන ලද නිපුණතාවයන් හා හැකියාවන් දෙස බැලීමේදී සංඥා බළකාය ප්‍රමුඛ ස්ථානයක් ගන්නා බැව් පෙන්වා දීමට කැමැත්තෙමි.

යුද්ධ හමුදාව තුල අප බලකායට කීර්තියක් අත්කර දෙන්නට දායකවෙමින් අප මාතෘ භූමිය බේරාගැනීම සඳහා ත්‍රස්තවාදීන්ට එරෙහිව ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය සියළුම නිළධාරීන්/සෙසුනිලයින් හට හා සටනේදී ආබාධිත තත්වයට පත්ව සිටින සියලුම නිළධාරීන්/සෙසුනිළයිනටද මාගේ ගෞරවණීය ආචාරය පුදකිරීමටද මා කැමැත්තෙමි.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායේ සියලුම නිළධාරීන්/සෙසුනිලයින්, සිවිල් සේවක කාර්‍ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට, සාමය, සතුට, සෞභාග්‍ය පිරි වාසනාවන්ත අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

ඊපි ද ඉසෙඩ් අබේසේකර යූඑස්පි
බ්‍රිගේඩියර්
සංඥා බලකාධිපති








# ප්‍රධාන සංඥා නිළධාරිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පළකරනු ලබන, "ද සිග්නලර්" සඟරාවට ප්‍රධාන සංඥා නිළධාරි වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

සංඥා තාක්ෂණය, තොරතුරු තාක්ෂණය ලෙස වෙන් වෙන් වශයෙන් කටයුතු කල කාල වකවානුන් වෙනස්ව ඇති අතර, එය සංඥා තොරතුරු තාක්ෂණික (Information Communication Technology) වශයෙන් සංකලණ මුහුණුවරක් ගෙන ඇත. අප විසින් ඉදිරි කාලවකවානුවන්හි දී භාවිතා කරනු ලබන සන්නිවේදන උපකරණ ක්‍රියාකිරීම, නඩත්තුව ඉහත සංකලනයන්ට අනුරූපව වන බැවින්, ඒ සඳහා අවශ්‍ය වෙනස්වීම් අප විසින් සිදුකල යුතුවේ. ඒ සඳහා වන ගමන් මගෙහි දි යුධ හමුදාව විසින් භාවිතා කරන සංඥා උපකරණ, තොරතුරු තාක්ෂණ උපකරණ, සංඥා සහ තොරතුරු තාක්ෂණ ජාලගත කිරීම සම්මිශ්‍රණය කිරීම අප හමුවේ ඇති අභියෝග වනු ඇත. පසුගිය මානුෂීය මෙහෙයුම් අවස්ථාවන්හිදී එවැනි තාක්ෂණික අභියෝගයන් සංඥා නිළධාරීන්, සංඥා ක්‍රියාකරුවන්, තාක්ෂණික කාර්මිකයන් විසින් සපුරනු ලැබූ ආකාරය සැලකීමේදී ඉහත දක්වන ලද අභියෝගයන්ට මුහුණ දීමට ඇති හැකියාව පිළිබඳව ප්‍රධාන සංඥා නිළධාරි සහ ප්‍රධාන තොරතුරු නිළධාරි වශයෙන් මා හට ඇත්තේ දැඩි විශ්වාසයකි.

තවද සංඥා බලසේනාව, සියළුම සංඥා ඒකක, සංඥා මූලික වැඩපල, තොරතුරු තාක්ෂණ ඒකකය, සංඥා ක්ෂේත්‍ර වැඩපලවල්, විද්‍යුත් සංග්‍රාමික බළසෘණය විසින් පසුගිය මානුෂික මෙහෙයුම් සඳහා සම්පත් සීමිත අවධියකදී දක්වන ලද දායකත්වය ඇගයීමට මෙය මා අවස්ථාවක් කර ගනිමි. ආධාරක බළඇණි විසින් යුධ බිමේදී දක්වන ලද වීරත්ව මෙහෙයුම් කටයුතු පිළිබඳවද මා සාඩම්බරයෙන් සිහිපත් කරමි.

නව තාක්ෂණික වෙනස්වීම් වලට අනුරූපවීම සඳහා සංඥා පාසල විසින් ඉදිරියේදී සිදුකල යුතු කාර්යයන් ඉතා විශාල වන අතර, එය අප ඉදිරියේ ඇති අභියෝගයන් වනු ඇත. සංඥා මූලික වැඩපල හි ඉදිරි කාර්යයන් සංකීර්ණ තාක්ෂණයන් හා ගැටෙමින් සංකීර්ණ මුහුණුවරක් ගනු ලබන අතර ඒ සඳහා වන තාක්ෂණික දැනුම සංඥා කාර්මිකයන් වෙත ක්‍රමානුකූලව ලබා දිය යුතු වේ.

තවද, රට වෙනුවෙන් සටන් වැද තම ජීවිත පරිත්‍යාග කල සංඥා රණවිරුවන් හා ආබාධිත රණවිරුවන් ඇතුළුව සියළුම රණවිරුවන් මා මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරමි. තුවාල සිදුවූවන් හට ඉක්මන් සුවයත්, මිය ගිය රණවිරුවන් හා ආබාධිත රණවිරු පවුල්වල සියළුම සාමාජිකයන් හට වාසනාවන්ත හෙට දිනයක් ප්‍රාර්ථනා කරමි.

අවසන් වශයෙන් ශ්‍රී ලංකා සංඥා බලකායේ දැනට සේවයේ නියුතු සියළුම නිළධාරි / සෙසුනිළයින්ට හා ඔවුන්ගේ පවුල්වල සමාජිකයන් හටත් අප හා නිරන්තරයෙන් කටයුතු කරන සිවිල් සේවක කාර්ය මණ්ඩලයටත් ඔවුන්ගේ පවුල්වල සමාජිකයන් හටත් යස ඉසුරින් පිරි, සාමය සපිරි අනාගතයක් ප්‍රාර්ථනා කරමි.

එස්වීපීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී
බ්‍රිගේඩියර්
ප්‍රධාන සංඥා නිළධාරි



# සංඥා බලසේනාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් පළකරනු ලබන "ද සිග්නලර්" සඟරාවේ 11 වන කලාපය සඳහා සංඥා බළසේනාධිපති වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාව උදාවීම මා ලද ගෞරවයක් හා භාග්‍යයක් ලෙස සළකමි.

අනුමත ප්‍රධාන සංඥා නිළධාරි සංවිධානය යටතේ වන සංඥා බළසේනා මූලස්ථානය 2008 අගෝස්තු මස 11 දින ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානය යටතේ තනි මූලස්ථානයක් වශයෙන් සිය සංඥා රාජකාරි කටයුතු ආරම්භ කරන ලදි. ක්‍රියාන්විත/යුධ උපාය මට්ටමේ ප්‍රධාන සංඥා කාර්‍යයන් සහ අතිරේක සංඥා කාර්‍යයන් සඳහා සංඥා බළසේනා මූලස්ථානය ප්‍රධාන වශයෙන්ම වගකිව යුතු අතර, ඒ සඳහා සියළුම සංඥා රෙජිමේන්තු, සංඥා පාසල, විද්‍යුත් සංග්‍රාමික බළඝණය, මධ්‍යම හා ක්ෂේත්‍ර සංඥා වැඩපලවල් සංඥා බළසේනාවෙහි සෘජු අණදීම යටතේ ක්‍රියාත්මක වේ.

අප බළසේනාව මෙතෙක් යුධ හමුදාව වෙතින් දියත් කරනු ලැබූ සියළුම මානුෂීය මෙහෙවරයන් සඳහා රුදුරු ත්‍රස්ථවාදීන්ට එරෙහිව විරෝධාර පාබල හමුදා ඒකකයන් සමඟ ඉදිරියට යමින් වසර තිහකට ආසන්න කාලයක් අප මව්බිමට පිළිලයක් වූ ත්‍රස්ථවාදීන් විනාශ කර ලැබූ විජයග්‍රහණය වෙනුවෙන් සංඥා සම්බන්ධතාවයන් පැවැත්වීම වගකීමෙන් හා අධිෂ්ඨානයෙන් යුතුව කිරීමට හැකි වූයේ අප සෙබළුන් සතු එඩිතරකම, තාක්ෂණික නිපුනත්වය, නිසි පුහුණුව හා කැපවීම නිසාවෙනි.

මෙම කාල සීමාව තුල මාතෘ භූමියේ ස්වෛරී භාවයත්, භෞමික අඛණ්ඩතාවයත්, ආරක්ෂා කරමින් මතු පරපුර වෙනුවෙන් නිවහල් දේශයක් ගොඩනැගීමේ පරම පවිත්‍ර අදිටනින් යුතුව සටන් වැද අප අතරින් වියෝවූ නිළධාරින් සහ සෙසු නිළයින්ගේ පවුල්වල සාමාජිකයින් වෙත මාගේ හෘදයාංගම කණගාටුව ප්‍රකාශ කරන අතරම, තුවාල ලැබූ සියළු නිළයින්ටත් ඉක්මන් සුවය ප්‍රාර්ථනය කරමි.

දැනට ආසේමු (යාපනය), ආසේමු (වන්නි), ආසේමු (නැගෙනහිර) ආසේමු (කිලිනොච්චි), ආසේමු (මුලතිව්), සහ ආසේමු (දකුණ) බළප්‍රදේශයන්හි ක්‍රියාන්විත රාජකාරින් සඳහා මෙන්ම අනෙකුත් අභ්‍යන්තර ආරක්ෂක/පාලන කටයුතු වෙනුවෙන් සංඥා සම්බන්ධතාවයන් පවත්වනු ලබන අතර ඉදිරියටත් සියළුම සංඥා රෙජිමේන්තුන් සහ ස්වාධීන බළඝණ එක්ව සංඥා සම්බන්ධතා ප්‍රතිපලදායිව, අඛණ්ඩව ලබාදීම සංඥා බළසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ සිදුවනු ඇත.

අවසන් වශයෙන් සංඥා බළසේනා මූලස්ථානය වෙනුවෙන් සංඥා බලකායේ සියළුම නිළධාරින්/සෙසු නිළයින්, සිවිල් සේවක කාර්‍ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සමාජිකයන්ටත් "ද සිග්නලර්" සඟරාව එළි දැක්වීමට කටයුතු කල කතෘ මණ්ඩලයටත් මාගේ සුභාශිංෂණය පිරිනමමි.

කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සී යූඑස්ඒසීජීඑස්සී
බ්‍රිගේඩියර්
සංඥා බළසේනාධිපති



# සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් මීට වසර 11 කට ප්‍රථම එළිදැක්වීමට යෙදුන "ද සිග්නලර්" වාර්ෂික සඟරාව 2009 වසරේදී එළිදක්වන සිය 11 වන කලාපය වෙනුවෙන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද විශේෂ භාග්‍යක් කොට සලකමි.

සංඥා බලකායේ සාමාජිකයින් ලෙස මෙතෙක් අප ඉටුකල කාර්‍යභාරය තුලින් යුධ හමුදාවට ලබාදුන් සුවිශේෂ දායකත්වයට අමතරව කාලීන අවශ්‍යතාවය වෙනුවෙන් නඟාසිටුවන ලද නව ආධාරක බළඇණි 03 ක්ද, සංඥා ඒකක 01 ක්ද සමගින් ආධාරක බළඇණි 05ක් සමග සංඥා ඒකක 05ක් දක්වා වර්ධනය වන ලදී. යුධ හමුදාවේ හා රටේ අරමුණ වූ දශක තුනකට ආසන්න කාලයක් පුරා පැවති කුරිරු ත්‍රස්තවාදයේ බිහිසුණු බවින්, රටත් ජාතියත් බේරාගැනීමේ උත්තරීතර කාර්යයට උරදුන් සංඥා බළකා සාමාජිකයින් පිළිබඳව සඳහන් කරනුයේ ගෞරවාභිමානයෙන් යුතුවය.

එදා මෙදා තුර අප ආ ගමන් මඟෙහි සියලු තොරතුරු හා සංස්කෘතික මෙන්ම තාක්ෂණික තොරතුරුද හැකි පමණ කැටි කොට "ද සිග්නලර්" වාර්ෂික සඟරාව තුලින් අප වෙත ලබාදුන් දැනුම හා වර්ධනය අතිමහත් වන අතර, මෙතුලින් බිහිවූ නිර්මාණශීලි පිරිස්ද බොහෝය.

අවසන් වශයෙන් මෙවර "ද සිග්නලර්" සඟරාව 11 වන කලාපය සාර්ථක කරගැනිම සඳහා නව අදහස් හා නිර්මාණ මෙන්ම නොයෙකුත් තොරතුරු ලබාදීමෙන් දායකත්වය ලබාදුන් සංඥා බලකායේ සියළුම නිළධාරි/සෙසුනිළයින්ටත් ඔවුන්ගේ පවුල්වල අයටත් රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙනුවෙන් විශේෂ ප්‍රණාමය පිරිනමන අතර, "ද සිග්නලර්" සඟරාව දිනෙන් දිනම දියුණුවට පත් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

එම්ටී වෛද්‍යරත්න
කර්නල්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක.


මතක
පොතින්
සංවත්සර හා වසරේ විශේෂ සිදුවීම්
කෙළි
බිම
මන්දාකිණිය
උත්තම
පූජා
මංගල
සීනු
සංවේදී
THE SIGNALLER
SIGNALLER
THE SIGNALLER
SIGNALLER
THE SIGNALLER
SIGNALLER
SIGNALLER
THE SIGNALLER
SIGNALLER
THE SIGNALLER

## මතක පොතින්

# 65 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## ශ්‍රී ලංකා සංඥා බලකාය



බ්‍රිගේඩියර් ටීපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී සංඥා බලකාධිපති වශයෙන් 2009.07.16 දින වැඩ භාරගැනීම.



නව සංඥා බලකාධිපති බ්‍රිගේඩියර් ටීපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී සංඥා බලකායේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සමග සියළු නිල දිවා භෝජන සංග්‍රහයකට සහභාගි වෙමින්.



බ්‍රිගේඩියර් එස්ඒපීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී ප්‍රධාන සංඥා නිළධාරී වශයෙන් 2009.07.22 දින වැඩ භාරගැනීම.



65 වන සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ බනි/සැරයන් නිවස්න සාදය.



බ්‍රිගේඩියර් එස්ඒපීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී ප්‍රධාන සංඥා නිළධාරී වශයෙන් නව ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථාන කාර්යාලය 2009.08.03 දින විවෘත කිරීම.



බ්‍රිගේඩියර් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සී යූඑස්ඒ සීපීඑස්සී සංඥා බලසේනාධිපති වශයෙන් 2009.08.11 දින වැඩ භාරගැනීම.

# ශ්‍රී ලංකා සංඥා බලකාය

**2009.02.04 - 61 වන නිදහස් දින උත්සව පෙළපාලියේ විශේෂ අවස්ථා.**











# ශ්‍රී ලංකා සංඥා බලකාය

**යුධ හමුදා 60 වන සංවත්සර පිරික්සුම් පහන් සංදර්ශනය සඳහා ශ්‍රී ලංකා සංඥා බලකායේ දායකත්වය**









**යුධ හමුදා 60 වන සංවත්සර ප්‍රදර්ශනයේ සංඥා බළකා කුටිය**



# සංඥා බලසේනා මූලස්ථානය

## සංඥා බළසේනා මූලස්ථානය ස්වාධීන මූලස්ථානයක් වශයෙන් ආරම්භ කිරීම.

සංඥා බළසේනා මූලස්ථානය ස්වාධීන මූලස්ථානයක් වශයෙන් 2008 අගෝස්තු මස 11 දින සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ පහත මාලයේදී එවකට කාර්‍ය නියුක්ත බළසේනාධිපති වූ වත්මන් බළසේනාධිපති වන බ්‍රිගේඩියර් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යුඑස්පී පීඑස්සී යුඑස්ඒසීපීඑස්සී විසින් පොල්තෙල් පහන දල්වා ඉතා චාම් උත්සවයකින් පසු රාජකාරි ආරම්භ කරන ලදී.

එදින සිට දිවයිනේ සියළුම ක්‍රියාන්විත/ක්‍රියාන්විත නොවන ප්‍රදේශයන්හි සංඥා රාජකාරීන් අධීක්ෂණය, කළමනාකරණය හා පරිපාලනය මෙම බළසේනාධිපතිගේ මග පෙන්වීම යටතේ සිදුවිය. සංඥා බළසේනාධිපති සමඟින් බළසේනා මේජර්වරයෙකු ඇතුළුව සෙසුනිළයින් 04 දෙනෙකුගෙන් යුත් කාර්‍ය මණ්ඩලයක් යටතේ නව රාජකාරි ආරම්භ කල, අතර වත්මන්ව නිළධාරීන් - 03 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් - 11 දෙනෙකුගෙන් යුත් කාර්‍ය මණඩලයකින් සමන්විත වේ.

2008 අගෝස්තු මස 11 වන දින සිට නවතමයෙන් ආරම්භ කරන ලද සේනාංක මූලස්ථාන/කාර්‍ය සේනාංක මූලස්ථාන/බළසේනා මූලස්ථාන/ප්‍රදේශ මූලස්ථාන හා ඒකකයන් වෙත අවශ්‍ය සංඥා උපකරණ හා ක්‍රියාකරුවන් ලබාදීම බළසේනා මූලස්ථානයේ පූර්ණ අධීක්ෂණය යටතේ විධිමත්ව සිදුවිය.

තවද පළමු වසර තුල ආපසු හැරී බැලීමේදී අවම සම්පත් ප්‍රමාණයකින් හා භට පිරිස් ප්‍රමාණයකින් පැවරුණු රාජකාරීන් ඉතා උසස් මට්ටමකින් ඉටු කිරීමට හැකිවීම ඉතා සතුටට කරුණක් විය. මේ සඳහා සංඥා බළකායේ උසස් මූලස්ථානය මෙන්ම අනෙකුත් මූලස්ථාන/ඒකක/පුහුණු පාසැල් වෙතින් ලබාදුන් සහයෝගය ඉතා අගයමි.

බනි I එච්චම් පොඩිනිළමේ
ප්‍රධාන ලිපිකරු
සංඥා බළසේනා මූලස්ථානය.

## ආසේමු (ද) යටතේ ස්වාධීන සංයුක්ත සංඥා බළඝණයේ ආරම්භය

පසුගිය කාලපරිච්ඡේදය තුල යුධ හමුදාවේ සිදුවූ ව්‍යාප්තියත් සමගම සංඥා බළකායට නව සාමාජිකයෙකු බිහි විය.

එනම්, 11 සේනාංක බලප්‍රදේශය තුල සංඥා රාජකාරීන් ඉටුකල 2 වන සංඥා රෙජිමේන්තුව (සෙව්ජා) ඒකකය ආසේම (නැ) - වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගතවීමෙන් අනතුරුව 11 සේනාංක බලප්‍රදේශය තුල සංඥා රාජකාරි ඉටුකිරීම සඳහා 2009.05.06 දින සිට සංඥා බළසේනා මූලස්ථානයේ අණ හා පාලනය යටතේ පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමිය තුල නිළධාරි/සෙසුනිළයින් 01 x 30කින් යුත් ස්වාධීන සංයුක්ත සංඥා බළඝණය - පනාගොඩ නමින් නව බළඝණයක් ස්ථාපනය කරන ලදි.

ස්වාධීන සංඥා බළඝණය යුහමු හැර ආසේමු (ද) බලප්‍රදේශය තුල පිහිටා ඇති සියළුම බළසේනා මූලස්ථාන, ඒකක, පුහුණු පාසැල්හි සංඥා රාජකාරීන් ඉටුකිරීම මෙම බළඝණය වෙත පැවරුනු අතර, එම බලප්‍රදේශය තුල පැවැත්වෙන යුධ හමුදාවේ සියළුම උත්සව සඳහා ජන ඇමතුම් රාජකාරීන්ද ඉටුකරනු ලබයි. ඒකකයක් වෙතින් ඉටුකරනු ලැබූ මෙම රාජකාරීන් සංඥා බළකායට එක්වූ මෙම කුඩා බළඝණය වෙතින් නොපිරිහෙලා ඉටුකිරීම සනිටුහන් කරනුයේ ඉතාමත් නිහතමානිත්වයෙන් හා මහත් අභිමානයෙනි.

මේජර් ඩීඑල්ආර්පී අමරසිංහ - ශ්‍රීලංසංබ යන ජ්‍යෙෂ්ඨ නිළධාරි එහි ප්‍රථම බළඝණාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි.



මේජර් ඩීඑල්ආර්පී අමරසිංහ ස්වාධීන සංයුක්ත බළඝණයේ බළඝණාධිපති වශයෙන් 2009.05.08 දින වැඩ භාරගැනීම.






# 65 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

### 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය 66 වසරක ඉතිහාසයෙන් බිඳක්...

ශ්‍රී ලංකා සංඥා බලකාය, 1943 ඔක්තෝම්බර් මස 19 වන දින අංක 9183 දරණ ගැසට් නිවේදනයට අනුව අභිනවයෙන් ආරම්භ කරන ලදි. මෙය ස්වෙච්ඡා හමුදා පිරිස් වලින් සැදුම් ලත් බන්ධයකින් නඟාසිටුවා 1950 දී නිත්‍ය හමුදා පිරිස් වලින් සමන්විත බන්ධයකින්ද, 1952 දී ඛණ්ඩ දෙකකින් සමන්විත බළඝණයක් ලෙසද ව්‍යාප්ත විය. එවකට සේවය කල කාර්මික නිපුනත්වයෙන් යුතු දක්ෂ නිළධාරීන් හා සෙසුනිළයින්ගෙන් සැදුම්ලත් හමුදා පිරිස් විසින් ඉටු කරනු ලැබූ භාරදූර රාජකාරීන් කිහිපයක් මෙහිලා සඳහන් කිරීම අත්‍යවශ්‍ය කරුණකි. එනම් 1952 දී නීති විරෝධී සංක්‍රමණ වලක්වාලීමේ ක්‍රියාන්විත, 1956 දී ජාතිවාදී කෝලාහල මර්ධනය කිරීමේ ක්‍රියාන්විතය හා 1957 දී ගංවතුරෙන් විනාශයට පත් වූවන් ගලවා ගැනීම සදහා සංඥා සම්බන්ධතාවයන් සැපයීම, තවද 1962 වසරේදී ගුවන් විදුලි සංස්ථාවේ ඇතිවූ වැඩ වර්ජනය හේතුවෙන් එහි කටයුතු ඇණහිටීම වළක්වා ප්‍රචාරක කටයුතු අඛණ්ඩව සාර්ථක අයුරින් ඉටු කිරීම සදහා වෘත්තීය සෙනින් යෙදවීම සහ 1971 අප්‍රේල් කැරැල්ල මර්ධනය කිරීම සඳහාද සංඥා සම්බන්ධතා සැපයීම තුලින් යුධ හමුදාවේ මෙන්ම ලක්වාසී සියළු දෙනාගේ ගෞරවාදරයට පාත්‍රවිය. ඒසේම යුධ හමුදාව ව්‍යාප්ත වීමත් සමඟම, ඒ සඳහා සංඥා සම්බන්ධතාවයන් සැපය්මට සංඥා ඒකකයක අවශ්‍යතාවයක් ඇති වූ බැවින් එවකට පැවති සංඥා බළඝණය පුළුල්කොට 1958 වසරේදී 1 වන සංඥා රෙජිමේන්තුව වශයෙන් නඟා සිටුවන ලදි.

1972 වසරේදී 1 වන සංඥා රෙජිමේන්තුව වෙත සංඥා වෘත්තිමය රාජකාරි වලට පරිභාහිරව ක්‍රියාන්විත රාජකාරීන් ඉටු කිරීමේ කාර්‍යයද පැවරුණු අතර, එම වසරේ සිට 1989 වසර දක්වා කාලය තුල මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාන්විත මෙන්ම පාලනමය අවශ්‍යතාවයන් වෙනුවෙන් පනාගොඩ යුධ හමුදා ජනපදයේ ස්ථානගතව සංඥා සම්බන්ධතාවය සැපයීම සිදු කරන ලදි. එවකට රටේ පැවති ආරක්ෂක අවශ්‍යතාව මත යුධ හමුදාවේ ව්‍යාප්තවීමත් සමඟම ඊට අවශ්‍ය සංඥා සම්බන්ධතාවය සැපයීමේ කටයුතු සාර්ථක කර ගැනීම පිණිස නවතමයෙන් 3 වන හා 4 වන සංඥා රෙජිමේන්තු පිළිවෙලින් 1989 හා 1991 වර්ෂ වලදී ස්ථාපනය කරන ලදි. මෙකී සංඥා රෙජිමේන්තු අතරින් 4 වන සංඥා රෙජිමේන්තුව ස්ථානගතව තිබූ මඩකලපුව ප්‍රදේශයෙන් ඔවුන් මුදවාලීම පිණිස 1 වන සංඥා රෙජිමේන්තුව මඩකලපුව කල්අඩි ප්‍රදේශයේ 1994.05.12 දින ස්ථානගතකරන ලදි. එසේ ස්ථානගතව එවකට නැගෙනහිර ප්‍රදේශයේ ත්‍රස්ථවාදීන්ට එරෙහිව ක්‍රියාත්මක කරන ලද ක්‍රියාන්විතයන් සඳහා සංඥා සම්බන්ධතාවය සැපයීම මෙන්ම පාබල රාජකාරීන්ද ඉතා සාර්ථක ලෙස ඉටුකල මෙම ඒකකය 1996.12.31 දින යුධ හමුදාවේ ව්‍යාප්තිය හා ආරක්ෂක සේනා මුලස්ථාන සංඥා ඒකක සංකල්පය මත නැවත මින්නේරිය මහසෙන්පුර ප්‍රදේශයේ ස්ථාන ගතවිය. ඉන් පසු මෙම ඒකකය පුරා වසර 12 කට ආසන්න කාලයක් ආරක්ෂක සේනා මුලස්ථානය (නැගෙනහිර) ප්‍රදේශයේ ස්ථාන ගතව, නැගෙනහිර ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරි සඳහා අවශ්‍ය සංඥා සම්බන්ධතාවය මනාව සැපයීමට දායක විය. මින්නේරිය වැව් ඉස්මත්තේ සුන්දර කැලෑව තුල කූඩාරමකින් තම ඒකක නිවහන ආරම්භ කර, එය පසුකාලීනව ඒකකයේ සියළුම නිළයින්ගේ දැඩි අධිෂ්ඨානය මෙන්ම, කැපවීම හා ශ්‍රමදායකත්වය මත වසර කිහිපයක් තුලදී සියළු පහසුකම් වලින් යුතු අංගසම්පූර්ණ ඒකකයක් බවට පත් කිරීමට හැකිවීම මෙම ඒකක සියළු නිලයින්ගේ කැපවීම හා අධිෂ්ඨානයේ ප්‍රතිඵලයකි.

මෙසේ ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) බලප්‍රදේශය තුල ස්ථානගතව මාවිල්ආරු සොරොව්ව රුදුරු ත්‍රස්ථවාදීන්ගෙන් මුදාගැනීමේ මානුෂීය මෙහෙයුමේ සිට සමස්ථ නැගෙනහිර ප්‍රදේශයම ත්‍රස්ථවාදීන්ගෙන් මුදවාගැනීමේ ක්‍රියාන්විතයන් සඳහා ඉතා සාර්ථක අන්දමින් සංඥා සම්බන්ධතාවයන් සැපයීම තුලින් මෙම ඒකකය යුධ හමුදා උසස් නිළධාරීන්ගේ මෙන්ම සියළු පාබල ඒකකයන්ගේ නිරන්තර ගෞරවාදරයට පාත්‍ර විය.

ඉන්පසු වන්නි මානුෂීය මෙහෙයුම්වල යෙදී සිටි හමුදා පිරිස් වෙතද සංඥා සම්බන්ධතාවයන් සැපයීම සදහා මෙම ඒකකයේ ඉදිරි අණදීමේ මුලය සහ ක්ෂේත්‍ර සංඥා වැඩපල 2008.02.12 දින සිට වැලිඔය ප්‍රදේශයේ ස්ථානගත ගත විය. ඉන් පසු මෙම ඒකක උපක්‍රමික මූලය 2008.02.14 වන දින සිට 224 බලසේනා මූලස්ථානය පිහිටි සිංහපුර ප්‍රදේශයටද, එතැන් සිට 591 බලසේනා මූලස්ථානය ස්ථානගතව තිබූ නෙළුම්වැව ප්‍රදේශයටද, 2009.02.14 දින සිට පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයටද, ක්ෂේත්‍ර සංඥා වැඩපල ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේද, ක්‍රියාන්විත අවශ්‍යතාවය මත ස්ථානගත කරවීමට සිදුවිය. මෙම කාලවකවානුව තුල ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) යටතේ පාලනය වූ 53 වන හා 59 වන සේනාංක වෙතද, 4 වන හා 8 වන කාර්‍ය සේනාංකය වෙතද, ප්‍රදේශ මුලස්ථානය - වැලිඔය සහ එම මුලස්ථාන යටතේ පාලනය වූ සියළු බලසේනා මුලස්ථාන හා ඒකකයන් වෙතද සංඥා සම්බන්ධතාවය සපයමින් වන්නි මානුෂීය මෙහෙයුම් සාර්ථක කරගැනීම සඳහා ඉතා උසස් දායකත්වයක් ලබාදෙන ලදි.



**ලුතිතන් කර්නල් පීව්පේ පීරිස් අණදෙන නිලධාරි වශයෙන් මින්නේරිය හිදී 2008.08.16 දින වැඩ භාරගැනීම.**

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

යුධ හමුදාවේ හා වන්නි මානුෂීය මෙහෙයුමේ කාලීන අවශ්‍යතාවය මත වර්ෂ 2008.11.15 වන දින මෙම ඒකකය වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත වුවද, ඉතා කෙටි කාලයක් තුල එනම්, වර්ෂ 2009.05.15 වන දින යලිත් ඉදිරි ක්‍රියාන්විත මූලය ස්ථාපිතකොට තිබූ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේම ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) යටතේ ස්ථානගත වීමට සිදුවිය.

තම රාජකාරිය ඉතා මැනවින් ඉටුකරමින් වන්නි මානුෂීය මෙහෙයුමට ලබාදෙන ලද දායකත්වය තුලින් රුදුරු ත්‍රස්ථවාදය මුලිනුපුටා දැමීමට හැකිවීම සංඥා රෙජිමේන්තුවක් ලෙස අප ලද මහත් භාග්‍යයක් කොට සැලකිය හැක. එසේම දැනට මෙම ඒකකය ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) බලප්‍රදේශය තුල ස්ථානගත 59 සේනාංකය, 2 වන හා 4 වන කාර්ය සේනාංක, ප්‍රදේශ මූලස්ථානය (වැලිඔය) හා ආරක්ෂක සේනා මූලස්ථානය (කිලිනොච්චිය) බලප්‍රදේශයට අයත් 8 වන කාර්ය සේනාංකය වෙත සංඥා සම්බන්ධතාවය සපයනු ලබයි. එසේම වර්ෂ 2009 ඔක්තොම්බර් මස 10 වන දිනට 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය තම අභිමානවත් ගමනේ 66 වන සංවත්සරය සමරනු ලබන අතර මේ අවස්ථාවේදී මෙම ඒකකය මෙතෙක් සාර්ථකව ඉදිරියට රැගෙන පැමිණි සියළු නියමුවන් හට මෙන්ම, සේවයේ යෙදී සිට දිවි පිදූ හා ආබාධිත තත්වයට පත් සියළු ඒරෝධාර රණවිරුවන් ඉතා කෘතඥපූර්වකව සිහිපත් කරන්නෙමු. 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය අභිමානවත් ලෙස ශ්‍රී ලංකා ධරණී තලය තුළ තව දුරටත් තිබඳව වැජඹෙන බව ඒකාන්තය.



65 වෙනි සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ පිරිත් සජ්ඣායනය.



1 ශ්‍රීලංසංබ රෙජි මූලස්ථාන ගොඩනැගිල්ල මින්නේරියහිදී පිහිටා තිබියදී.



1 ශ්‍රීලංසංබ රෙජි මූලස්ථාන අණදෙන නිළධාරී කාර්යාලය - වැලිකන්දෙහි පිහිටා තිබියදී.



අභිනවයෙන් ඉදිකරන ලද නව 1 ශ්‍රීලංසංබ රෙජි මූලස්ථාන ගොඩනැගිල්ල - ඔඩ්ඩුසුඩාන්.



ලුතිතන් කර්නල් ඩබ්ල්සිඑන් වරකාගොඩ පිඑස්සි 1 ශ්‍රීලංසංබ 22 වෙනි අණදෙන නිලධාරි වශයෙන් 2009.09.03 දින අභිනවයෙන් වැඩ භාරගැනීම.






# 20 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

### 3 ශ්‍රීලංසංබ ඉතිහාසයෙන් බිඳක්

ශ්‍රී ලංකා සංඥා බළකා පවුලට එකතුවූ දෙවන ජ්‍යෂ්ඨතම සාමාජිකයා ලෙස 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය වර්ෂ 1989 මාර්තු මස 09 වන දින එවකට දෙවන සේනාංකය යටතේ රණසේවාපුර, අනුරාධපුරහි ස්ථාපනය කරන ලදී. 1989 න් පසු ත්‍රස්ථ කටයුතු මැඩලීම වෙනුවෙන් වන්නි සහ උතුරු ප්‍රදේශ වල ක්‍රියාත්මක කරන ලද සියළුම ක්‍රියාන්විත සඳහා සංඥා සම්බන්ධතාවය සාර්ථකව සැපයීමෙන් ඒ සඳහා මහඟු දායකත්වයක් ලබාදෙන ලදී. එසේ ක්‍රියාන්විත සඳහා සම්බන්ධ වන ගමන්ම අපටම කියා අපේම තැනක් තිබිය යුතු යැයි ස්ථිර අධිටනින් යුතුව එවකට සිටි අණදෙන නිළධාරීන් හා සෙසු අයවළුන්ගේ අප්‍රතිහත ධෛර්ය මත ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට අයත් භූමියක් ඒකකය වෙත පවරාගෙන 2000 මැයි මස 28 වන දින එහි ස්ථානගතවීමට ක්‍රියාකරන ලදී. එතැන් පටන් සියළු බාධක අභිබවමින් සීඝ්‍ර දියුණුවක් කරා ඒකකය ගමන් කරන ලද අතර, සියළු අංගෝපාංගයන්ගෙන් සපිරි යුධ හමුදා කඳවුරක් බවට පත්වීම ඒකකයට මෙන්ම පොදුවේ සංඥා බළකායට මහත් වූ අභිමානයක් ගෙනදෙන්නක් විය.

වර්ෂ 2007 සැප්තැම්බර් මස 18 වන දින අන්තර් ඒකක මාරුවීම් යටතේ යාපනය අර්ධද්වීපයට පැමිණි 3 ශ්‍රීලංසංබ ඒකකය ආසේමු(යා) යටතේ වාසවවිලාන් (පලාලි) හි ස්ථානගතවන ලදී. ඒවනවිට ලුතිතන් කර්නල් එම්පීජේඑස්කේ පටබැඳිගේ යන ජ්‍යෂ්ඨ නිළධාරිගේ අණදීම යටතේ ඒකකය පාලනය වූ අතර 2009.02.21 දින සිට 17 වන අණදෙන නිළධාරි ලෙසින් ලුතිතන් කර්නල් එච්එම්එල්ඩී හේරත් ආර්එස්පී පීඑස්සී විසින් අණදීම බාරගන්නා ලදී. ආසේමු(යා) මූලිකත්වයෙන් ආරම්භ කරන ලද සියළු ක්‍රියාන්විත සඳහා සංඥා සම්බන්ධතාවය ලබාදීම හා පැවරෙන සියළු රාජකාරීන් නොපිරිහෙලා ඉටුකරමින් 2009.03.09 වන දිනට එළඹි 3 ශ්‍රීලංසංබ ජීවන මගෙහි 20 වන සැමරුම චාම් උත්සවයකින් හා අභිමානවත් ලෙස සනිටුහන් කරන ලදී.

උතුර මුදාගැනීමේ මානුෂික මෙහෙයුමේදී 53 හා 55 සේනාංක මුහමලේ ඉදිරි ආරක්ෂක වළල්ලෙන් මෙපිටට පැමිණ ත්‍රස්ථයන්ගේ සියළු පදනම් පවුරු බිඳ දමමින් 2009.01.06 දින එල්ටීටීඊ ඉදිරි ආරක්ෂක වලල්ල සාර්ථකව අත්පත්කර ගන්නා ලදී. එතැන් පටන් ඉහත සේනාංක විසින් අලිමංකඩ දක්වා නොනවත්වා පැමිනීමෙන් පසු 55 සේනාංකය වෙත්තිලකර්නි, කෙවිල්, එලෙයි හරහා මුහුදු තීරය දිගේ පුදුමාතලන් උතුර දක්වා ක්‍රියාන්විත සිදුකරන ලදී.

යට කී එම සේනාංක වෙතින් ජයග්‍රාහීව අවසන් කරන ලද අති දැවැන්ත ක්‍රියාන්වීතය වෙනුවෙන් අප ඒකක සෙසු නිළයින් මහත් වූ කැපවීමෙන් යුතුව එනම් අවශ්‍ය ස්ථානයන්හි තාවකාලික සංඥා කුළුණු ඉදිකරමින් ප්‍රතිවිකාෂණ පද්ධති හා අහස් කම්බි සකසමින් පැහැදිලි හා නිවැරදි ලෙස සංඥා සම්බන්ධතාවය සැපයීම සඳහා දිවා රෑ නොබලා අපමණ පරිශ්‍රමයකින් කටයුතු කරන ලදී. සැබවින්ම මෙම ජයග්‍රාහී ගමනට සක්‍රියව දායකවීමට ලැබීම සංඥා ඒකකයක් වශයෙන් අපට මහත් වූ ආඩම්බරයකි. එම යුතුකම නොපිරිහෙලා ඉටුකිරීම සබැඳිව අප නිහතමානීව සතුටට පත්වන්නෙමු.

මෙම සුවිසල් කාර්යභාරය ඉටුකිරීම උදෙසා ආසේමු(යා) හි ස්ථාපිත අප ඒකකය වෙතින් පාලනය වනු ලබන ක්ෂේත්‍ර සංඥා වැඩපලෙහි දායකත්වය ඇගයීමට ලක්විය යුතුමය. එහි රාජකාරියේ නියුතු කාර්මික සෙනීන් දිවා රෑ නොබලා රාජකාරියේ නිරත වෙමින් නිසි කලට නිසිවෙලාවට අවශ්‍ය ගුවන්විදුලි යන්ත්‍ර/ප්‍රතිවිකාෂණ පද්ධති/අහස්කම්බි/දුරකථන/විදුලි කෝෂ ආදී සංඥා උපකරණ අළුත්වැඩියා කිරීම හා සුසර කිරීම ආදී ක්‍රියාවන්හි යෙදෙමින්ද ඇතැම් අවස්ථාවන්හිදී ක්‍රියාන්විත සිදුවෙමින් පවතින අතරතුර පවා තම සෙබළුන් යුධ බිමට යවා අක්‍රියවූ ගුවන් විදුලි යන්ත්‍ර ක්ෂණිකව අළුත්වැඩියා කර දී තත් ක්‍රියාන්විත සඳහා තම දායකත්වය නොමසුරුව ලබාදුන් බව කෘතවේදීව සිහිපත් කරමු.

තවද අප ඒකකය සමග අත්වැල් බැඳගනිමින් කටයුතු කරන විද්‍යුත් සංග්‍රාමික බළඝණය - අසේමු(යා) නිළයින්ද මෙම ජයග්‍රාහී අවස්ථාව සාක්ෂාත් කරගැනීම උදෙසා කල කැප කිරීමද මෙහිලා සිහිපත් කරනු ලබන අතර, ඔවුන් විසින් තම සංග්‍රාමික උපකරණ යාපන අර්ධද්වීපයේ නොයෙකුත් ස්ථානවල ස්ථාපිත කරමින් සතුරු ගුවන්විදුලි ජාලයන්ට සවන්දීම හා බුද්ධි තොරතුරු ලබාගැනීම, සතුරා සිටින ස්ථානය සොයාගැනීම, තම රේඩාර් පද්ධති මගින් ගොඩබිම, මුහුද, ගුවන් නිරීක්ෂණය කිරීම, සතුරු ගුවන්විදුලි ජාලයන්ට බාධා පැමිණවීම ආදී ක්‍රියාන්විත සාර්ථක කරගැනීම උදෙසා වූ අත්‍යවශ්‍ය තොරතුරු ලබාදීම තුලින් ළඟාකරගත් ජයග්‍රහණ ලඝුකොට තැකිය නොහැකි අතර එය පොදුවේ සංඥා බළකායට මහත් ගෞරවයක් ගෙන දෙන්නකි.

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකා ඉතිහාසයේ ස්වර්ණමය දිනයක් ලෙස රන් අකුරින් සනිටුහන් කරනු ලබන 2009.05.19 දින එනම්, දශක 03 කට ආසන්න කාලයක් කුරිරු ත්‍රස්ථයන්ගේ ග්‍රහනයට ලක්ව තිබූ අප මාතෘ භූමිය නිදහස් කරගැනීම අරඹයා ක්‍රියාකරන ලද සියළු සංග්‍රාමයන්හි සංඥා සැපයීම වෙනුවෙන් සුවිසල් කර්යභාරයක් සිදුකිරීමට හැකිවීම අප ඒකකයට මහත් අභිමානයක් ගෙනදෙන්නකි. ඒ සඳහා පසුගිය 20 වසර තුළ තම අමිල දිවිය/ශරීරාංග කැපකල 3 ශ්‍රීලංසංබ නිළධාරීන්/සෙසු නිළයින් මහත් ගෞරවයෙන් සිහිගන්වන අතර, ඉදිරියටත් මාතෘ භූමියේ උන්නතිය වෙනුවෙන් දිවිහිමියෙන් ක්‍රියාකිරීමට කැපවී සිටින බවට සපථ කරමින් 3 ශ්‍රීලංසංබ ගමන් මග මෙසේ සංක්ෂිප්තව සටහන් තබන වගයි.



ලුතිතන් කර්නල් එච්එම්එල්බී හේරත් ආර්එස්පි පිඑස්සි නව අණදෙන නිළධාරී ලෙස 2009.02.21 දින වැඩ භාරගැනීම.



උතුරු ක්‍රියාන්විත රාජකාරියේ යෙදෙන සෙනින්ගේ ගුවි යන්ත්‍ර/ප්‍රතිවිකාශන පද්ධති/අහස් කම්බි/දුරකථන/විදුලි කෝෂ ආදි සංඥා උපකරණ කඩිනමින් අළුත්වැඩියා කරදී තම දායකත්වය ඉදිරි ක්‍රියාන්විතයන්ට ලබාදෙන සංඥා වැඩපල සෙනින්.



ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) හි ස්ථාපිත ඒකකය වෙතින් පාලනය වනු ලබන ක්ෂේත්‍ර සංඥා වැඩපළ.



සතුරාගේ ඉදිරි ක්‍රියාකාරකම් ක්‍ෂණිකව ලබාදීම තුලින් ඉදිරි ක්‍රියාත්විත සැලසුම් කිරීමේදි මහඟු දායකත්වයක් ලබාදුන් ආසේමු (යා) විද්‍යුත් සංග්‍රාමික බලඝණයේ සෙනින් පිරිසක්. (එම විද්‍යුත් උපකරණ සමඟ)



53 හා 55 සේනාංකය වෙත මුහුමාලෙයි ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් ඉදිරියට සංඥා සම්බන්ධතා පැවැත්වීම සඳහා ඉදිකරන ලද සංඥා කුළුණ.

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

මෙම ඒකක නිළධාරි/සෙසුනිළයින්ගේ පරිහරණය වෙනුවෙන් ආරම්භ කරන ලද කායවර්ධන ගෘහස්ථ ක්‍රීඩාගාරය 2009.05.21 දින අසේමු (යා) කර්නල් ප්‍රමානි ලුහිතන් කර්නල් ඩබ්පීඩී වන්නිආරච්චි පීඑස්සී විසින් විවෘත කරන ලදී.





සිංහල හා හිංදු අළුත් අවුරුද්ද වෙනුවෙන් ආසේමු(යා)/ස්වාධීන රූපවාහිණී සේවාව විසින් සංවිධානය කරන ලද සූර්ය මංගල්‍ය 2009 උත්සවය සඳහා 3 ශ්‍රීලංසංබ වෙතින් නිර්මාණය කරන ලද වෙද ගෙදර.



අළුත් අවුරුදු උත්සව දිනයේ කඹ ඇදීමේ තරග අවස්ථාවක්.



2009.05.08 දිනට යෙදුනු වෙසක් පොහොය නිමිත්තෙන් මෙම ඒකක සෙනින් විසින් නිර්මාණය කරන ලද මුචලින්ද නාග දරණය.






# 18 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

**4 වන ශ්‍රීලංකා සංඥා බලකාය පසුගිය වසර තුල ඉටු කරනු ලැබූ රාජකාරීන් සහ මානුෂීය මෙහෙයුම් වෙනුවෙන් ලබාදුන් දායකත්වය**

4 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය පසුගිය වසර තුල ලද සියළු යුද ජයග්‍රහනයන්ට අද්විතිය මෙහෙයක් ඉටුකරන ලද අතර එය ඒකකය සහ බලකායම ගෞරවාදරයට හා පැසසුමට ලක්වුණු කරුණකි.

විශේෂයෙන්ම මෙම බලකාය පළාලි ප්‍රදේශයේ සිට ඒකක ස්ථාන මාරුවීම් ලැබ 2007 වසරේ අනුරාධපුර ප්‍රදේශයේ ස්ථානගත වු අතර, එහිදී 3 ශ්‍රීලංසංබ ඒකකය යාපනය අර්ධද්වීපයේ ස්ථාපනය වී කලක් ගතවන තුරු මෙන්ම ආසේමු (ව) බල ප්‍රදේශයේ සංඥා රාජකාරීන් ද කිසිදු ප්‍රමාදයකින් තොරව අවම හඨ පිරිස් ප්‍රමාණයක් යටතේ ඉටුකරලීමට සිදුවිය.

ශ්‍රී ලංකා යුද හමුදාවේ නව සේනාංක, කාර්‍ය සේනාංක, බලසේනා සහ ඒකකයන්හි ව්‍යාප්තියත් සමග ඇතිවු පුළුල් වු සංඥා සම්බන්ධතාවයන් අවම හඨ පිරිසක් හා අවම සංඥා උපකරණ ප්‍රමාණයක් මධ්‍යයේ ඉටු කරලීමේදී ඒකකය ඉතා දැඩි දුෂ්කරතාවයන්ට පත්වීමට සිදුවිය. කෙසේ වෙතත් ඒකකයේ සීමිත වු හඨ පිරිස් ප්‍රමාණයක් සිටියද ඔවුන් ගේ දැඩි කැපවීම මත උපරිම දායකතවයක් ඉදිරි ආරක්ෂක වළල්ල දක්වා රැගෙන යාමට හැකිවිය. එම සංඥා සම්බන්ධතා එලෙස ඉටු කරන අතරතුර අනුරාධපුර ප්‍රදේශයේ නගර ආරක්ෂාව කෙරෙහිද දැඩි විමසිල්ලකින් යුතුව සිට එහි සිදු කරන ලද සීමිත ක්‍රියාන්විතයන්ට හඨ පිරිස් හා සංඥා සම්බන්ධතා ලබාදීම දුෂ්කර කාර්‍යක් වුවද ඒ සඳහාද නොමද සහායක් ආසේමු (ව) - අනුරාධපුර හා මෙහෙයුම් ආඥාපති මූලස්ථානය වෙත ලබාදීමට කටයුතු කරන ලදී.

ආසේමු (වන්නි) බල ප්‍රදේශයෙන් 2008 වසරේ මානුෂීය මෙහෙයුම් ආරම්භවීමත් සමග මෙම ඒකකයට එම බල ප්‍රදේශයේ සංඥා සම්බන්ධතා ඉටු කිරීම ප්‍රබල වගකීමක් බවට පත්විය. ඒ අතර සංඥා බලසේනාවේ අධීක්ෂණය සහ මඟ පෙන්වීම යටතේ ශ්‍රීලංකා ටෙලිකොම් ආයතනය හා ඩයලොග් ආයතනයේ සම්බන්ධතාවයෙන් ලබාගන්නා ලද උපකරණ හා ඇන්ටනා කුළුණු උපයෝගී කර සීඩීඑම්ඒ හා ඩයලොග් දුරකතන සම්බන්ධතා මඟින් දුරකථන සංඥා සම්බන්ධතා ජාලය විධිමත් ලෙස ක්‍රියාත්මක කරලීමට හැකි වු අතර, ඒ තුලින් ඉදිරි ආරක්ෂක වළල්ලේ සෙබලාගේ සිට උසස් මුලස්ථාන දක්වා ක්‍රියානවිතයන්ගේ උණුසුම් තත්වයන් සැනෙකින් සම්බන්ධ වීමට ප්‍රබල සාධකයක් විය. තවද එම දුරකථන මගින් යුධ බිමේ රණවිරුවන් හට තම නිවෙස් හා සම්බන්ධතා ඇතිකර ගැනීමට හැකවීම තුලින් ඔවුන් විසින් ගොඩනගා ගත් චිත්ත ධෛර්‍ය ක්‍රියාන්විත මඟින් ලබාගත් යුධ ජයග්‍රහණයන්ට තවත් එක් මුලික කරුණකි.

මේ අතරතුර විශේෂයෙන්ම ඉදිරියට ඇදෙන ක්‍රියාන්විතයන් හි හඨ පිරිස්හි ඇවැසි ගුවන් විදුලි යන්ත්‍ර අවශ්‍යතා මෙන්ම ක්‍රියාවිරහිතවන ගුවන් විදුලි යන්ත්‍ර කඩිනමින් අළුත්වැඩියා කර ඔවුන් වෙත නොපමාව ලබාදීමට අවශ්‍යවිය. ඒ වෙනුවෙන් ඉදිරි මූලයක් කල්මාඩු ප්‍රදේශයේ ස්ථාපනය කරන ලදි. එම ඉදිරි මූලය වෙතින් ඉදිරි ආරක්ෂක වළල්ලේ හඨ පිරිස් භාවිතා කරනු ලැබූ ක්‍රියාවිරහිත ගුවන් විදුලි යන්ත්‍ර බොහෝ ප්‍රමාණයක් ප්‍රාදේශීය සංඥා වැඩපලක් ස්ථාපනය කර අළුත්වැඩියා කර නැවත ක්‍රියාන්විත සංඥා රාජකාරි සඳහා ප්‍රමාදයකින් තොරව ඉතා කඩිනමින් යොදා ගැනීමට හැකිවිය. ඒ අතරතුර ත්‍රස්ථවාදීන් වෙතින් අත්අඩංගුවට ගනු ලැබූ විවිධ සංඥා උපකරණයන් නැවත ක්‍රියාකාරී තත්වයට පත්කර සංඥා සම්බන්ධතාවයන් සඳහා යොදා ගැනීමටද හැකිවීම උපකරණයන්ගේ හිඟතාවයට යම් අස්වැසිල්ලක් විය. ක්‍රියාන්විතයන් වේගයෙන් නොනවත්වා ඉදිරියට ගමන් කිරීමත් සමග එයට අවශ්‍ය සංඥා සම්බන්ධතා කාර්‍යක්ෂමව ඉටු කිරීම වස් ඉදිරි මූලය කනගරායකුලම් හි ස්ථාපනය වු අතර, එය තවදුරටත් ඉදිරියට ගොස් මාන්කුලම් ප්‍රදේශයේ ස්ථානගත විය.

ආරක්ෂක සේනා මුලස්ථානය වව්නියාවේ සිට ස්ථාපිත 56, 57, 58, 61 සේමු, 1, 2, 3, 4, 5 කාර්‍ය සේනාංක සහ එයට අයත් සියළුම බලසේනා මෙන්ම පාබල ඒකකයන්හි මෙම ඒකක සංඥා ක්‍රියාකරුවන් ලබාදුන් දායකත්වය එලෙස ක්‍රියාවට නැංවෙද්දී ත්‍රස්ථවාදී කටයුතු නිරීක්ෂණය කරමින් පාබල සේනාංකයන්ට නිවැරදි ඉලක්ක කරා ගමන් කිරීමට ඇවැසි අවකාශයන් සලසා දෙමින් නිහඬව අද්විතීය මෙහෙවරක යෙදී සිටි පිරිසක්ද විය. ඒ රේඩාර් සහ දිශා සොයාගැනීම් කණ්ඩායම් හි රාජකාරි නියුතු විද්‍යුත් සංග්‍රාමික බලඝණයට අයත් සෙනින්ය. විශේෂයෙන්ම ඉතා කෙටි වේලාවක් තුල ත්‍රස්ථවාදී ක්‍රියාකාරකම් පිළිබඳව වු විස්තර නොපමාව උසස් මුලස්ථාන වෙත ලබාදීම සියළුම ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ පැසසුමට ලක්විය. මෙම සෙනින් හුදෙකලා

# 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

සටනක නිරතවිය. එල්ටීටීඊ නායක වේලුපිල්ලේයි ප්‍රභාකරන්ගේ අවසන් කාල පරිච්ඡේදය ඇතුලත් හෝරා කිහිපය දක්වා ඔහු ඇතුළු චාල්ස් ඇන්තනී, ස්වර්නම්, සුසෙයි, නඩේසන්, සහ පුලිදේවන් ප්‍රමුඛ කොටි බලකොටුව අයත් සියළු නායකයින් සිටි ඉසව්ව නිවැරදිව මෙම සෙනින් මගින් ලබාදුන් තොරතුරු මත පාබල ඒකක භඨ පිරිස් හට ත්‍රස්ථ නායකයන් විනාශ කිරීමට හැකි විය. මෙම ක්‍රියාවලිය යුද්ධය කඩිනමින් නිම වීමට මඟ පාදාදුන් තීර්ණාත්මක සාධකයක් වු බැව් නිසැකය.

සමස්ථයක් ලෙස 4 වන ශ්‍රීලංකා සංඥා බලකාය දැඩි දුෂ්කරතා මධ්‍යයේ දෙමළ ඊලාම් කොටි සංවිධානය ශ්‍රී ලංකාද්වීපයෙන් වලෙස තුරන් කිරීමට විශිෂ්ඨ මෙහෙයක් ඉටු කරමින් ලෝකයේ විශිෂ්ඨ හමුදාවක අතිවිශිෂ්ඨයන් බවට පත්වීම තවත් වසර ගණනාවක මතකයන් හි රැදීමට මෙන්ම සියළු දෙනාගේම ගෞරවයට පත්වන ලද යථාර්ථයක් බවද මෙහිලා අවසන් වශයෙන් සටහන් කළ යුතුය.



නව අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් එල්එස්පි පෙරේරා හට පිරිනමන ලද සම්මාන පෙළපාලිය

## 4 ශ්‍රීලංසංබ පුහුණු පාසල මගින් ආධුනික සෙනින් 500 කට අධික පිරිසක් පුහුණුවෙන් පසු මානුෂීය මෙහෙයුම් සඳහා මුදාහල වගයි.

4 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය 2007 වසරේ සැප්තැම්බර් මස අනුරාධපුර ප්‍රදේශයේ ස්ථානගතවීමත් සමග එම පුහුණු පාසල මගින් ඉතා අවම වු උපදේශක මඩුල්ලකගේ ඉතා දැඩි කැපවීම මත පුහුණුව ලත් විශිෂ්ඨ සෙබළුන් පිරිසක් යුද හමුදාව වෙතට දායාද කර දුනි.

විශේෂයෙන්ම ඉතා කෙටි කාලසීමාවක් තුල පාඨමාලා 04 ක පමණ සෙනින් මෙසේ පුහුණුවෙන් පසු මානුෂීය මෙහෙයුම් වෙත අවතීර්ණය කර ක්‍රියාන්විතයන්ට ඉතා අග්‍රගන්‍ය වු මෙහෙවරක් සිදුකර ඇත.



4 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව මානුෂික මෙහෙයුමෙහි ඉටුකරන ලද සංඥා මෙහෙවරේදී කොකාවිල් රූපවාහිනි සම්ප්‍රේෂණාගාරය ස්ථාපිත භූමියෙහි ඉදිකරන ලද ඇන්ටනා කුළුණ සහ ප්‍රතිවිකාශන මධ්‍යස්ථානය ක්‍රියාත්විත සඳහා අද්විතීය මෙහෙවරක් ලබාදෙන ලදී. (ඉහත ඡායාරූපයෙහි සටහන් වනුයේ එම කාර්යය ඉටුකල භඨ පිරිස් සංඥා කුළුණ ස්ථාපිත කිරීමේ කාර්යයේ යෙදී සිටින අයුරුය.)




මාණ්ඩලික විද්‍යාලයේ පාඨමාලාව හදාරන නිළධාරීන් වෙනුවෙන් 4 ශ්‍රීලංසංබ ඒකකය මගින් නිදර්ශන සංඥා මධ්‍යස්ථානයක් 56 සේමු හි ස්ථාපනය කර තිබූ අයුරු.

# 15 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 5 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය

### 16 වන වියට පා තබන 5 වන සංඥා බලකාය (ආධාරක බළඇණිය)

1994/01/02 වන දින ආරම්භ කරන ලද 5 වන ශ්‍රීලංකා සංඥා බළකාය (ආධාරක) ගතවූ වසර 15 ක කාලය තුල නැගෙනහිර ප්‍රදේශය තුල හා මානුෂික මෙහෙයුම සඳහා දායක වී ත්‍රස්ථවාදි ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීම උදෙසා ක්‍රියාන්විත රාජකාරි කල අතර, මෙම ඒකකයේ රණවිරුවන් ඒ සඳහා කල උදාර සහ අභීත ක්‍රියාන්විත සියළු දෙනාගේ ප්‍රශංසාවට ලක්වී ඇත. මෙම කාලය තුලදී ඒ වෙනුවෙන් දිවි පිදූ හා ආබාධිත තත්වයට පත් ඒකකයේ සියළුම නිළධාරි/සෙසුනිළයින් මේ මොහොතේ හදවතින් සිහිපත් කිරීම අප බළකායේ සියළුම දෙනාගේ එකම පරමාර්ථය වේ.

තවද ගෙවී ගිය වසරේ සිදුවූ වැදගත් සිදුවීමක් ලෙස වසර 15 ක පමණ කාලයක් නැගෙනහිර ප්‍රදේශයේ කල රාජකාරි වලින් මිදී ඉඳුරාම මානුෂික මෙහෙයුමට ඒකකයේ නිළධාරි/සෙසුනිළයින් 58 සේනාංකයට දායක වී ක්‍රියා කල අතර, අප ඒකක නිළධාරි/සෙසුනිළයින් එවකට ත්‍රස්ථවාදි ක්‍රියාකාරකම් දැඩි ලෙස පැවති නච්චකුඩා ආරක්‍ෂක වළල්ලට දැවැන්ත ප්‍රහාර එල්ල කරමින් නොබියව ඉදිරියට ගමන් කර ත්‍රස්ථවාදින්ගේ චිත්ත ධෛර්‍යය පහත හෙලීමට තරම් හැකියාවක් අප ඒකක නිළධාරි / සෙසුනිළයින් වෙත තිබූ බව මෙහිදී සඳහන් කරන්නේ ඉතාමත් හදපිරි සතුටිනි.

තවද මෙම ක්‍රියාන්විත පැවැති වතාවරණය තුලම මෙම ඒකකයේ 14 වන අණදෙන නිළධාරි වශයෙන් 2009/04/21 වන දින ලුතිතන් කර්නල් ඩබ්පී ඩයස් අභිනවයෙන් නව තනතුරේ වැඩ භාර ගැනිමත් සමඟ අප ඒකකයේ ක්‍රියාන්විත හා පාලන රාජකාරි වලට නව නායකත්වයක් දෙමින් මෙම ඒකකයේ ඉදිරි ගමන් මඟ ශක්තිමත් කිරීමටත් අප සැමගේ චිත්ත ධෛය්‍ර්ය ඉහළ නැංවීමටත් කටයුතු කිරීම ඒකකයේ වැදගත් සංධිස්ථානයක් බැව් මෙහිදි සඳහන් කරනු ලැබේ.

මෙසේ ගෙවී ගිය වසර 15 ක කාලය තුලදී අනෙකුත් ඒකකයන් හා උරෙන් උර ගැටී තම රාජකාරි සාර්ථකව ඉටු කිරීම සඳහා ඒකකයේ සියළුම නිළධාරි/ සෙසුනිළයන් හට ඒකක අණදෙන නිළධාරින්ගෙන් ලැබෙන මඟ පෙන්වීම 5 වන සංඥා බළකාය ලැබූ මහඟු දායාදයකි.

තවද 5 වන සංඥා බළකායේ නිළධාරින් හා සෙසු නිළයින් එක මවකගෙ දරු කැලසේ එකට එක්වී අභිතව ලක් මව වෙනුවෙන් කරන ලද උදාර මෙහෙවර අනාගතයේදි උපරිම ලෙස ඉටු කිරීමට ශක්තිය හා ධෛර්‍යය ලැබේවා යැයි එක සිතින් ප්‍රාර්ථනා කර සිටී.

මේජර් පීඑම්ඩී බංඩාර
5 ශ්‍රිලංසංබ (ආ/බ)



නව අණදෙන නිළධාරි වශයෙන් 2009.04.21 දින ලුතිතන් කර්නල් ඩබ්පී ඩයස් වැඩ භාරගැනීම.





5 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ හට පිරිස් ස්ථානගත නච්චකුඩා ඉදිරි ආරක්‍ෂක වළල්ල.

# 5 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය




2009/01/02 දිනට යෙදුන 5 ශ්‍රීලංසංබ ඒකක 15 වන සංවත්සර උත්සවයේ අවස්ථා.





වන්නි මානුෂීය මෙහෙයුමේදී 5 ශ්‍රීලංසංබ ඒකක භට පිරිස් විසින් සොයාගන්නා ලද ත්‍රස්තවාදීන්ට අයත් යුධ උපකරණ.



2009 සිංහල අළුත් අවුරුදු උත්සවය සැමරූ අයුරු.



# 12 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 6 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය

### 6 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය)

එවකට 525 බසේමු යටතේ ස්ථානගතවී සිටි 6 ශ්‍රීලංසංබ (ආධාරක බළඇණිය) 2007.08.19 දින සිට 2007.12.13 දින දක්වා ප්‍රධාන වශයෙන් මුහමලෙයි ඉදිරි ආරක්‍ෂක වළල්ල ආරක්‍ෂා කර ගැනීමේ රාජකාරීන්හි නිරතව සිටි අතර, ඊට අමතරව ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් ඔබ්බට විහිදෙමින් වෙනත් පාබල රෙජිමේන්තුවලට නොදෙවෙනිව යුද්ද සංග්‍රාමික මෙහෙයුම් වලද නිරත විය. මෙහිදි මෙම බළඇණියෙහි සියළුම රයිෆල් කණ්ඩායම් සඳහා ආධාරක කණ්ඩායමේද මනා සහයෝගයක් ලැබුණු අතර, බළඇණියෙහි විශේෂ ක්‍රියාන්විත ඛණ්ඩය ඊට මහත් ශක්තියක් එකතු කළේය.

මානුෂීය මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසුව 2009.01.19 දින 53 සේනාංකයට අයත් එවකට 525 බලසේනාව යටතේ ක්‍රියාන්විතයන්ට සහභාගී වෙමින් 6 ශ්‍රීලංසංබ (ආධාරක බළඇණිය) මුහමාලෙයි ඉදිරි ආරක්‍ෂක වළල්ල පසු කර ඉදිරියට ගමන් ගත් අතර, පලෙයි, අයියකච්චි, වල්ලිමුනෙයි, හා අලිමංකඩ යන ප්‍රදේශයන් කොටි ත්‍රස්ථවාදින්ගේ ග්‍රහණයෙන් මුදා ගැනීම සඳහා බෙහෙවින් දායක වී ක්‍රියා කළේය. 2009.01.23 දින ශ්‍රී ලංකාවේ වැදගත්ම ස්ථානයක් වන අලිමංකඩ ප්‍රදේශයන්හි බලය තහවුරු කොට පවත්වා ගැනිම සඳහා බලඇණි මූලස්ථානය සෙට්ටිකාඩු හි ස්ථාන ගත කරමින් වර්ග කි:මී: 38 ක්වූ විශාල ප්‍රදේශයක වගකීම භාර ගැනිමට මෙම බල ඇණිය නොපසුබට විය. මෙහිදි අලිමංකඩ සිට වල්ලිමුනෙයි ඉරට්ටලතොට්ටම් දක්වා වූ කි:මී: 11 ක ඉදිරි ආරක්‍ෂක වළල්ල රැක ගැනිම සඳහා ඒ, බී, සී සහ ඩී කණ්ඩායම් වලට පැවරිණ. ඊට අමතරව අලිමංකඩ කලපු මාවත රැක ගැනිමද බලඇණි බලප්‍රදේශය තුල නිතර සෝදිසි මෙහෙයුම් දියත් කරමින් බලය තහවුරු කොට පවත්වා ගැනිමද මෙම බලඇණිය වෙත පැවරුණු රාජකාරීන් වේ.

මේ වන විට 6 ශ්‍රීලංසංබ ආධාරක බළඇණියෙහි අණදෙන නිළධාරී වශයෙන් කටයුතු කල ලුතිතන් කර්නල් එල්එස්පි පෙරේරා ශ්‍රීලංසංබ මෙම ඒකකයෙන් සමුගනිමින් 2009-01-28 දින ලුතිතන් කර්නල් ඩීඑල් සරත්චන්ද්‍ර හට එම තනතුර භාරදෙන ලදි. එසේම මෙම බළඇණියෙහි දෙවන අණදෙන නිළධාරී වශයෙන් කටයුතු කල මේජර් ආර්එම්පීඑස්බී රත්නායක ශ්‍රීලංසංබ ස්ථාන මාරුවීම් ලබමින් 2009.02.05 දින එම තනතුර මේජර් එන්පීඒ මෙනඩිස් පිඑස්සි ශ්‍රීලංසංබ වෙත භාර දෙන ලදි.

අද වන විට 6 ශ්‍රීලංසංබ (ආධාරක බලඇණිය) 7 වන කාර්‍යය සේනාංකයට අයත් 672 බලසේනාව යටතේ ඉතා ස්ථාවරව අලිමංකඩ ප්‍රදේශයෙහි බලය තහවුරු කොට පවත්වා ගනිමින් සිටී. ශ්‍රීලංකාව තුල දීර්ඝ කාලයක් තිස්සේ පැවති යුද්ධයේ විජයග්‍රහණය සමඟින් වර්ථමානයෙහි ගෞරවාන්විත සාමයක් අත් විඳිනා මෙම බලඇණියෙහි සියළුම නිලයන් මේ වනවිට පැවරී ඇති රාජකාරීන්ට අමතරව සංඥා වෘත්තිය පුහුණුවීම් ද ඇතුලත් විශේෂ පුහුණුවීම් හි අඛණ්ඩව නිරතවී සිටින අතර, බලඇණියෙහි හඨපිරිස් තුල උසස් මානසිකත්වයත් පවත්වා ගෙන යාමට අත්‍යවශය සුභසාධක වැඩසටහන් රැසක්ද ක්‍රියාත්මක කරමින් සිටියි.

මේජර් එන්පීඒ මෙන්ඩිස් පිඑස්සි ශ්‍රීලංසංබ
දෙවන අණදෙන නිළධාරී
6 ශ්‍රීලංසංබ(ආධාරක)



**6 වන සංඥා රෙජිමේන්තුවෙහි නව අණදෙන නිළධාරී ලෙස 2009.01.28 දින මේජර් ඩීඑල් සරත්චන්ද්‍ර විසින් වැඩභාර ගත් අවස්ථාව.**

# 6 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය



මේජර් ඩීඑල් සරත්චන්ද්‍ර නව අණදෙන නිළධාරී ලෙස වැඩ භාර ගැනීමෙන් පසු ආගමික වතාවත් සිදු කිරීම.

6 ශ්‍රීලංසංබ(ආ/බ) හිටපු අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් එල්එස්පී පෙරේරා හා නව අණදෙන නිළධාරී මේජර් ඩීඑල් සරත්චන්ද්‍ර විසින් කඳවුරු පරීක්ෂා කිරීම.





2009.07.03 දින 7 වන කාර්ය සේනාංකයේ සේනාංකාධිපති කර්නල් ඒඩබ්එම්පීආර් සෙනෙවිරත්න ආර්එස්පී අයිජී විසින් ඒකක බලප්‍රදේශය තුළ සංචාරය කළ අවස්ථාව.

6 ශ්‍රීලංසංබ සෙනිත්ගේ සංඥා වෘත්තීමය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් 2009.08.22 දින ප්‍රථම වරට පවත්වන ලද "සිල්වර් හබ්" අභ්‍යාසය සඳහා සහභාගි වූ භට පිරිස් ඒකක අණදෙන නිළධාරී සහ උප අණදෙන නිළධාරී සමගින්.



# 7 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය

මාර්ගය ත්‍රස්ථවාදින්ගෙන් මුදා ගැනිමට පුරෝගාමී විය. එතැන් සිට උතුරු දිශාවට මෙහෙයුම් දියත් කරමින් ඉදිරියට ඇදුන මෙම ඒකකය උදයාර්කට්ටුකුලම් ප්‍රදේශය දක්වා පැමිණි ගමන් මගේදී අත්විඳින්නට වූ දුෂ්කරතා බොහෝය. පුරා මාසයක පමණ කාලයක් වියළි සලාක මළු පමණක් අහාරයට ගනිමින් පැමිණි සියළුම දුෂ්කරතා මධ්‍යයේ ක්‍රියාන්විතයන් සිදුකලද අප භට පිරිස් වල චිත්ත ධෛර්ය ඉතා උසස් මට්ටමක පැවතිනි. එම ගමන් මගේදී ඉතිහාසයට එක්කල ප්‍රධාන සංධිස්ථානයක් වනුයේ උදයාර්කට්ටුකුලම් වැව මුදා ගැනීමේ ක්‍රියාන්විතයට දායකත්වය ලබාදීමයි.

උදයාර්කට්ටුකුලම් වැව මුදාගැනීමෙන් අනතුරුව ඊට දකුණු දෙසින් ඒ 35 දක්වා දිවෙන අප්‍රධාන මාර්ගය විවෘත භූමියක් හරහා වැටී තිබූ අතර එම මාර්ගය අවහිර කිරිම සදහා ත්‍රස්ථවාදින් විසින් උපරිම වෙඩිබලයක් යොදා තිබ්ණ . එම මාර්ගය දිගේ ඉදිරියට ගමන් කිරිමේ මෙහෙයුම් 8 ශ්‍රිලංසිරෙ වෙත පැවරි තිබුණ නමුත් භූමිය පිහිටා තිබූ ස්වභාවය අනුව එය ඉතා අභියෝගාත්මක භාරධූර කටයුක්තක් විය. 2009.02.03 වන දින එම අභියෝගයට මහා චිත්ත ධෛර්‍යයෙන් යුක්තව අත ගැසූ මෙම ඒකකයෙහි ඒ සහ බී කණ්ඩායම් එක්ව ඒ සඳහා මෙහෙයුම් ආරම්භ කරන ලදි. දැඩි කැපවීමකින් යුක්තව සැලසුම් සහගතව සිදුකල එම ක්‍රියාන්විතයේදි ත්‍රස්ථවාදින්ට මහත් පරාජයක් අත් කර දෙමින් ඔවුන් පසුබැස්සවීමට එම භටපිරිස් සමත් විය. එහිදි ත්‍රස්ථවාදි කාන්තා මළ සිරුරු දෙකක්, එම්පීඑම්පී අවි 01 ක්, ටී 56 අවි 02 ක් සහ ගුවන් විදුලි යන්ත්‍රයක්ද අත්අඩංගුවට ගනුලැබූ අතර මෙම ඒකකයේ සෙනීන් 04 දෙනෙකු තුවාල වීම් වලට ලක් විය.

එලෙසින් වන්නිය මුදාගැනීමේ මානුෂීය මෙහෙයුමේදී විශිෂ්ඨ ජයග්‍රහණ රැසක් අත්කර ගනිමින් සිදුකරන ලද ක්‍රියාන්විතයන් අවසානයේදී 7ශ්‍රිලංසංබ ( ආ/බ ) ඒකකය ඉදිරි ආරක්‍ෂක වළල්ලෙන් මීට දෙවන ආරක්‍ෂක වළල්ලෙහි රාජකාරි සඳහා යොමු වූ අතර 2009.02.17 වන දින 2 වන කාර්‍ය සාදක බලකාය වෙතින් ඉවත්ව නැවත 57 සේනාංකය වෙත අනියුක්ත වන ලදි.

මෙම කාලය තුල ඒකකයේ අණදෙන නිළධාරි වශයෙන් රාජකාරි කල ලුතිතන් කර්නල් එස්එච්පිඩී තිලකරත්න ආර්එස්පි යන ජ්‍යෙෂ්ඨ නිළධාරි වෙනුවට නව අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් ඩීආර් ඇල්විටිගල යන ජ්‍යෙෂ්ඨ නිළධාරි පත්විය.

57 සේනාංකයට අනුයුක්තව 572 බසේමු යටතේ විශ්වමඩු ප්‍රදේශයේ මුදාගත් ප්‍රදේශ සෝදිසි මෙහෙයුම් රාජකාරි කල අතර, දැනට ඒ 35 මාර්ගයේ මාර්ග ආරක්‍ෂක රාජකාරියේ යෙදි ඇත.

මෙම ඒකකය ආරම්භයේ සිට පැමිණි ගමන් මගෙහිදි ත්‍රස්ථවාදින් 46 දෙනෙකු ජීවිතක්‍ෂයට පත් කිරිමටද තවත් බොහෝමයක් බරපතල තුවාල වීම් වලට ලක් කිරිමටද සමත් වූ අතර අත්අඩංගුවට ගන්නා ලද ද සැලකිය යුතු තරම් විය. වන්නිය මුදාගැනීමේ මානුෂීක මෙහෙයුම සඳහා එලෙස දිවිහිමියෙන් කල දායකත්වයේදී ඒකකයට අහිමි වූ සෙබළුන් ප්‍රමාණය 16 කි. තවද 25. දෙනෙකු බිම්බෝම්බ වලට හසුව පාද ආබාධිත තත්වයට පත්ව ඇති අතර තුවාල ලැබූ අනෙකුත් ප්‍රමාණය 139 ක් වේ.



2008.10.07 දින අණදෙන නිළධාරි තනතුර මේජර් එස්එච්පිඩී තිලකරත්න ආර්එස්පි විසින් භාරගත් අවස්ථාව.



2008.09.08 දින අණදෙන නිළධාරි වශයෙන් කටයුතු කළ මේජර් ඩීවීසී ජයසිංහ පීඑස්සී ඒකකයෙන් සමුගැනීම වෙනුවෙන් පැවති සියළු නිළයින්ගේ දිවා භෝජන සංග්‍රහය.





7 ශ්‍රිලංසංබ ඒකක භට පිරිස් විසින් 2008.09.11 දින අවසන් මානුෂිය මෙහෙයුමේදී අත්පත් කරගත් නොච්චිකුලම් ඉදිරි ආරක්‍ෂක වළල්ලේ ත්‍රස්ථවාදින් සතුව තිබූ බංකර් සංකීර්ණය.

# 7 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය




ඒකකයේ අණදීම හා පාලනය 2008.10.06 දින මේජර් එස්එච්පීඞී තිලකරත්න ආර්එස්පී හට වැඩබලන අණදෙන නිළධාරි මේජර් බීඅයි අස්සලාරච්චි පීඑස්සි විසින් භාරදුන් අවස්ථාව.

7 ශ්‍රීලංසංබ ඒකක භට පිරිස් විසින් 2008.09.11 දින නොච්චිකුලම් ඉදිරි ආරක්ෂක වළල්ලේදී ලබාගත් ත්‍රස්ථවාදින්ට අයත් අවි ආයුධ/වෙඩි ද්‍රව්‍ය.





2009.08.05 දින ලුතිනන් කර්නල් ආර් ඇල්විටිගල විසින් ඒකක අණදෙන නිළධාරි තනතුරේ වැඩ භාරගත් මොහොත.

# 1 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 8 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය

8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ආධාරක බළඇණිය) 2008.03.26 වන දින ශ්‍රී ලංකා සංඥා බළකායට එක් වූ අතර, මේ වන විට සිය දෙවන වසරට පා තබමින් සිටියි.

2008.03.26 වන දින මෙම ඒකකය නගා සිටුවා බළඇණි පුහුණු පාඨමාලාව උසස් පාබළ පුහුණු පාසල කටුකැළියාව වෙතින් හදාරන ලදී. මෙම බළඇණි පුහුණු පාඨමාලාව අතරතුර සිදුවූ අකුණු සැර වැදීමකින් මෙම ඒකක සෙනීන් 05 දෙනෙක් 2008.04.01 වන දින අප අතරින් ඉතාම කණගාටුදායක ලෙස වෙන් විය. වර්ෂ 2008 අප්‍රේල් මස 25 වන දින මුලින්ම 57 සේමු යටතේ කල්මඩු ප්‍රදේශයේ ස්ථානගතව වන්නි මානුෂීය මෙහෙයුමේ සංඥා අධාරක බළඇණියක් ලෙස සහභාගී විය. එතැන් සිට ආසේමු (ව) හා ආසේමු (යා) බළප්‍රදේශයන් තුල රුදුරු ත්‍රස්ථවාදය මුලිනුපුටා දැම්ම සඳහා මහත් වූ කාර්‍යභාරයක් ඉටු කරමින් පාබළ ඒකකයන්ට නොදෙවෙනි ආකාරයට තම උපරිම දායකත්වය වන්නි මානුෂිය මෙහෙයුමට ලබා දෙන ලදී.

මෙම ඒකකය සෘජුවම වන්නි මානුෂීය මෙහෙයුමට සහභාගී වීමේදී එක් එක් ප්‍රදේශයන්ගේ පැවති හඪපිරිස් අවශ්‍යතාවය මත බළඇණි මූලය නොයෙකුත් ප්‍රදේශයන්හී ස්ථානගත කිරීමට සිදුවිය.

එසේම මෙම ඒකක පළවන සංවත්සරය පැවැත්වීමට දින 02 ක් වැනි කෙටි කාලයක් තිබියදී කට්කිඩංකු ප්‍රදේශයේ ස්ථාන ගත වීමට සිදු වුවද සියලු අඩුපාඩුකම් පිරිමසාගෙන තමන්ට හැකි උපරිම අයුරින් පළවන සංවත්සරය සැමරීමට මෙම ඒකක නිළධාරින් සහ සෙසුනිළයින් ධෛර්යවන්ත විය. එසේම ඒකකය වෙත පැවරී ඇති ක්‍රියාන්විත/පාලන රාජකාරි හා නොයෙකුත් අපහසුතා මධ්‍යයේ වුවද වෘත්තිය පරීක්ෂණ, නිළ උසස් කිරීමේ පාඨමාලා හා මූලික සංඥා පාඨමාලාව, පවත්වා ඒකකයට අවශ්‍ය නිළ සංස්ථාව සම්පූර්ණ කිරීමටත් ආධාරක බළඇණියක් වශයෙන් යුධ දැණුම හා යුධ උපක්‍රම වර්ධනය කිරීම සඳහා කුඩා කණ්ඩායම් පාඨමාලාවන්ද පවත්වන ලදී. ඒ සඳහා පොදුවේ සියලුම අයවලුන් මහත් කැපවීමක් සිදු කර ඇත. තවද ආධාරක බළඇණියක් වශයෙන් මෙම කෙටි කාල සීමාව තුල පුහුණුව හා වෙනත් ආයතන වෙතින් පවත්වන්නට යෙදුනු පාඨමාලාවන් රැසකට නි/සෙනීන් සහභාගී කරවා ඇත.

තවද මෙම ඒකක ගමන්මඟ කුඩා වුවත් සේනාංක/බළසේනා යටතේ රාජකාරීන් සිදු කරන ලද කාල සීමාවන් තුල පාබළ ඒකක සමග උරෙන් උර ගැටී ඉදිරි ආරක්ෂක වළල්ලේ මෙන්ම මුදවා ගත් ප්‍රදේශ ආරක්ෂා කිරීමේ රාජකාරින් සිදු කර ඇත. මෙම කාල සීමාවේදී ත්‍රස්ථවාදීන් විසින් වළදමා තිබූ අවි ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් සොයා ගැනීමට මෙම ඒකක හඪපිරිස් සමත් විය. එසේම වන්නි මානුෂීය මෙහෙයුමට සහභාගී වූ නිළධාරියෙකු හා සෙසු නිළයින් 04 ක් රුදුරු ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් අප බළඇණියෙන් සඳහටම වියෝ විය.

දෙවන වසරට පා තබා තිබෙන මෙම ඒකකය ඉතාමත් සීඝ්‍ර දියුණුවක් ඉතාමත් කෙටි කාලයක් තුල ලබා තිබෙන අතර, නුදුරේදීම ශ්‍රී ලංකා යුධ හමුදාව තුල දිදුලන ඒකකයක් බවට පත් වන බැව් නොඅනුමානය.

8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායෙහි පළමුවන සංවත්සරිකය වෙනුවෙන් 2009.03.22 වන දින අනුරාධපුර ජයශ්‍රීමහාබෝධීන් වහන්සේ ඉදිරිපිට විශේෂ බෝධි පූජාමය පිංකමක් සිදු කෙරිණි. එහිදී අප බළඇණියෙන් සඳහටම වියෝ වූ සහෝදර සොල්දාදුවන් සිහිපත් කර විශේෂ පුණ්‍යානුමෝදනාවක් සිදු කෙරිණි.



**නව අණදෙන නිලධාරි වශයෙන් පත්වූ ලුතිතන් කර්නල් ඩීඑම්පීපී දසනායක 2009.09.04 දින ඒකකයේ වැඩ භාරගත් අවස්ථාව**

### <u>ඒකක සැමරුම් දිනය</u>

ඒකක සැමරුම් දිනය නිමිත්තෙන් 2009.03.26 වන දින ඒකක අණ දෙන නිළධාරිතුමා වෙත සම්මාන මුරයක් පවත්වන ලදී. එදින අණදෙන නිළධාරි විසින් ඒකක ධජය එසවීමෙන් අනතුරුව, ඒකක සමූහ ඡායාරූපයකට පෙනී සිටින ලදී. අණදෙන නිළධාරි තුමා සියලුම නිළධාරින් සහ සෙසුනිළයින් සමඟ දිවා භෝජන සංග්‍රහයට සහභාගී විය.

# 8 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය



2009.03.22 වන දින 8 ශ්‍රීලංසංබ ඒකක පළමු සංවත්සරය නිමිත්තෙන් ජයශ්‍රී මහ බෝධිය අසලදී බෝධිපූජාමය පිංකමක් පැවැත්වීම.



2009.03.26 වන දින 8 ශ්‍රීලංසංබ ඒකක පළමු සංවත්සරය නිමිත්තෙන් සියලු නිළයින් සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.



2009.03.26 වන දින 8 ශ්‍රීලංසංබ ඒකක පළමු සංවත්සරය නිමිත්තෙන් සියළු නිළයින් දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම.



2009.03.26 වන දින ඒකක පළමු සංවත්සර උත්සවයේදි අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ඩබ්සීඑන් වරකාගොඩ පීඑස්සී වෙත සම්මාන මුරය පිරිනැමූ මොහොත.

# 8 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය



2009.04.17 වන දින 7 වන කාර්‍යසේනාංකාධිපති කර්නල් ඒඩබ්එම්පීආර් සෙනෙවිරත්න ආර්එස්පී අයිජී ගේ බළඇණි සංචාරය - පුලාවේලි.



2009.04.06 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරල් එම්සීඑම්පී සමරසිංහ ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසි පීඑස්සී ගේ බළඇණි සංචාරය - පුලාවේලි.



2009.02.16 වන දින ඉලුප්පායිකුලම් හීදි සංඥා බළසේනාධිපති ගේ ඒකක සංචාරය.



8 ශ්‍රීලංසංබ හඨ පිරිස් යාපනය පුලාවේලි හි කලපුව ආශ්‍රිතව ඉදිරි ආරක්ෂක වළල්ල ඉදිකරමින්.



2009 වෙසක් උත්සවය සැමරීම.

# 1 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

### දිරියෙන් ඉදිරියට

රටේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීමේ අභිලාශයෙන් යුධ හමුදාවේ ශක්තිය වැඩි කිරීමටත් ක්‍රියාන්විත අවශ්‍යතාවයන් සඳහා සංඥා සම්බන්ධතාව ලබා දෙනු වස් වර්ෂ 2008 වූ ජූලි මස 15 වන දින සංඥා මැණියන්ගේ කණිටු පුතු වූ 9 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බළකාය පනාගොඩ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය තුල සුභ මොහොතින් උපත ලබන ලදී.

මේජර් ඩීඑම්පීපී දසනායකගේ අණදිම යටතේ ආරම්භ කෙරුණු ඒකකයේ පළවන පැවරුම වූයේ හතරවන ඊලාම් සටනේදී තීරණාත්මක කාර්‍ය භාර්‍යයක් ඉටු කල 58 සේනාංකය වෙත සංඥා සම්බන්ධතාවය ලබා දීමයි. 2008/08/07 වන දින මන්නාරම තල්ලඩි ප්‍රදේශයේ ඒකකය ස්ථාන ගතවූ අතර, ආරම්භයේ දි නිළධාරීන් 04ක් හා සෙසුනිළයින් 23න් දෙනෙකුගෙන් ඒකකය සමන්විත විය. මෙම ක්‍රියාන්විතයේදී 58 සේනාංකය හා එයට අයත් බළසේනා තුනක් යටතේ ඇති ඒකකයන් හි සංඥා අවශ්‍යතාවයන් කාර්‍යක්‍ෂමව ඉටු කරන ලද අතර, සීඩීඑම්ඒ දුරකථන පහසුකම් ලබා දෙනු වස් මුදාගත් ප්‍රදේශයන් හි ඇන්ටනා කළුණු ඉදි කරමින් නවීන තාක්‍ෂණය සටන් පෙරමුණට ලබා දෙන ලදි. ඉදිරියට ඇදෙන බළසේනා සමඟ යමින් 2009/02/05 දින පරන්තන් ප්‍රදේශයේ ඒකකයේ ඉදිරි මුලය ස්ථාපනය කරන ලද අතර, 2009/04/29 දින කිලිනොච්චිය ප්‍රදේශයේ ඉරණමඩු හන්දියට ආසන්නව විනාශ වී ගිය ත්‍රස්තවාදීන්ගෙන් අත්පත් කර ගන්නා ලද ස්ථානයක ඒකකය ස්ථාපනය කරන ලදී.

2009/05/24 වන දින මේජර් ඩීඑම්පීපී දසනායකගේ සමු ගැනීමෙන් පසුව ඒකකයේ නව අණදිම මේජර් කේඩීඩබ්එස් රත්නායක විසින් භාරගන්නා ලදි. ඉතා සුළු හඩ පිරිස් සංඛ්‍යාවකින් සමන්විත වූ ඒකකයේ ප්‍රමුඛතම කාර්‍යභාරය වූයේ ගුවන් ප්‍රහාර වලින් දැඩි ලෙස අලාභ හානි වී ගිය ගොඩනැගිලි පද්ධතිය පිලිසකර කිරීම හා භූමිය සකස් කර ගැනීමයි. අණදෙන නිළධාරීතුමාගේ දැඩි කැපවීම හා සෘජු අධීක්‍ෂණය යටතේ ඉදිකිරීම් ආරම්භ කරන ලද අතර. ඒකකයේ සියළුම තාරාතිරමේ අයවළුන්ගේ නොපසුබට උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් දින 60ක වැනි කෙටි කාලයක් තුලදි අක්කර 15ක පමණ විශාල භූමි භාගයක ආරක්ෂිත වැට හා බංකර් පද්ධතිය මුලින්ම ඉදිකල අතර, ඉතා විශාල වූ රෙජිමේන්තු මූලස්ථාන ගොඩනැඟිල්ල, උපකරණ කණ්ඩ ගොඩනැඟිල්ල, කේන්ද්‍ර සංඥා වැඩපළ ගොඩනැඟිල්ල, ගුවන් විදුලි උපකරණ ගබඩාව, සෙසුනිළ හඩ නිවාස, ආයුධාගාරය, දුරකථන හුවමාරු ගොඩනැඟිල්ල. මුළුතැන්ගෙය, ඛනි සැරයන් නිවස්න ගොඩනැඟිල්ල, සිවිල් සේවක හඩ නිවාස ගොඩනැඟිල්ල, දේශන ශාලා ගොඩනැඟිල්ල, සරඹ භූමිය හා ක්‍රීඩා පිටියද ඒ 9 මාර්ගයට යාබදව ජන අවන්හලක් හා කරණවෑම් හලක්, දුරකථන මධ්‍යස්ථානයක් ද ස්ථාපනය කරන ලදි. සම්පූර්ණයෙන් අවසන් කරන ලද මෙම ව්‍යාපෘතීන්ට අමතරව සෙසුනිළ භෝජනාගාරය, කොනොනි භෝජනාගාරය, සෙසුනිළ/කොනොනි රූපවාහිනි නැරඹීමේ ගොඩනැඟිල්ල. පුස්තකාල ගොඩනැඟිල්ල, සලාක ගබඩාව, නව මුළුතැන්ගෙයි ගොඩනැඟිල්ල, යාන්ත්‍රික ප්‍රවාහන අංශ ගොඩනැඟිල්ල ද කඩිනමින් ඉදිකරමින් පවතී,

ශ්‍රී ලංකා යුධ හමුදාව ප්‍රතිසංවිධානය වීමත් සමඟ ආරම්භ කරන ලද ආරක්‍ෂක සේනා මුලස්ථානය (කිලිනොච්චිය) යටතේ ඇති සේනාංක හා කාර්‍ය සේනාංක, බළසේනාවන් වෙත සංඥා සම්බන්ධතාවයන් පැවැත්වීම ඒකකයේ නව කාර්‍යභාරය වේ.






# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

2009/07/15 දිනට යෙදුනු ඒකකයේ පළවන සංවත්සරය ඉතා චාම් අන්දමින් සැමරූ අතර. ඒ වෙනුවෙන් 2008/07/15 වන දින අනුරාධපුර ජය ශ්‍රී මහ බෝධි රාජයානන් අභියසදී ඒකකයට හා සියළුම අයවළුන්ටත් සමස්ත යුධ හමුදාවටත් සෙත් පතා බෝධි පූජාවක් පවත් වන ලදි. 2009/07/20 දින සියළුම නිළයින් වෙනුවෙන් දිවා භෝජන සංග්‍රහයක් පවත් වන ලදි.

2009/07/30 දින ප්‍රධාන සංඥා නිළධාරි තුමන් වන බ්‍රිගේඩියර් එස්ඒපිපි සමරසිංහ ආර්එස්පි පීඑස්සි හා සංඥා බළසේනාධිපති තුමන් වන බ්‍රිගේඩියර් කේආර්පි රොවෙල් ආර්ඩබ්පි යූඑස්පි පීඑස්සි යුඑස්ඒසිපීඑස්සි කඳවුරු සංචාරය සිදු කරන ලද දිනදී නව රෙපිමේන්තු මුලස්ථාන ගොඩනැගිල්ලට ගෙවැදුන අතර, ප්‍රධාන සංඥා නිළධාරි තුමා වෙත සම්මාන මුරයක්ද පවත්වන ලදි. ප්‍රධාන සංඥා නිළධාරි තුමන් විසින් ඒකකයේ සියළුම නිළයින් ඇමතූ අතර, සීමිත භට පිරිසකින් ඉතා කෙටි කලකදී ඒකකය ලබා ඇති ප්‍රගතිය පිළිබඳව එතුමාගේ ප්‍රසංශාවට ලක්විය. අනතුරුව සියළුම නිළයින්ගේ සහභාගිත්වයෙන් තේ පැන් සංග්‍රහයක් පවත් වන ලදි.

2009/08/05 දින අණදෙන නිළධාරි තුමා ලුතිතන් කර්නල් නිළයට උසස් වීමද ඒකකයේ ඉදිරි ගමනට මහත් පිටුවහලක් හා අභිමානයක් විය.

සංඥා සෙබළුන්ගේ වෘත්තිය දැනුම වර්ධනය කරනු වස් මූලික සංඥා පාඨමාලාවක් ද 2009/08/10 දින ආරම්භ කර එය ඉතා සාර්ථකව කරගෙන යමින් පවතී. ඉදිරියේදී නිළ උසස් කිරීමේ පාඨමාලාවන් හා වෘත්තිය පරීක්ෂණ සිදු කිරීමට ඇවැසි කටයුතු සැලසුම් කර ඇත.

සෑම දිනකම අළුයම 05.30ට සෙත් පිරිතෙන් දිනය අරඹන 9 සංඥා පුතුන් මැදියම් රැය තෙක් සිය වෘත්තිය වගකීම් වල හා ඒකක සංවර්ධන කටයුතු වල යෙදෙනුයේ මහත් උද්යෝගයකිනි. දැන් අප නිළධාරින් 25 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් 210 දෙනෙකුගෙන් සමන්විතය. තවද මෙතෙක් පැමිණි දුෂ්කර ගමනේදී අපට අත් වැලක් වූ අනිකුත් සංඥා ඒකක හා සංඥා මූලික වැඩපළ මෙහෙය සිහිපත් කරනුයේ කෘතඥපූර්වකවය.

අණදෙන නිළධාරි තුමා වන ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායකගේ නායකත්වය හා මඟ පෙන්වීම යටතේ සංඥා බළකා 66 වන අභිමානවත් සංවත්සරය සමරමින් යන ගමනේ පෙර ගමන් කරුවන් ලෙසින් අනෙකුත් සංඥා ඒකක සමඟ අපද ගමන් කරනුයේ මහත් අභිමානයෙනි.

සෙ/66812 බනි 11 සමරසිංහ ආර්එන්පිකේ
9 ශ්‍රිලංසංබ



ඒකක පළවන අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් (එවකට මේජර්) ඩීඑම්පීපී දසනායක විසින් භට පිරිස් ඇමතීම.



2009 ජුලි 30 වන දින ප්‍රධාන සංඥා නිළධාරි බ්‍රිගේඩියර් එස්ඒපිපි සමරසිංහ ආර්එස්පි පීඑස්සී සහ සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් කේආර්පි රොවෙල් ආර්ඩබ්පී යූඑස්පි පීඑස්සී යූඑස්ඒසීපීඑස්සී යන නිළධාරින්ගේ 9 ශ්‍රිලංසංබ ඒකක සංචාරය.

# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



2009/07/30 දින ප්‍රධාන සංඥා නිළධාරි බ්‍රිගේඩියර් එස්ඒපීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී ඒකක හඩ පිරිස් විසින් පිළිගැනිම.



2009/07/30 දින ප්‍රධාන සංඥා නිළධාරි සහ සංඥා බළසේනාධිපති විසින් සියළු නිළයින් සමග තේ පැන් සංග්‍රහයට සහභාගි විම.



2009/07/30 දින ප්‍රධාන සංඥා නිළධාරිගේ ඒකක සංචාරය සිහිවීම පිනිස අඹ පැලයක් රෝපණය කිරිම.



2009/08/05 දින අණදෙන නිළධාරි මේජර් කේඒඩබ්එස් රත්නායක ලුතිතන් කර්නල් නිළයට උසස්වීම නිමිත්තෙන් පිරිනමන ලද සම්මාන මුරය.



2009.08.05 වන දින අණදෙන නිළධාරි මේජර් කේඒඩබ්එස් රත්නායක ලුතිතන් කර්නල් නිළයට නිළ උසස් වීම් ලැබීමෙන් පසු ඒ වෙනුවෙන් පැවැත්වූ තේ පැන් සංග්‍රහය.



2009/08/05 දින අණදෙන නිළධාරි විසින් සියළු නිළයන් ඇමතිම.






# 1 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## 10 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය

පුරා දශක 03ක් තිස්සේ පැවතුන කුරිරු යුද්ධය අවසානයක් කිරීම සඳහා ඇති කළ යුධ හමුදාවේ ව්‍යාප්තියත් සමඟ සංඥා බළකා පවුලේ ලාබාලතම සාමාජිකයා වශයෙන් 10 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය ආධාරක බලඇණිය 2008.08.01 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ ඉතිහාස පොතට එක්විය.

ප්‍රථමයෙන් කැලණිය රජමහා විහාරස්ථානයට ගොස් ඒකක ධජයට සෙත් පැතීම හා පුණ්‍ය කටයුතු ඉටු කර 2008.08.01 දින ඒකකයේ සියලු නිළධාරීන් හා සෙසු නිළයින්ගේ සහභාගීත්වයෙන් යුත්තව සම්මාන පෙළපාලික් පවත්වා සංඥා බලකාධිපතිතුමා විසින් ඒකක ධජය ඔසවා ඒකකයේ කටයුතු අභිමානයෙන් යුත්තව ආරම්භ කරන ලදී. බලඇණියේ ආරම්භක සාමාජිකයින් වශයෙන් නිළධාරීන් 12 දෙනෙකු හා සෙසු නිළයින් 490ක ගෙන් සමන්විත විය. ඉන් පසුව 2008.04.09 සිට 2008.08.09 දින දක්වා සංග්‍රාමික පුහුණු පාසල කොක්චිළිය වෙතින් බලඇණි පුහුණු පාඨමාලාව සාර්ථකව හදාරණ ලද අතර එම කාලසීමාව තුලදී රාත්‍රී පුහුණුවීමක යෙදී සිටි ආධුනික සෙබලුන් 04 දෙනෙකු විසින් ත්‍රස්ථවාදයකු ජීවග්‍රහයෙන් අල්ලා ගෙන ඔහු සන්තකයේ තිබූ අවි පතරොම්, බෝම්බ සහ කොම්පාසු අල්ලා ගෙන ඒකකයේ සාර්ථකත්වයේ ප්‍රථම වෙඩි මුරය මුදා හරිමින් සාර්ථක ගමනක ආරම්භය සනිටුහන් කරන ලදී.

බලඇණි පුහුණු පාඨමාලාව නිමවීමෙන් අනතුරුව 21 සේනාංකය යටතේ 214,215 බලසේනාවලට අනුයුක්තව බලඇණි මූලය සෙට්ටිකුලම කඳවුරේ ස්ථානගතව රාජකාරි කළ අතර යුධ හමුදා මූලස්ථානයේ උපදෙස් මත 2008.09.07 වන දින ඒකකයේ රයිෆල් කණ්ඩායම් 4 ක්‍රියාන්විත රාජකාරි සඳහා 57 සේනාංකය යටතේ 571, 572 සහ 573 බසේමු යටතේ පාබල ඒකකයන්ට අනුයුක්තව මල්ලාවි තුනුක්කායි අක්කරායන්කුලම් සහ කොකාවිල් යන ප්‍රදේශවල ක්‍රියාන්විත රාජකාරියෙහි නිරතවන ලදී. එම ක්‍රියාන්විත වලදී විශේෂ සන්ධිස්ථානයන් වන මල්ලාවි තුනුක්කායි කොකාවිල් ප්‍රදේශ අත්පත්කර ගැනීම සහ අක්කරායන්කුලම් ආරක්‍ෂක පස් බැම්ම බිඳ දැමීමේ ක්‍රියාන්විත සඳහා මෙම කණ්ඩායම් වල සෙබලුන් විශාල කාර්‍යය භාරයක් ඉටු කරන ලද අතර එම කාලසීමාව තුලදී විරෝධාර සෙබලුන් 02 නෙකු මව්බිම වෙනුවෙන් දිවිපුදන ලදී. මීට අමතරව නිළධාරීන් 01 ක් සහ සෙසුනිළයන් 30 දෙනෙකුට පමණ තුවාල සිදුවී ඉන් නිළධාරී 01 ක් සහ සෙසු නිළයන් 02 ක් ස්ථිර ආබාධිත තත්වයට පත්විය. 2008.10.28 දින බලඇණි මූලස්ථානය හා අණ සහ පාලන කණ්ඩායමද 57 සේමු යටතේ මල්ලාවි ප්‍රදේශයේ අභ්‍යන්තර ප්‍රදේශ ආරක්ෂක රාජකාරි සහ මාර්ග ආරක්‍ෂක රාජකාරීන් සඳහා ස්ථාන ගත විය. ත්‍රස්ථවාදීන්ට එරෙහි මානුෂික මෙහෙයුමේ ඉතාමත්ම වැදගත් සංධිස්ථානයක් වූ කිළිනොච්චිය මුදා ගැනීමේ මෙහෙයුමට ප්‍රථම බලඇණිය 572 බසේමු යටතේ ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරි සඳහා යොදවන ලදී.

කිළිනොච්චි මෙහෙයුමෙන් පසු බලඇණිය 5 කාසේමු යටතේ 652 බලසේනාව යටතට අනුයුක්තව මාර්ග ආරක්ෂාව අභ්‍යන්තර ප්‍රදේශ පීරා සෙවීමේ ක්‍රියාන්විත සහ ත්‍රස්ථවාදීන් විසින් සඟවා තිබූ අවි ආයුධ සොයාගැනීමේ රාජකාරි සඳහා යෙදී සිටින ලද අතර එහිදී ත්‍රස්ථවාදීන්ගේ අවි ආයුධ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගන්නා ලදි මානුෂීය මෙහෙයුමේ අවසන් අදියර සඳහා 2009.03.15 දින ඒකකය නැවත 57 සේනාංකයේ 572 බලසේනා මූලස්ථානය වෙත අනුයුක්තව පුතුකුඩුඉරිප්පු සුගන්ධිපුරම් ප්‍රදේශයේ ස්ථානගතව රාජකාරි කරන ලද අතර මෙහිදි ඉටුකරන ලද පීරා සෙවීමේ ක්‍රියාන්විත මගින් ත්‍රස්ථවාදීන් 30 කුට අධික ප්‍රමාණයක් විනාශ කිරීමට ද ත්‍රස්ථවාදීන් සතුව තිබූ

# 10 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය

අවි ආයුධ විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට ගැනීමට දායකත්වය ඉතා සාර්ථකව ලබා දෙන ලදි. ඊට අමතරව ඒකක හට පිරිස් පුදුමාතලන් ප්‍රදේශයේ අවතැන් වූවන් නිදහස් කිරීමේ මානුෂික මෙහෙයුමටද සක්‍රීයව සහභාගි විය. මෙම කාලසීමාව තුලදී නිළධාරීන් 01 ක් සහ සෙසුනිළයින් 02 ක් ක්‍රියාන්විත හේතූන් මත තුවාල සිදුවිය.

නවතමයෙන් නඟාසිටවූ ඒකකයක් වුවත් පසුගිය ක්‍රියාන්විත වලදී 10 ශ්‍රීලංසංබ ආධාරක බලඇණියේ නිළධාරින් සහ සෙසුනිළයන්ගේ ධෛර්‍යය මත් බව හා කැපකිරීම හා ඒ තුලින් ලබා ගත් විජයග්‍රහණයන් ඒ සඳහා මඟ පෙන්වූ සේනාංකාධිපතිවරුන් සහ බලසේනාධිපතිවරුන්ගේ නිබඳ ප්‍රසංශාවට භාජනය වූ අතර ඕනෑම රාජකාරියක් සඳහා යොදවා ගත හැකි ඉතාමත් හොඳ ඒකකයක් වශයෙන් ඔවුන්ගේ විශ්වාසනීයත්වයටද පාත්‍ර විය. වර්ථමානයේ මෙම ඒකකය 8 වන කාසේමු යටතේ 682 බලසේනා මූලස්ථානයට අනුයුක්තව අභ්‍යන්තර ප්‍රදේශ පීරා සෙවීමේ ක්‍රියාන්විත හා ත්‍රස්ථවාදීන් විසින් වල දමා ඇති අවි ආයුධ සොයා ගැනීමේ ක්‍රියාන්විත සිදුකරමින් පුතුකුඩුඉරිප්පු සුඟන්ධිපුරම් ප්‍රදේශයේ ඉතාමත් සාර්ථකව රාජකාරි ඉටුකරමින් සිටී. මීට අමතරව ඒකක අණදෙන නිළධාරිගේ අධීක්ෂණය හා උපදෙස් මත පසුගිය ක්‍රියාන්විත රාජකාරි හේතුවෙන් මඟ හැරී ඇති ඒකකයේ නිළ උසස් කිරීම් පාඨමාලා මූලික සංඥා දැනුම ලබාදීමේ පාඨමාලාවන් සහ ඒකක පුහුණුවීම් ප්‍රමුඛත්වයක් ලබා දී ආරම්භ කර ඇත.

වසරකට අඩු කෙටි කාලයක් තුල ඒකකය ලබා ඇති ප්‍රගතිය සහ සංග්‍රාමික පුහුණුවීම් තුලින් ලබා ගත් මනා පෞර්ෂයත් සාමූහිකත්වයත් තුලින් ඒකකයේ සාමාජිකයින් ලබා ඇති පරිනත භාවය සත්‍ය වශයෙන්ම සතුටුවිය හැකිය. ගත වූ කාලසීමාව තුල ඒකකයේ කිසිම නිළධාරි/ සෙසුනිළයකු එකඳු විනය විරෝධි ක්‍රියාවකට සම්බන්ධ නොවීම තුලින් ඔවුන්ගේ හික්මීම සහ ප්‍රෞඩත්වය මනාව විදහා දක්වා ඇත. ඒකකයේ සේවය කරන සියලුම නිළධාරීන්ගේ සහ සෙසු නිළයින්ගේ නායකත්වය කැපවීම උනන්දුව සහ දායකත්වය 10 වන ශ්‍රී ලංකා සංඥා රෙජිමේන්තුව වර්ථමානයේ ලබා ඇති ප්‍රගතියට ඉවහල් වී ඇති බව අවිවාදයෙන්ම පිළිගත යුතු සත්‍යකි.

ඒකකයේ පළමුවන සංවත්සරය සැමරීමට සුදානම් වන මේ මොහොතේ මව්බිමේ ඒකීය භාවය හා භෞමික අඛණ්ඩතාවය වෙනුවෙන් දිවිපිදු විරෝධාර සෙබළුන් ගෞරවයෙන් සිහිපත් කරමින් ඔවුන්ට අජරාමර නිවන් සුව අත්වේවායි පතන අතර තුවාල ලබා නේවාසිකව ප්‍රතිකාර ලබන සියළු දෙනා හට ඉක්මන් සුවය ප්‍රාර්ථනය කරමු.



ඒකක සංචාරයේදි ප්‍රධාන සංඥා නිළධාරි බ්‍රිගේඩියර් එස්ව්පිපී සමරසිංහ ආර්එස්පි පීඑස්සී සමරු සටහනක් තබමින්.



පළමු සංවත්සරය වෙනුවෙන් ඒකක අණදෙන නිළධාරි මේජර් වීඑල්කේ ජයරත්න පීඑස්සී හට පිරිනමන ලද සම්මාන මුරය.

# 10 වන රෙජිමේන්තුව (ආ/බ) ශ්‍රී ලංකා සංඥා බලකාය



ඒකක සංවත්සරය වෙනුවෙන් පැවති නිළධාරි/සෙසුනිළ දිවා භෝජන සංග්‍රහයේදී අණදෙන නිළධාරි විසින් සියළු නිළයන් අමතමින්.



සෝදිසි මෙහෙයුම් වලදි සොයාගන්නා ලද අවි පතොරම් හා වෙඩි ද්‍රව්‍ය වලින් කොටසක්.









# 8 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## සංඥා මූලික වැඩපල



ලුතිතන් කර්නල් එම්පිජේවස්කේ පටබැඳිගේ නව සේනාවිධායක ලෙස 2009.02.26 දින වැඩ භාරගැනිම.



සංඥා මූලික වැඩපල 09 වන සංවත්සරය වෙනුවෙන් සේනාවිධායක වෙත පිරිනමන ලද සම්මාන මුරය.



සංඥා මූලික වැඩපල 09 වන සංවත්සරය වෙනුවෙන් සේනවිධායක වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය.

## සංඥා මූලික වැඩපල




සංඥා මූලික වැඩපල 09 වන සංවත්සරය නිමිතිකොටගෙන අවිස්සාවේල්ල බුද්ධිමය ආබාධිත නිවස්නයේ නේවාසිකයින් හට දිවා ආහාරය සහ ඔවුන් වෙත තෑගි ප්‍රධානය කිරීම.



සංඥා මූලික වැඩපල 09 වන සංවත්සරය නිමිතිකොට ගෙන යුහ බෝධිරාජාරාමයේදී සියළු නිළයින් එක්ව ඒකකයට සෙත්පතා පැවැත්වූ



සංඥා මූලික වැඩපල 09 වන සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ සියළු නිල දිවා භෝජන සංග්‍රහය.





ක්‍රියාන්විතයන්ට සමගාමීව CDMA සහ ඩයලොග් සම්බන්ධතා ලබාදීමට කටයුතු කල ශ්‍රීලංසංඛ කාර්මික සෙනින් එම කාර්යයේ නිරතවෙමින්.






# 19 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## තොරතුරු තාක්‍ෂණ ඒකකය

මෙරට තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රය මෙන්ම එහිදී භාවිතා කරන වචනද දිනෙන් දින යාවත්කාලීන වූ අතර විද්‍යුත් දත්ත යන වචනය මෙම භාගය වන විට භාවිතයෙන් ඉවත්ව තොරතුරු තාක්‍ෂණ නමින් ඉදිරියට පැමිණ ඇත. මේ අනුව මෙතෙක් භාවිතා කළ විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය යන නාමය තොරතුරු තාක්‍ෂණ ඒකකය යනුවෙන් 2003 ඔක්තෝම්බර් මස 14 දින වෙනස් කරන ලද අතර අප ඒකකයේ පාලනය 2005 නොවැම්බර් මස 30 දින සිට සභාපති පරිගණක කමිටුවෙන් ඉවත් කර අධ්‍යක්‍ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික යටතට පත් කරන ලදී.

යුද හමුදාවේ ස්වාධීන ඒකකයක් වශයෙන් නවීන තාක්‍ෂණයෙන් පරිපූර්ණ පසුබිමක් ගොඩනගා ගැනීම සඳහා අණදෙන නිළධාරීන් 08 දෙනෙකුගේ පාලනයන් යටතේ ගෙවී ගියද එළඹෙන ලද බාධක ජයගනිමින් හෙට දිනයේ සැබෑම ලෙසින් තොරතුරු තාක්‍ෂණ ක්‍රියාවලියේ පරිපූර්න ජීවනාලිය වීමට සැබෑ වෙහෙසක් ගත් වත්මන් අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ඩීඑල්ඩබ්ලිව්ස්යූ ද සිල්වා විසින් මේ වන විට අණදෙන නිළධාරී තනතුරෙහි නියැලී සිටී.

ස්වයං දත්ත සැකසුම් සේවාව යුහමු ගොඩනැගිල්ලේ 1988 ජුනි මස 01 දින සිට මාණ්ඩලික නිළධාරියෙකු යටතට ස්ථාපිත වූ අතර ප්‍රථම තොරතුරු තාක්‍ෂණ පද්ධති විශ්ලේෂක වශයෙන් ලුතිතන් කර්නල් ඒඑස් වරකාගොඩ - ශ්‍රීලංසංබ විය. 1980 දශකයේ අගභාගය වන විට පරිගණක යන්ත්‍ර 18 ක් පමණ යුද හමුදාවේ ප්‍රධාන අම/මූලස්ථාන සමහරෙක ස්ථාපනය කොට තිබූ අතර එම යන්ත්‍ර ක්‍රියාකරවීම සඳහා තොරතුරු තාක්‍ෂණ ඒකකයට ඉඳුරාම බඳවා ගන්නා ලද සහ වෙනත් ඒකකයන් වෙතින් යාකරන ලද පරිගණක ක්‍රියාකරුවන්/ක්‍රියාකාරිනියන් ගේ දායකත්වය නොමසුරුව ලද අතර මේ වන විට අන්තර් ඒකක මාරුවීම මත තොරතුරු තාක්‍ෂණ ඒකක නිත්‍ය බලසේනාවට ශ්‍රීලයුකාබ ඒකකයට අයත් සෙනින් 14 දෙනෙකු, ආබාධිත සෙනින් 27 දෙනෙකු සහ 2 (සෙවි) ශ්‍රීලයුපොදුසේබ ඒකකයට අයත් සෙනින් 33 දෙනෙකු ගේ පරිගණක දැනුම යුධ හමුදාවේ සියළුම ස්ථානයන්හි ප්‍රචලිතව ඇති බවට වෙනත් කිසිදු සාක්ෂියක් නොළමනා වේ. තවද 2009 අගෝස්තු මස වන විට තොරතුරු තාක්‍ෂණ ඒකකයට ආධුනික සෙනින් වශයෙන් ලිපිකරුවන් 10 දෙනෙකු ගබඩාකරු වෘත්තීය සඳහා සෙනින් 02 දෙනෙකු සහ රියදුරන් වශයෙන් සෙනින් 09 දෙනෙකු ඉඳුරාම බඳවා ගත් අතර මේ වන විට අප ඒකකයේ නිත්‍ය බල සංඛ්‍යාව 492 වශයෙන් වැඩි වී ඇති බව අප පෙන්වා දෙනු ලබන්නේ මහත් වූ කැපකිරීම් මැත සිදුවූ බැවිනි.

තවද අප ඒකකයේ අනුමත සංස්ථාවට අනුව ස්වේච්ඡා බළඝණ 02 ක් ස්ථාපිත කිරීමට නියමිත අතර, ඉන් එක් බළඝණයක් සඳහා ඉඳුරාම පරිගණක රාජකාරි සඳහා සෙව්ච්ඡා බළසේනාවට බඳවා ගන්නා ලද සෙනින් 32 සහ ආබාධිත තත්වයේ පසුවන සෙනින් 11 දෙනෙකු සමගින් සහ ඉඳුරාම තොතාවී ස්වේච්ඡා බළඝණයට ආධුනිකයින් ලෙසින් බඳවා ගන්නා ලද සෙනින් 51 දෙනෙකු සමගින් එක් ස්වේච්ඡා බළඝණයක සෙනින්ගේ සංඛ්‍යාවද මේ වන විට 94 දක්වා වැඩි වී ඇති බැව් පෙන්වා දීමට කැමැත්තෙමු.

1990 වසරේ අග භාගය වන විට පරිගණක ජාලගත කිරීම සහ අන්තර් ජාලය කරලියට පැමිණීමත් සමඟ තොරතුරු තාක්‍ෂණ ක්‍ෂේත්‍රය ඉතා සීඝ්‍ර දියුණුවක් ලැබූ අතර මෙම බලපෑම මත යුද හමුදාවේ ප්‍රධාන ආයතන ගණනාවක් අන්තර්ජාල පහසුකම් සහිතව ජාලගත කිරීම් සිදුකරන ලදී. සමස්ථ හමුදාවන්ගේ ජයග්‍රහණය හේතුකොට එල්ටීටීඊ ත්‍රස්තවාදීන් අන්තර්ජාලය ඔස්සේ සිදුකරගෙන යන ලද ශ්‍රී ලංකා රජයටත් මෙරට ජනතාවටත් විශේෂයෙන් ත්‍රිවිධ හමුදාවටත් අපකීර්තියන් ගෙන එමින් ප්‍රචාරය කරන ලද අසත්‍ය ප්‍රචාර වලට නිවැරදි මග යමින් ප්‍රතික්‍රියා දැක්වීමට හැකිවීම තොරතුරු තාක්‍ෂණය අතින් අප ලද මහගු ජයග්‍රහණයකි. මානුෂීය මෙහෙයුම් කාලයේදී මෙරට තුළද ලෝකයේ අනිකුත් රටවල් හී ජාතිකයින් ද මහත් වූ උනන්දුවකින් අන්තර්ජාලය ඔස්සේ නරඹන ලද www.army.lk නමින් දියත් කරන ලද යුද හමුදා වෙබ් අඩවිය එක් දිනක් තුළ ශ්‍රී ලංකාවේ මිලියන 15 පමණ ජනතාවක් නරඹා තිබූ වෙබ් අඩවිය ද විය. එය වැඩිදෙනාගේ ප්‍රසාදය ලබාගැනීමද අප ඒකකය වෙතින් දියත්කරන ලද වැඩසටහන්හී ප්‍රථපලයන් වේ. යුද හමුදාවට ආවේණික වූ දත්තයන් පිළිබඳව යුද හමුදාවේ සියළුම අයවළුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද "දැනුම් වීඹ" ako.army.lk යුද හමුදා සාමාජිකයින් අතර වඩාත් ප්‍රචලිතය.

වර්තමානයෙහි යුද හමුදාධිපතිතුමන්ගේ උපදෙස් මත සමස්ථ යුද හමුදාව නියෝජනය වන පරිදි පවත්වනු ලබන ප්‍රදර්ශණයන් සඳහා තොරතුරු තාක්‍ෂණ ප්‍රදර්ශණ කුටි ඉදිරිපත් කරමින් ශ්‍රී ලංකාව පුරා තොරතුරු තාක්‍ෂණ දැනුම ප්‍රචලිත කිරීමට අප ඒකකය සමත් වී ඇත. ශ්‍රී ලංකා යුද හමුදාධිපති තුමන් විසින් අප ඒකකය වෙතින් මෙම වසරේදී පවත්වනු ලැබූ කතරගම ඇසළ උත්සවය සඳහා සහභාගී වන බැතිමතුන්ගේ දත්ත පරිගණකගත කිරීම සඳහා වන වැඩසටහන පවත්වන ලෙස දැනුම් දෙන ලද අතර එම වැඩසටහන මෙවර අප ඒකකයේ තොරතුරු තාක්‍ෂණ නිළධාරීන්/පරිගණක ක්‍රියාකරුවන්/පරිගණක කාර්මික ශිල්පීන්ගේ සහභාගීත්වයෙන් සාර්ථක මට්ටමින් පැවැත්වීමට අප ඒකකය සමත් වූ බැව් ඉතා නිහතමානී ආඩම්බරයකින් යුතුව දන්වා සිටීමට කැමැත්තෙමු. මීට පෙර මෙම උත්සවය සඳහා පැමිණෙන බැතිමතුන්ගේ දත්ත පරිගණක ගතකිරීම සඳහා රුපියල් මිලියන 3.4 පමණ මුලදක් රජය මගින් වැය කර ඇති අතර මෙවර එම කටයුත්ත මෙම ඒකකය වෙතින් සිදුකිරීමෙන් ඒ සඳහා වැය මූ මුදල රුපියල් තුන් ලක්‍ෂයක පමණ මුදලක් බැව් ඉතා ආඩම්බරයකින් යුතුව දැන්වීමට කැමැත්තෙමු. තවද රණවිරු තොරතුරු තාක්‍ෂණ ආයතනය, වාද්දුව නිවාඩු නිකේතනය, කුකුළේගඟ නිවාඩු නිකේතනයන්හී දත්ත ඇතුලත් කිරීමේ ව්‍යාපෘතින් රැසක් මෙම ඒකකයේ තොරතුරු තාක්‍ෂණ නිළධාරීන්ගේ දායකත්වයෙන් ඉටු කිරීමට සමත් වී ඇති බැව් දන්වා සිටිමු.

සමස්ත යුද හමුදාව තුළ පරිගණක තාක්‍ෂණයෙන් සමත් අයවළුන් පෝෂණය කිරීම සඳහා තොරතුරු තාක්‍ෂණ මූලික පුහුණු පාඨමාලාවන් සඳහා වසරකදී නිළධාරීන් 30 දෙනෙකු සහ සෙනින් 150 දෙනෙකු සඳහා අවකාශ ලබාදී ඇති අතර ඒ සඳහා ආබාධිත සෙනින් හටද අවස්ථාව ලබාදී ඇත. එමගින් ඒකකයන් තුළ යුද හමුදාවේ පරිගණක භාවිතය මෙන්ම රාජකාරි කරනු ලබන නිළධාරී/සෙසුනිළයින්ගේද පරිගණක දැනුම වත්මන් තාක්‍ෂණය වෙත යොමුවීමද ප්‍රචලිතව ඇති බැව් පෙන්වා දීමට කැමැත්තෙමි.

මෙතෙක් පැමිණි මාවතෙහි නිළධාරීන් සහ සෙසු නිළයින්ගේ කැපවීම සහ කාර්‍යක්‍ෂමතාවය මතින් මේ වන විට තොරතුරු තාක්‍ෂණ ඒකක බලසංඛ්‍යාවෙහි නිළධාරීන් 40 දක්වා සහ සෙසුනිළයින් 492 ක්ද ස්වේච්ඡා බලසේනාවෙහි සෙනින් 94 දක්වා වැඩි කර ගෙන ඇති අතර වෙනත් ඒකකයන් වෙතින් අන්තර් ඒකක මත පැමිණි ආබාධිත සෙනින්ගේ (සෙනින් 27) දායක්තවයද අප ඒකකය ඉදිරියට ගෙන යාම සඳහා නොමසුරු දායකත්වයක් ලබාදී ඇත. විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය යනුයෙන් පැවත එන ලද කාලවකවානු වේ සිට පරිගණක ක්‍රියාකාර් රාජකාරියෙහි නියැලෙමින් සිටී.

# තොරතුරු තාක්ෂණ ඒකකය



2009.09.23 දින ඒකක සංවත්සර දිනය වෙනුවෙන් අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ඩීඑල්ඩබ්ලිව්එස්යූ ද සිල්වා වෙත පිරිනමනු ලැබූ සම්මාන මුරය.





ඒකක සංවත්සර දිනය වෙනුවෙන් අණදෙන නිළධාරි වෙත පිරිනමන ලද සම්මාන පෙළපාලිය.





ඒකක සංවත්සරය නිමිති කොට ගෙන ඒකකයේ සියළු නිළයින් එක්ව ඒකකයට සෙත් පතා 2009.09.22 දින පැවැත්වූ පිංකම.






# 18 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

## සංඥා පාසල

### සංඥා පාසල නව මුහුණුවරකින්

**ඉතිහාසයෙන් බිඳක්**

1 වන සංඥා රෙජිමේන්තුව යටතේ 1964 පනාගොඩ ස්ථාපිතව පැවති සංඥා අභ්‍යාස බළඝණය පුහුණු පාසලක් වශයෙන් 1991 ජූලි මස 15 දින ඓතිහාසික සෙන්කඩගල පුරවරයේ ධර්මරාජ විදුහලට යාබදව පිහිටි කඳු මුදුනේ ස්ථානගත කරන ලදි. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ව්‍යාප්ත වීමත් සමගම 1995 වර්ෂයේ සිට මෙම පුහුණු පාසල යුධ හමුදා පුහුණු පාසලක් වශයෙන් උසස් කිරීමෙන් පසු සේනාවිධායක තනතුර සඳහා ලුතිනන් කර්නල් වරයෙකු යටතේ අණාදීම් සිදු කරන ලදි. එතැන් පටන් මේ දක්වා විවිධ පැතිකඩ ඔස්සේ ගමන් කරමින් ශ්‍රී ලංකා සංඥා බළකායට මහත් කීර්තියක් ගෙන දෙන ලදි. එමෙන්ම 2005.05.11 දින සිට මෙම පුහුණු පාසල වෙත පුහුණු අධ්‍යක්ෂක මණ්ඩලය වෙතින් "තාක්ෂණයෙන් පිරිපුන්" යන උද්ඝෘත පාඨය ලබාදෙන ලද අතර, ඒ අනුව ක්‍රියා කරමින් මේ වන විට පුහුණුවීම් හා අනෙකුත් රාජකාරීන් තුළින් මහත් සේවාවක් ඉටුකර ඇත.

මේ අනුව 18 වියට පා තැබූ මෙම පුහුණු පාසැල වත්මන් සේනාවිධායක තනතුරෙහි රාජකාරි කරනු ලබන ලුතිනන් කර්නල් එන්පී අකුරන්තිලක යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ අණාදීම් යටතේ පසුගිය කාලසීමාවේ ක්‍රියාන්විත තත්වය හේතුකොටගෙන පුණ්‍ය කටයුතුවලට මුල්තැන දෙමින් සංවත්සර උත්සවය චාම් අයුරින් සමරන ලදි. මෙහිදි ප්‍රථමයෙන් තපෝවනය භාවනා මධ්‍යස්ථානය වෙත දානය පිරිනැමීමෙන් අනතුරුව පසුදින සේනාවිධායක හට සම්මාන මුරයක් සහ සම්මාන පෙළපාලියක් පිරිනැමීමෙන් පසු සියළුම නිළයින් සඳහා දිවා භෝජන සංග්‍රහයක් පවත්වන ලදි. එදින රාත්‍රියේ සිට පසුදින දක්වා සර්ව රාත්‍රික පිරිත් සජ්ඣායනාවක් පැවැත්වීමෙන් අනතුරුව මහා සංඝයා වෙත හීල් දානය පිරිනැමීමෙන් පසු සංවත්සර කටයුතු ඉතා චාම් අන්දමින් අවසන් කරන ලදී.

**පුහුණු වීම්**

ශ්‍රී ලංකා යුධ හමුදාව ව්‍යාප්ත වීමත් සමඟ "තාක්ෂණයෙන් පිරිපුන්" යන තේමාව යටතේ සංඥා පාසල පැහැදිලි දර්ශණයක් (Vision) හා පරමාර්ථයකින්ද (Mission) යුතුව හා එම පරමාර්ථයට ලගා වීම සඳහා පැහැදිලි අභිප්‍රායන් (Objectives) සමූහයක් තුලින් ඉහත සංකල්පයට අනුව දැනට සිදු කරනු ලබන පාඨමාලාවන්ට අමතරව 2009 විෂය නිර්දේශයට ඇතුළත් නොවූ පහත සඳහන් විශේෂ පාඨමාලාවන් පුහුණු අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත සංඥා බළසේනා මූලස්ථානයේ පූර්ණ අධීක්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබයි.

අ. විශේෂ තරුණ සංඥා නිළධාරි පාඨමාලාව (සියළු ඒකක)
ආ. සංඥා ජ්‍යෙකොනොනි නායකත්ව හා කළමණාකරණ පාඨමාලාව (සංඥා ඒකක).
ඇ. පරිඝණක පාඨමාලාව (සියළු ඒකක)

මෙම තරුණ සංඥා නිළධාරි පාඨමාලාව විශේෂයෙන්ම සෙසු නිළ අධිකාරියට පත් සියළු ඒකක නිළධාරීන් සඳහා පවත්වන අතර, මෙහිදි මෙම නිළධාරීන් හට හමුදා විෂය දැනුමට අමතරව බාහිර ක්‍රියාකාරකම් පිළිබඳව විශේෂ දැනුමක්ද මෙම පාඨමාලාව තුළින් ලබාදීමට ක්‍රියාකර ඇත. ඒ අනුව මෙම නිළධාරීන් සඳහා බාහිර ක්‍රියාකාරකම් වශයෙන් පහත සඳහන් විෂයන් හඳුන්වාදි ඇත.



**විශේෂ තරුණ නිළධාරි පාඨමාලාව (සියළු ඒකක) "Knuckles View" පිටත අභ්‍යාසයෙහි අවස්ථාවක්**

අ. මහනුවර ත්‍රිත්ව විදුහල සමඟ සම්බන්ධතාවයෙන් යුතුව පාඨමාලා කාලසීමාව තුළ සති අන්ත පිහිණුම් පුහුණු පාඨමාලාවක් ලබාදීම.
ආ. "අපි වවමු රට නඟමු" යන සංකල්පය තේමා කරගනිමින් ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා හඳබිම අධිකාරිය සමඟ ඒකාබද්ධව ගෙවතු වගාව සම්බන්ධව ස්වයං වගා කිරීමේ ක්‍රම වේදයන් පිළිබඳව දින 02 ක වැඩ මුළුවක් සඳහා සහභාගි කරවීම හා "අපි වවමු රට නගමු" දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුමට රාජ්‍ය අංශයේ

# සංඥා පාසල

දායකත්වය ලබාදීම සඳහා ආදර්ශ ගෙවත්තක් පවත්වා ගෙන යනු ලැබූ අතර, ඒ සඳහා මහනුවර දිස්ත්‍රික් ලේඛම් කාර්යාලය මඟින් පවත්වනු ලැබූ ගෙවතු වගා තරඟයෙන් රාජ්‍ය අංශයේ දෙවන ස්ථානය මෙම පුහුණු පාසල වෙත හිමිවී ඇති බවද සතුටින් දන්වා සිටිමි.

ඇ. කඳු තරණය

ඈ. ව්‍යාපෘති වාර්තා (Project Proposals) ලිවීම පිළිබඳ දැනුමක් ලබාදීම.

ඉහත පාඨමාලාවට අමතරව මෙම වසරේ ආරම්භ කර ඇති සංඥා ජ්‍යෙෂ්ඨ කොනොනි පාඨමාලාව සංඥා ඒකක ජ්‍යෙෂ්ඨ කොනොනින් සඳහා පමණක් පවත්වන අතර, සංඥා වෘත්තිය දැනුමට අමතරව මෙම පාඨමාලාව තුළින් නායකත්වය හා කළමණාකරණය පිළිබදව හා වෙනත් බාහිර විෂයන් පිලිබඳවද පුළුල් දැනුමක් ලබාදීමට කටයුතු කර ඇත. මෙම පාඨමාලාව මාස 01 ක කාලසීමාවක් පවත්වන අතර, මෙම කාලසීමාව තුළ පරිඝණක දැනුමද ඔවුන් වෙත ලබාදීමට කටයුතු කර ඇත. එමෙන්ම විශේෂ ව්‍යපෘති යටතේ පාඨමාලා කාලය තුල ඔවුන් විසින් විද්‍යුත් පරිපථයක් සෑදීමද සිදුකරනු ලබන අතර පිටත අභ්‍යාසයන් වශයෙන් සංඥා සම්බන්ධතා පිහිටවීම පිළිබඳව ක්‍ෂෙත්‍ර අභ්‍යාසයන් කිහිපයකටද සහභාගී වේ. මෙහි ඇති තවත් විශේෂත්වයක් වනුයේ එම සිසුන් සඳහා දේශණ පැවැත්විම "පන්ති කාමර සාකච්ජා" (Class Room Discussion) ආකාරයට සිදුකිරීමයි. ඒ අනුව ඔවුන්ගේ ක්‍රියාකාරකම් හා සහභාගිත්වය අනුව ඔවුන් පහසුවෙන් ඇගයීමට ලක්කිරීමට හැකිවනු ඇත.

තවද, මෙම පුහුණු පාසල වෙතින් පවත්වනු ලබන කෝප්‍රල් සිට සැරයන් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාව සඳහාද මෙයට පෙර පැවති විෂය නිර්දේශය සංශෝධනය කර පාබල විෂයට අමතරව සංඥා සම්බන්ධතා පිහිටුවීම, නායකත්වය හා බාහිර දැනුම යන විෂයන්ද ඇතුළත්ව නව මුහුණුවරකින් විෂය නිර්දේශය සකස් කර ඇත. පහත සඳහන් පිටත අභ්‍යාස ඒ සඳහා සිදු කරනු ලබයි.

අ. එච්එෆ් ගුවන් විදුලි අභ්‍යාසය.

ආ. වීඑච්එෆ් හයිබෑන්ඩ් සහ ලෝබෑන්ඩ් සම්බන්ධතාවයන් පවත්වා ගැනීම.

ඇ. ක්‍ෂෙත්‍ර ක්‍රියාන්විත ගුවන් විදුලි මැදිරි ස්ථාපනය කිරීම.

ඈ. ක්ෂේත්‍ර දුරකථන පද්ධති ස්ථාපනය කිරීම.

ඉ. සංඥා සම්බන්ධතා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.

පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වන අභ්‍යාසය තුළ යුධ හමුදා සංග්‍රාමික විෂය දැනුමට අමතරව ක්‍ෂෙත්‍ර සංඥා සම්බන්ධතාවයන් පවත්වාගැනීම පිළිබදව ප්‍රායෝගික දැනුම (ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියා කරවීම, සංඥා ආරක්‍ෂාව, කථා පිළිවෙත, විද්‍යුත් සංග්‍රාමික කටයුතු, දුරකථන මාර්ග නඩත්තුව, සංඥා මධ්‍යස්ථාන ක්‍රියා පිළිවෙත) මෙම වන අභ්‍යාස තුළින් ලබාදීමට ක්‍රියාකර ඇත.



**වෙනත් ඒකක සංඥා පාඨමාලා සිසුන් සඳහා ක්‍ෂෙත්‍ර සංඥා මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ප්‍රායෝගික දැනුම ලබාදීම.**

මෙම පාඨමාලාවට අමතරව සංඥා ඒකක සෙබළුන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන වෘත්තීය පරීක්‍ෂණ 1 වන ශ්‍රේණිය සදහාද සෙනීන් අයත් වෘත්තීයට අදාල විෂය දැනුම පමණක් නොව අනෙකුත් වෘත්තීන් පිළිබඳවද පොදුවේ පුළුල් දැනුමක් ලබාදීමට ක්‍රියා කර ඇත. එමෙන්ම මෙම පාඨමාලා සිසුන් හට සංඥා මැදිරි හා සංඥා මධ්‍යස්ථාන ස්ථාපිත කර සංඥා සම්බන්ධතා පවත්වා ගැනිම පිළිබදව පුළුල් ප්‍රායෝගික දැනුමක්ද ලබාදීමට කටයුතු කර ඇති අතර, තාක්‍ෂණික දැනුම වැඩිදියුණු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් පරිපථ සකස් කිරීමද පාඨමාලා කාලය තුල ඔවුන් විසින් සිදුකල යුතුවේ.

මෙම පුහුණු පාසල මගින් සිදු කරනු ලබන පාඨමාලාවන්ට අමතරව සෑම මසකම 2 වරක් ශිෂ්‍යයින් හා නිත්‍ය කාර්ය මණ්ඩලයෙහි ඒකකාරී බව හා මානසික ආතතිය ලිහිල් කර ගැනීම සඳහා මෙන්ම විවිධත්වයක් හා අමතර දැනුමක් ලබාදීමේ අරමුණින් බදාදා දින පුහුණු වීම් දිනයක් ලෙස නම් කර ඇත. ඒ සදහා පාඨමාලා සිසුන්ට අමතරව නිත්‍ය කාර්ය මණ්ඩලයේ සියලුම නිළධාරින් හා සෙසු නිළයින්ගේ සහභාගිත්වයෙන් මෙම පුහුණු වීම් කටයුතු සිදු කරනු ලබයි. පුහුණු වීම් දිනට පෙර දින සියලුම අයවලුන් තුළවාසිව සිටින අතර, එදින රාත්‍රියේ අලුතින් ඉදිකරන ලද එළිමහන් රංග පීඨයේදි චිත්‍රපට ප්‍රදර්ශණයක්ද සිදු කරනු ලබයි. පුහුණුවීම් දිනය තුළ ආරාධිත දේශකයෙකුගේ සහය ලබාගෙන ඉතා වැදගත් දේශණයන්ද මෙම පුහුණු පාසලේ ප්‍රධාන දේශණ ශාලාවේදි පැවැත්වීමටද කටයුතු කර ඇත.

# සංඥා පාසල



කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාවේ සෙබළුන් විසින් ක්‍ෂේත්‍ර දුරකථන සංඥා සම්බන්ධතාවයන් ස්ථාපනය කිරීම.



2009.11.11 දින බළකාධිපති විසින් සංඥා පාසලෙහි නිළධාරී නිවස්නය ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

## වෙනත් පහසුකම්

මෙම පුහුණු පාසලේ විශාල අඩුපාඩුවක්ව පැවැති ජල පහසුකම් ප්‍රශ්ණය විසදා ගැනීම සඳහා මහනුවර මහ නගර සභාව සමග එක්ව කඳවුර තුළ මිලියන 6.97 ක වියදමකින් යුත් ඝනමීටර් 80 ක ජල ධාරිතාවයකින් යුත් ජල ටැංකියක් හා අධි පීඩන ජල නල පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇති අතර එහි වැඩ දැනටමත් ආරම්භ කර ඇත. එමෙන්ම, මෙම පුහුණු පාසලේ අඩුපාඩුවක්ව පැවැති නිළධාරි නිවස්නය ඉදිකිරීම සදහා මිලියන 6.5 ක මුදල් ප්‍රතිපාදන ඉංජිනේරු සේවා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වෙන් කර ඇති අතර, 2009.11.11 දින සංඥා බළකාධිපති විසින් මුල්ගල තැබීමෙන් පසු එහි වැඩ ආරම්භ කර ඇත. දැනට සංඥා බළකායේ නිළධාරීන් වෙනුවෙන් මෙම පුහුණු පාසලේ ස්ථාපිත කර ඇති නිවාඩු නිකේතනයෙහි පහසුකම් වැඩිදියුණු කරමින් නවීකරණය කිරීමේ කටයුතුද ආරම්භ කර ඇත.

එමෙන්ම මෙම පුහුණු පාසලේ පුහුණුව ලබන නිළධාරි/සෙබළුන්ගේ හා නිත්‍ය කාර්ය මණ්ඩලයේ සියළුම නිළධාරි/සෙබළුන්හට නිරවුල් හා සැහැල්ලු මනසකින් යුතුව පුහුණුවීම් හා රාජකාරි කටයුතු ඉටුකිරීම සඳහා සුදුසු පරිසරයක්ද නිර්මාණය කර ඇති බව සතුටින් සඳහන් කරන්නෙමු.

මේජර් එස්ජේකේඩී ජයවර්ධන පීඑස්සී
ප්‍රධාන උපදේශක - සංඥා පාසැල



අළුතින් ඉදිකරන ලද එළිමහන් රංග පීඨය.

# සංඥා පාසල



2009.09.07 සංඥා බළකාධිපති බ්‍රිගේඩියර් ටිපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී විසින් සිදුකරන ලද කඳවුරු සංචාරයේදී පිරිනමන ලද සම්මාන මුරය.



2009.09.07 සංඥා බළකාධිපති විසින් දුරකථන සහ රැහැන් විද්‍යාගාරය නිරීක්‍ෂණය කිරීම.



2009.09.07 සංඥා බළකාධිපති විසින් පරීක්‍ෂණක විද්‍යාගාරය නිරීක්‍ෂණය කිරීම.



2009.09.07 සංඥා බළකාධිපති විසින් කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාවේ එච්එෆ් ගුවන්විදුලි අභ්‍යාසය හා සංඥා මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමේ අභ්‍යාසය නිරීක්‍ෂණය කිරීම.



2009.09.11 දින ප්‍රධාන සංඥා නිළධාරී බ්‍රිගේඩියර් එස්ඒපීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී ගේ කඳවුරු සංචාරයේදී දුරකථන සහ රැහැන් විද්‍යාගාරය නිරීක්‍ෂණය කිරීම.



2009.09.11 දින ප්‍රධාන සංඥා නිළධාරී විසින් කෝප්‍රල් සිට සැරයන් දක්වා නිල උසස් කිරීමේ පාඨමාලාවේ වන අභ්‍යාසය නිරීක්‍ෂණය කිරීම.



2009.09.03 දින ප්‍රදේශ ආඥාපති බ්‍රිගේඩියර් එස්ආර් මානවඩුගේ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී අයිජී ගේ කඳවුරු සංචාරයේදී දුරකථන සහ රැහැන් විද්‍යාගාරය නිරීක්‍ෂණය කරමින්.



2009.09.19 දින පැවති ආපුපා 36 හි විසිර යාමේ පෙළපාලියෙහි ප්‍රධාන අමුත්තා ලෙස සහභාගිවූ බ්‍රිගේඩියර් ආර්ඒඑස් රණසිංහ යූඑස්පී වෙත පිරිනමන ලද සම්මාන මුරය.






# 2 වන (සෙව්) රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්), ශ්‍රී ලංකා සංඥා බළසේනාව යටතේ 1 වන බළසෘණය ශ්‍රී ලංකා සංඥා බළකාය ලෙස 1980 අගෝස්තු මස 07 දින හවනි 21/80 නගාසිටුවීමේ උපදෙස් මගින් නිළධාරීන් 8 දෙනෙකු හා සෙසුනිළයින් 200 දෙනෙකුගෙන් යුතුව, බළසෘණාධිපති වරයෙකුගේ අණාදීම යටතේ බළසෘණයක් වශයෙන් උපත ලැබීය.

මෙම බළසෘණය 1 ශ්‍රීලංසංබ අණාදෙන නිළධාරීගේ පාලනය යටතේ ක්‍රියාත්මක වූ අතර, 1989 ජනවාරි මස 26 දින හවනි 05/89 නගාසිටුවීමේ උපදෙස් මත 1980 අප්‍රේල් මස 25 දින සිට බලපැවැත්වෙන සේ ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වීමට අනුමැතිය ලද අතර, 1999 අප්‍රේල් මස 15 දින 1 ශ්‍රීලංසංබ අණ හා පාලනයෙන් මිදී ස්වාධීන ඒකකයක් ලෙස රෙපිමේන්තු මධ්‍යස්ථානය යටතට පත්විය.

2006 අප්‍රේල් මස 28 දින හවනි 15/2006 නගාසිටුවීමේ උපදෙස් මත නිළධාරීන් 21 දෙනෙකුගෙන් සහ සෙසුනිළයින් 464 දෙනෙකුගෙන් යුතු නව සංස්ථාව අනුමත වීමෙන් පසුව 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) නිදහස් ඒකකයක් ලෙස පෙරට යාමේ අත්තිවාරම දමන ලදී.

ඒ වන විටද නිත්‍ය සහෝදර ඒකක ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විසින් මෙම ඒකක අණාදීම සිදු කරන ලද අතර, යුද හමුදා මුලස්ථානයේ අනුමැතිය මත 2 ශ්‍රීලංසංබ(සෙව්) ප්‍රථම අණාදෙන නිළධාරී වීමේ භාග්‍යය උදා වූයේ ලුතිතන් කර්නල් ආර්ඩී කරුණාරත්න 1 ශ්‍රීලංසංබ (එවකට මේජර්) වෙතය ඉතා කෙටි කාලයක ඇවෑමෙන් ලුතිතන් කර්නල් එම්පීඑච්ච්එස්කේ පටබැඳිගේ 4 ශ්‍රීලංසංබ (එවකට මේජර්) විසින් අණාදෙන නිළධාරී පදවිය භාරගන්නා ලදී.

එහෙත් මාසයක් වැනි සුළු කාලයකදී ඔහුට විදේශ පාඨමාලාවක් හැදෑරීම සදහා දිවයිනෙන් බැහැරව යාමට සිදුවීමෙන් අනතුරුව 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඉකිහාසයේ ප්‍රථම ස්වෙච්ඡා අණාදෙන නිළධාරීවීමේ භාග්‍යය හිමිකර ගනු ලැබුයේ මේජර් එල්පේසී ද පීරිස් - 2 ශ්‍රීලංසංබ(සෙව්) විසිනි.

ස්ථිර පදනමකින් තොරව ස්ථිර අධිෂ්ඨානයක් නොමැතිව අපහැදිලි අනාගතයක සිහින දකිමින්, ජ්‍යෙෂ්ඨයන්ගෙන් අනාගත සිහින බිඳ වැටෙනු දකිමින් කල් ගෙවූ පරපුරක බලාපොරොත්තු සහිත හෙට දිනයක අරුනළු තුලින් නව ජීවිතයක උදාව 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඒකකයේ සියළු දෙනා හට එතැන් සිට දැකගත හැකි විය.

වත්මන් අණාදෙන නිළධාරීගේ නිවැරදි මගපෙන්වීමට අනුව නිළධාරී මඩුල්ල හා සෙසුනිළයින් සහෝදරත්වයෙන් එකමුතුව එකාවන්ව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද සෙසු නිත්‍ය සහෝදර ඒකකයක් අතර, අද්විතීයව වැජඹෙන්නට 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඒකකයට හැකියාව ලැබී ඇත.

ඒ අනුව වත්මන් ඒකක සංයුතිය නිළධාරීන් 13 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් 412 කින් සමන්විතව සාර්ථක අනාගතයක් වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතී.

2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඉතිහාසයේ ප්‍රථම වරට අද සෙසුනිළයින්ගේ මගපෙන්වන්නා ඒකකය තුලින්ම පැමිණි රෙපිමේන්තු සැරයන් මේජර් වරයෙකි. රෙපිමේන්තු උපකරණ පාලක සැරයන් මේජර් වරයාද එවැන්නෙකි. මෙම සෙසු අයට ඒකක ඉදිරි අනාගතයේ සෞභාග්‍ය පෙන්වන පෙර නිමිතිය.

උප අණාදෙන නිළධාරී සහ විධායක අධිකාරී 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) මාතාවගේම දරුවෝය. අද 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඒකකය අපේය. හෙටද අපගේමය. ඒ අප ඒකක මාතාවන්ගේ ස්වාධිපත්‍යයේ කාහල නාදයයි.

2009 අප්‍රේල් මස 25 වන දින ඒකක මාතාවගේ විසිවන ජන්ම දිනය නිදහස්ව ස්වෛරී උත්කර්ෂවත් අන්දමින් සමරමින් එහි ප්‍රධාන අංගය වන සම්මාන පෙළපාලියේ උත්තමාචාරය අණාදෙන නිළධාරී වෙත පිරිනැමුවේ ඉමහත් භක්තියෙකිනි. එය අපට මහත් ගෞරවයකි. 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඉතිහාසයේ නොමැකෙන සිහිවටනයකි.

ඉතාමත් දීර්ඝ කාල පරාසයක් සංඥා රෙපිමේන්තු මධ්‍යස්ථාන කදවුරු භූමිය තුල ස්ථාපනය කර තිබූ මෙම ඒකකය ප්‍රථම වතාවට 2009.05.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකකයක් වශයෙන් වෙනම ස්වාධීනව රාජකාරි කිරීම සදහා ආසේමු(නැ) වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගතව ඒකකය නගා සිටුවීමේ කටයුතු මේ වන විට ඉතාමත් කැපවීමකින් හා උත්සාහයකින් යුතුව ඉටු කරනු ලබන බව සිහිපත් කරන්නේ ඉතාමත් අභිමානයෙන් හා නිහතමානිත්වයෙන් යුතුවය.

එසේම අපට ස්වාධීනව දෙපයින් නැගී සිටින්නට එදත් අදත් කවදත් අත හිත දුන් සංඥා බළකාධිපති වරුන්, බළසේනාධිපතිවරුන්, මධ්‍යස්ථාන සේනාවිධායක වරුන් ඇතුළු සියලු සංඥා ඒකකවල ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ නිළධාරීන් මෙන්ම ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ සෙසුනිළයින් ඉමහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.

## 2 වන (සෙව්) ශ්‍රී ලංකා සංඥා බලකාය



ඒකක දිනය නිමිත්තෙන් 2009.04.25 දින අණදෙන නිළධාරී මේජර් එල්ජේසී ද පීරිස් වෙනුවෙන් පැවැත්වූ සම්මාන මුරය.



ඒකක දිනය නිමිත්තෙන් 2009.04.25 දින අණදෙන නිළධාරී වෙනුවෙන් පැවැත්වූ සම්මාන පෙළපාලිය.





2009.05.13 දින ආසේමු(නැ) වැලිකන්ද ප්‍රදේශයේ ඒකකය ස්ථානගත කිරීම ප්‍රධාන කොටගෙන අණදෙන නිළධාරී විසින් වැඩකටයුතු ආරම්භ කිරීම.



අණදෙන නිළධාරී ඇතුළු නිළධාරී / සෙසු නිළයින්ගේ සමූහ ඡයාරූපය.



2 (සෙව්) ශ්‍රීලංසංබ නිළ උසස් කිරීමේ හා වෘත්තීමය පාඨමාලාවන් පවත්වාගෙන යනු ලබන ආකාරය

# කෙළි බිම

## වසරේ විශිෂ්ඨ ක්‍රීඩකයින්



**සෙ/800042 සැරයන් රාජපක්ෂ ආර්ඒඑස්ඒ**

2009 වසර ජාතික මහ ක්‍රීඩා උළෙල තරග ඇවිදීම 2 වන ස්ථානය, 2007 වසර 3 වන ස්ථානය, 2007 වසර ජාතික ශූරතා ක්‍රීඩා උළෙල 3 වන ස්ථානය. ජාතික, පළාත් හා දිස්ත්‍රික් ජයග්‍රහණයන් සමග.



**සෙ/2සී00632 ලා/කෝ ප්‍රේමරත්න ඊජීඩීපී**

2009/05/25 සිට 28 දින දක්වා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේ පැවති බොක්සින් තරගාවලියේ බර කිලෝ 48-51 අතර සැහැල්ලු බර පන්තියේ අනුශූරතාවය ලබාගෙන ඇත.



**සෙ/2සී00680 ලා/කෝ ගුණරත්න ආර්එම්ඇයිබී**

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනා අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා තරගාවලියේ 2008 වර්ෂයේ මීටර් 10000 සහ මීටර් 5000 යන තරග ඉසව්වන්ගෙන් තුන්වන ස්ථානය ලබාගෙන ලෝකඩ පදක්කම් හිමිකරගෙන ඇත.



**සෙ/2සී00623 ලා/කෝ සෝමරත්න එච්කේඑන්පී**

2008/09/30 දින සිට 2008/10/31 දින දක්වා ප්‍රවේපුපා දියතලාව වෙතින් පැවැත්වූ ඒකක වෙඩික්කරුවන් පුහුණු කරවන්නන්ගේ පාඨමාලාව අංක 19 දක්ෂ ලෙස හදාරා පළමු ස්ථානය ලබාගෙන ඇත.

# උත්තම පූජා

## ඔවුහු අප වෙනුවෙන් දිවි පිදුහ

### ක්‍රියාන්විත හේතුන්මත මියගිය අයවළුන්

**නි/63698 මේජර් ඩබ්ලිව්එම්ටීඑස් වන්නිනායක - 3 ශ්‍රීලංසංබ**
2009.02.09 දින මුලතිව් විශ්වමඩු හිදී

**සෙ/275592 සැරයන් විතානගම පීඑකේ - 3 ශ්‍රීලංසංබ**
2009.02.09 දින මුලතිව් විශ්වමඩු හිදී

**සෙ/276290 ලා/කෝ ආනන්දරත්න ආර්එම් - 5 ශ්‍රීලංසංබ**
2008.10.30 දින නච්චකුඩා හිදී

**සෙ/192325 ලා/කෝ මහින්දපාල බීඑම්ම් - 5 ශ්‍රීලංසංබ**
2008.10.30 දින නච්චකුඩා හිදී

**සෙ/277198 කෝප්‍රල් උදය කුමාර එම්කේඩී - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/277447 කෝප්‍රල් දිසානායක පීජීබී - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/278997 ලා/කෝ දිසානායක ඩීඑම්එන් - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/279754 ලා/කෝ විමලරත්න එස්එඩී - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/280377 ලා/කෝ එදිරිමාන්න ඊආර්පීකේ - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/280463 සංසෙ සෙනෙවිරත්න එස්පීඑම්ඊකේ - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/280467 සංසෙ රත්නායක ඩබ්ලිව්පීඑම්එස්ආර් - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/280964 සංසෙ දිසානායක එඩීකේ - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/2810716 සංසෙ තිලකරත්න ඩබ්ලිව්එ - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/281076 සංසෙ කුමාර පීපීජී - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/281584 සංසෙ සම්පත් ඩබ්ලිව්පීපී - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/282469 සංසෙ රංජිත් ආර්එම් - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/275724 මා/සැ කරුණාරත්න එම් - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/277120 කෝප්‍රල් ගුණවර්ධන පීආර් - 5 ශ්‍රීලංසංබ**
2009.02.09 දින විශ්වමඩු හිදී

**සෙ/276211 ලා/කෝ කරුණාසේන පී - 5 ශ්‍රීලංසංබ**
2009.07.03 දින අනුරාධපුර හිදී

**සෙ/275798 මා/සැ පතිරාජ එස්පීඑම්ඩී - 6 ශ්‍රීලංසංබ**
2008.11.17 දින මුහුමාලේයි හිදී

**සෙ/280332 සංසෙ රූපසිංහ එච්එම්එම්සී - 7 ශ්‍රීලංසංබ**
2009.01.21 දින මුලතිව්, පුදුකුඩුඉරිප්පු හිදී

**සෙ/194094 ආසෙ ජයලත් කුමාර ඩීඑම්පී - 7 ශ්‍රීලංසංබ**
2009.01.24 දින ඔඩ්ඩුසුඩාන් හිදී

**සෙ/194820 ආසෙ චින්තක ඩීඑල් - 7 ශ්‍රීලංසංබ**
2009.03.06 දින මුලතිව්, පුදුකුඩුඉරිප්පු හිදී.

**සෙ/277136 ලා/කෝ පතිරණ කේපීඑම්ජේ - 8 ශ්‍රීලංසංබ**
2009.01.16 දින පුදුකුඩුඉරිප්පු බටහිර හිදී

**සෙ/281935 සංසේ රත්නායක වයිඩීආර් - 8 ශ්‍රීලංසංබ**
2009.01.17 දින පුදුකුඩුඉරිප්පු බටහිර හිදී

**සෙ/281798 සංසේ රාජපක්ෂ ජේජේඑම්ආර් - 8 ශ්‍රීලංසංබ**
2009.06.03 දින ජයපුරම් හිදී

**සෙ/279752 සැරයන් බණ්ඩාර ඩීජීඑල් - 10 ශ්‍රීලංසංබ**
2008.09.12 දින මාන්කුලම් හිදී

### ක්‍රියාන්විත නොවන හේතුන්මත මියගිය අයවළුන්

**සෙ/66410 සැරයන් ආනන්ද එච්එ - 1 ශ්‍රීලංසංබ**
2009.05.01 දින මහරගම පිළිකා රෝහලේදී

**සෙ/276601 සැරයන් විජේසුන්දර ඩබ්ලිව්ආර්එ - 1 ශ්‍රීලංසංබ**
2008.11.11 දින - 231 බසේමු හිදි

**සෙ/277680 ලා/කෝ සම්පත් ඩබ්ලිව්එකේ - 6 ශ්‍රීලංසංබ**
2009.08.05 දින කුඩාපීරියාගම හිදී

**ස/282203 සංසෙ ප්‍රේම්කුමාර පීඑස් - 6 ශ්‍රීලංසංබ**
2009.08.23 නිවසේදි

**සෙ/165792 සංසෙ ඒකනායක ඊඑම්සේ - 6 ශ්‍රීලංසංබ**
2009.05.15 දින නිවසේදි

**සෙ/201715 සංසෙ දයානන්ද ආර්එම් - 9 ශ්‍රීලංසංබ**
2009.02.07 දින රජයේ රෝහල පොළොන්නරුව හිදි

**සෙ/2800531 ලා/කෝ බණ්ඩාර කේඑම්එආර් - 2 ශ්‍රීලංසංබ**
2008.11.01 දින මහකඳරාව හිදි

# කැඩපත් පවුර

## CADET SHIP

RUN UP TO THE WHITE GATE
FIRST FIVE WILL END UP IN REST
ONE, TWO, THREE, FOUR, FIVE, SIX, SEVEN
LEFT RIGHT LEFT RIGHT LEFT
303 IN HIGH – PORT AND
RUNNING ROUND THE UC PITCH
OFTEN IN BATTLE ORDER
WITH HEAVY CLUMSY PACKS
DUMMY 303 RUNNING 9 MILES AND 2 MILES
SLEEPLESS NIGHT INSPECTION AND
REPORTING
AND A WONDERFUL AND INTERESTING
PERIOD OF CADET SHIP

*O/63499*
*MAJOR AAT SOMARATHNA*
*3 SLSC*

## දෙපා වැඳ අපි ඔබට දිවුරමු... නොදෙමි කඳුලක් මෙමතු අම්මේ...

බුදු පා පහස නොවරක් සිපගත් — ලංකා
ජයමා බෝ රජුන් වැජඹෙන සිරි — ලංකා
සිරි දළදා බලෙන් රැකෙනා රට — ලංකා
මා දිනූ මගේ රට මව් බිම ලංකා — ලංකා

එපා දරුවන් මරා ගන්නට නුඹල ඔක්කොම මගේ — දරුවන්
එපා දරුවනි පිල් බෙදෙන්නට මිනිස් පවුලේ එකම — නෑයන්
කියා කීවත් අනේ අම්මේ නැහැනෙ කනකට ගත්තෙ — හෙළයන්
පුරා අවුරුදු තිස් වසක් තුළ මරාගත්තානෙ පවුලෙ — සොයුරන්

ගැමුණු ගජබා මහා පැරකුම් දැයේ විරුවන් වැදූ — අම්මේ
රහල් දම්පල් සුමංගල මෙන් මහා සඟරුන් පිදූ — අම්මේ
මහා සිංහල දමිල මුස්ලිම් සියළු දරුවන් ඔබෙයි — අම්මේ
දෙපා වැඳ අපි ඔබට දිවුරමු නොදෙමි කඳුලක් මෙමතු — අම්මේ

අනේ දළදා සමිඳුනේ මගෙ ඔබට බාරයි දිනූ — අම්මා
මහා තෙද රැඳි සතර දෙවිඳුනෙ ඔබට බාරයි දිනූ — අම්මා
මගේ පනනල දෙවැනිකොට මම සදා රැකගත් දිනූ — අම්මා
දරුවනේ මගේ උපදිනා මතු නුඹට බාරයි මෙලක් — අම්මා

සෙ/66942 බඹ 11 ධර්මකීර්ති දසනායක ඩීඑමඩීබී
3 ශ්‍රීලංසංබ



## වන්දනා කරයි ඔබේ නාමය...

සුවහසක් මල් පිපි පරව යනමුත් වනතුල
දහසකුත් තුරු කැට පෑයුවද ගඟන මත
කිමිද ඇති එල ඉන් ලොව වෙත......

මමත්වය පොඩි බැද තරග වැදි ඇති මෙවන් යුගයක
පොදු අරමුණක් දරා සිත තුල
කැපකලා උන් දිවිය සදා ජාතියේ නමට

ඔබ වැදූ මව්වරුන් - ඔබ සැදූ පියවරුන්
ඔබ ලැබූ අඹුදරුවන්
වාසනාවන් ලක් මවට
උදාවන හෙට දිනේ
වන්දනා කරන්නේ - වන්දනා ලබන්නේ
නාමයයි ඔබේ......

සෙ/277412 සංසෙ විමලදාස බයිපී
5 ශ්‍රීලංසංබ - සංඥා පාසැල

## සංඥා මාතා දරුවනි

රට වෙනුවෙන් හිවි අඩපනව ගිය
සංඥා මාතාවගේ සියලු සෙබල සොයුරනි
ඇති නැති මෙදින
මේ ලොව සිටින නොපෙනෙන දෙවියන්ට වැඩියෙන්
බැති බරව පින්පෙත් දෙවන්නම් ඇස කඳුලින් මම

ලාකෝ ප්‍රියංකර ආර්පීඑස්
3 ශ්‍රීලංසංබ






## සෙනෙහෙබර කුමරියේ

දෙවියන් විසින් දුන් මහඟු දායාදයක් මෙන්
මගේ දෙනෙතට හමුවූ ඔබ
ටිකෙන් ටික විකසිත වත්ම
මගේ හදවතට මොහොතින් මොහොත
ලංවූ අයුරු මට අද වගේ මතකය....

සොඳුරු අතීතයක් මැදින්
මගේ ලොවටආ ඔබ
මේ ලොව තිබන
වටිනාම සම්පත සේ දකිමි නිරතුරු....

රටදැය වෙනුවෙන් සේවය කරන්නට
රටදැය වෙනුවෙන්
උතුරුකරයට පා තබන්නට
මාහට ඔබගෙන් ලැබුනු
සහයෝගය කියා නිමකල නොහැකි තරම්ය....

විටෙක ඔබ මට යෙහෙළියකි...
තවත් විටෙක ඔබ මට
සෙනෙහෙ බර බිරිඳකි, මවකි
සොහොයුරියකි, උපදේශිකාවකි.....

දයාබර කුමරියේ.....
ඔබගේ සෙනෙහස මැද
සතුටින් දිවි ගෙවන මා
පතන්නම් හැම භවයකම
ඔබ මගේම වේවා කියා.....

**සෙ/277043 සැරයන් වසන්ත කුමාර එන්ඩිවී**
**3 ශ්‍රීලංසංබ**

## නිදිවැරුවේ නුඹ නිසයි...

ගිම්හානයට පසු
පැමිණි වස්සානයේ මල් පිපී දිලුනාට
නෑ සුවඳ මගෙ හදට
දෙතොල් පෙරලා හසනා පුංචි ඔයා [illegible]
කෙලෙස නම් හිඳින්නද
හැඟුම් නොහැඟෙන [illegible]
බොල් තුලුං [illegible] අද [illegible]
දෙන්න වෙයි [illegible]
අසම්මිත මුත් [illegible]
නන්නාඳුනනා සේ [illegible]
වෙයි උන්ව සනා [illegible]

ලොකුවෙලා මතු [illegible]
සල්ලාලියක් කියා
අහිංසක නුඹෙ මවට.....

**සෙ/278935 ලා/කෝ විජේසිරි [illegible]**
**3 ශ්‍රීලංසංබ**





## හොඳ දේ

හොඳ දේ කිරීම අසීරුය.
එවැනි දේ කල විට ඒවා,
වටිනා හා ලස්සන දේ වෙයි
පහසු දේ කරන්නට
ඕනෑම කෙනෙකුට හැකිය
එසේ ම ඕනෑ කෙනෙක් ඒවා සිදු කරති
නමුත් ඒවා වටිනා හා ලස්සන දේ වන්නේ නැත
එහෙයින් අනෙක් අය පසුබාන
අනෙක් අය අත හරින අසිරු හොඳ කටයුතු අප
බාරගත යුතුයි.
එය කල හැකියි.

**කපිතාන් පීඑච්පී උදය ශාන්ත ආර්එස්පී**
**4 ශ්‍රීලංසංබ - අනුරාධපුර**



## සසර ගමන

මේ අනන්ත සසර ගමනේ
අපි එකට යමි, එකට ජීවත් වෙමු
මියයන තුරාම...
කවදාවත් වෙන් නොවන්නට
කවදාවත් දුකක් ඇති නොවන්නට
ආදරයේ නාමයෙන් පාරමී පුරමු
අනන්ත අප්‍රමාණ දුක් ගැහැට
වලින් පිරුණු මේ ලොවේ
කැඩපතට සමාන පිරිසුදු
මල් ලොවක් වැනි ලස්සන
ජීවිතයක් අපට හිමි වේවි
ඒ ලස්සන ලෝකයේ
අවසානය තෙක් එකට ජීවත් වෙමු.

**සෙ/281309 සංඥා භුවන් කුමාර [illegible]**
**ශ්‍රීලංසංබ - අනුරාධපුර**

## නොමියෙන මතකය

පුදුමාතලන් පෙදෙසේ දුක  දරාගෙන
ජන ගඟ ගලා ආවා දුක  දරාගෙන
නෙක නෙක මුහුණු දුටුවත් පසු කරන්  යන
මට ඒ මුහුණු තව පෙනෙනව සෑම  තැන

සුරතල් සිනා මුව දුකකින්  වසාගෙන
නුඹ හිනැහුනා මගෙ නෙත් දෙස  බලාගෙන
කරනා දේව කාරිය ලඟ  තබාගෙන
සිත ඉගිලුනා මගෙ දරුවන්  සොයාගෙන

දින සති යුද බිමේ ගත කර විළි  ගැහැට
යන්නේ ගෙදර පැටවුන් ටික  දකින්නට
ලංකර ඕවුන් සුරතල් බලනා  ලෙසට
සිතුනා නුඹව තුරුලට ගෙන  සිඹින්නට

කඳවුර තනා දෙපසින් යුද  වැදීගෙන
ලෝකය පෙරලෙනව උන් උන්  මරාගෙන
මල් කැකුලකට ඉඩ නැති මුත්  සිනාවෙන
දරුවන් හිනැහෙනව ඒ දුක්  දරාගෙන

නුඹ යලි දකින්නට නොලැබෙයි පුතේ  මට
එනමුත් මතකයෙන් නොමැකෙයි සිනා  කට
ලොව දෙස බලා රක්නා දෙවි බඹුන්  හට
වැඳලා කියමි සැම දරුවන්  රකින්නට

**සෙ/66807 බනි 11 පුෂ්පකුමාර ආර්ටී**
**3 ශ්‍රීලංසංබ**

## සමනළයෝ

හිමිදිරි උදයේ
මලක් දැක නැවතුණිදෝ
සමනළයෝ...
ඇයි ඒ මල දැක
රොන් නොගෙන ගියේ
සමනළයෝ....
වෙනත් සමනළයෙකු ඒ පැණි
බී ඉගිලගියාදෝ
ඉතිං නොසැලෙන්
සමනළයෝ....
වෙනත් මලකට ගොස්.
රිසිසේ පැණි බී ඉගිලෙන්න
සමනළයෝ....

**සෙ/279962 ලා/කෝ වික්‍රමසිංහ [illegible]**
**4 ශ්‍රීලංසංබ**

## සිහිකරමි පියාණෝ...

වෛරයෙන් ක්‍රෝධයෙන් පිරි මේ මිහිතලේ
නොසැලී ඔබ අප සියලු දෙනා වෙනුවෙන්
වැයකල ලේ සහ දහදියට සදා ණය ගැති වෙමි පියාණෙනි

[illegible] අයට වෛර නොකර
යහගුණ කියාදී නිසි මග පෙන්වූ
ආදර පියාණෙනි

ඔබ රබර් වත්තේ වැඩ කරන විට
මා රැගෙන ආ කහට බෝතලය බී
අප වෙනුවෙන් ඔබ හෙලූ ශක්තිය හා දහඩියට
සදා ණය ගැතියි පියාණෙනි

අප සිවි දෙනා යහමගට ගොස් සමාජයේ දැහැමිව පිවත්වීමේ ඔබ
තැනූ ඒ ලෝකය අකුරටම ඉටු කෙලෙමි පියාණෙනි.
හිරු බසිනා මොහොතේ සුදු අරලිය මල් පුදා
සදා ඔබ සිහිකරමි පියාණෙනි.
ඔබට නිවන්සුව පතමි...

**සෙ/275629 කෝප්‍රල් චන්ද්‍රසිරි එස්ඒ**
**4 ශ්‍රීලංසංබ**

## කඳුලක් උපද්දා

සදක් සේ නුඹ උදා වුදා
මගේ සිත් අහසේ.....
පැතුම් පිපුණා සිනා නැගුණා
එළියදී රහසේ...
මලක් වී නුඹ පිපී ආදා
මගේ සිත් උයනේ...
සුවඳ දැණුනා සිසිල දැණුනා
සිහිනයක් වාගේ
ගගක් සේ නුඹ ගලා ගියදා
මටද හොර රහසේ...
අහිමි නුඹ ගැන උපන් කඳුලක්
තවම ඇත දෙනෙතේ...

**සෙ/66760**
**බනි 1 ආර්එම්එස්කේ [illegible]**
**ශ්‍රීලංසංබ**

## බංකරේ සිට මාගේ [illegible]

අහසට තරු මල්
කොපමණ තිබුණත්
එළියක් නෑ පුන්සඳ තරම්
දිවියට කොතරම්
අය එක් වුවත්
අගයක් නෑ ඔබ තරම්.

**සෙ/278884 ලා/කෝ ඇල්ලෙපොල [illegible]**
**4 ශ්‍රීලංසංබ**

## සෙබළ බිරිඳගේ සෝසුසුම්

| | |
|---|---|
| භවයේ දිනක මගෙ හිමි සඳ | හමුවුවා |
| ආදර වදන් කියමින් කාලය | ගෙවුවා |
| කිසිදා කීසි දිනක මගේ හදවත | නොපෑරුවා |
| ඔබ අරගෙන ගියේ නොසිතූ ලෙස | මරුවා |
| | |
| කාලය ගෙවී පුතු ටික ටික ලොකු | වෙනවා |
| මා ලග දණගසා ඔබ ගැන | විමසනවා |
| හදවත ඉකි ගසයි දෙනුවන් | වැලපෙනවා |
| කඳුලට හැම දිනම ඇස් දෙක | හුරුවෙනවා |
| | |
| පුතුනේ නුඹගෙ පියා විරුවෙක | විලා |
| ගෙදරින් ගියේ දෙදෙනාගෙම මුව | සිඹලා |
| දින දෙක තුනක් රැඳුනා කඳවුරට | වෙලා |
| අවසන් සටනේ මැරුණා එඩි බල | පාලා |
| | |
| පියතුමා ගියා අපි දෙදෙනා | තනිකරලා |
| මතු භවයකදී හමුවෙමු අපි පින් | කරලා |
| සසරේ කරපු පව් පින් මේලෙස | ගෙවිලා |
| හමුවෙයි නැවත භවයක මගේ හිමි | විලා |
| | |
| ලොව පවතින සියලුම දේ නැති | වෙනවා |
| සම්බුදු අමා මෑණි දෙසූ දහම් | අමා |
| සිසිලස් වෙලා නිතරම ඒ දහම | අමා |
| නිවනින් සැනසෙන්න මතු දිනයක පතමි | මෙමා |

සෙ/276108 කෝප්‍රල් රාජපක්ෂ ටීඑම්එම්
5 ශ්‍රීලංසංබ

## මගේ මැණික

මැණිකේ ඔයාටම හිංදා
ඔයා ගොඩක් දුක් වින්දා
තවත් ඔයාට දුක් දෙන්න තරම්
මම නපුරු නැත රත්තරනේ....

ඔයා දන්නවාද මම ඔයා
ගැන දුක්වෙන තරම්
ඒකයි ඔයාගෙන් ඈත්වෙන්න
මම තීරණය කෙරුවේ....

මට සමාවෙන්න මැණිකේ
එක වාරයක් නෙමෙයි
දස දහස් වාරයක් මට
සමාවෙන්න....
ඔයා මාව තේරුම් ගන්න
ඔයාට මම තවමත් ආදරෙයි
ඇත්තමයි....

සෙ/278665 ලා/කෝ ධර්මසිරි එච්ජී
4 ශ්‍රීලංසංබ

5/173766

## එක්සේසත් වූ ශ්‍රී ලක් මව්නි

අවිය අතට ගත්තේ
ඔබේ ඇති එඩිතර බවටයි
ඒ එඩිතර බවේ ජීවය රැකුනේ
සෙනෙහෙබර බිරිඳගේ,
දෙමාපියන්ගේ
ආශිර්වාදය නිසයි

යුද ගිණිදැල් නිවී එක්සේසත් වූ
ශ්‍රී ලක් මව් තුරු මත
ජීවිතය ගෙනයමු අපි
මේ සමිතියේ විහා ඉමට
සහෝදරත්වයෙන් සෙනෙහසින්
ආදරෙන්....

සෙ/279263 ලා/කෝ කරුණාරත්න කේවීඑම්
4 ශ්‍රීලංසංබ

## රණවිරු උපහාර

කිහිලිකරුවක වාරුවෙන් ගොස්
ගොඩවුනා මා බස් රථයකට
තරුණ කුමරුන් - කුමරියන් ඇත
අසුන් ගෙන තම යුගන් එක්කොට
නොමැත මා දෙස බලන කිසිවෙකු
මදක් බරදුනි කිහිලිකරුවට
දුටිමි හැමතැන තිබෙන කොඩිවැල්
රට රකින විරුවනට ගරු කොට

සෙ/275268 සැරයන් ගුණසිංහ
4 ශ්‍රීලංසංබ
සංඥා පාසැල

## සෙබළු සිතුවිල්ලක්

මා ඉපදුන මේ පොළවේ
උරුමය රැක ගන්න සිතන්
බැඳුණා මා හමුදාවට
එය ඉටුකර ගනු පිණිසට....

සෙ/277557 ලා/කෝ අතපත්තු එච්එම්එන්එස්බී
4 ශ්‍රීලංසංබ





## ඈසව්වනේ සෙනෙහස

මා ඇයගේ බව ඔබ ඔහුගේ බව
ලෝකයම දන්නා රහසකි
අනන්තයත් නොමැතිව තවත් දිව යනු රිසිද
ඈත ක්ෂිතිජය කොනක
අහස්ගැබ පොළව සිප වැලඳගත්ත ද
එයත් හරියට අපේ ආදරය මෙන්
මිරිඟුවක් ම නොවේද රෑ....
අසීමිත බැඳීමක මම නුඹට පෙම්කර
පතන්නේ මොනවාද රෑ
මගේ ජීවිතයේ නුඹට දෙන්නට
දෙයක් තැනක් නොමැති කල
තව තවත් හදවතට දුක් දී .
පතන්නේ මොනවද රෑ
මට නුඹටද නුඹට මාවද
අප ඔවුන්ගේම වන්නට
පෙර මුණ නොගැසුන පවට
දොස් නගන්නට ඇවැසිමුත්
දෛවයේ සරදමට එරෙහිවී
නැගෙන්නට තරම් හයියක්
දුබල මගේ සිතට අද නොමැත
ලෝකයම සුව නින්දක සිටින
මේ අඳුරු රාත්‍රියේ
හද පිරුණු මාගේ දුක අකුරු කර
තබන්නට නිහඬ වෑයමක් දරන්නේ
හෙට අළුයම උපදින හිරුට පෙර
මගේ අන්තිම සුසුම් පොද
වා තලයට මුසුවේයැයි
ඇති නිර්මල හැඟීමෙනි

**සෙ/2සී00790 සංසෙ පවතිනාමුණි කේඒඅයිඩීඩබ්**
**2රෙපි: ශ්‍රීලංසංබ(සෙව්)**

## මිහිමඬලේ ජීවය

මිහිමඬලේ ජීවය මව්නේ ඔබය හිරු
තරු කැටයක්වී මා ඔබෙන් ජීවය ලදු
සැඩ හිරු කිරණ පරදා සෙවණ සැදු
ඔබයි රුක් දෙවිදුන් මේ ලොවේ උතුම්

නැගෙයි රල පෙල රුදුරු වෙසගෙන
හමයි හැඩ සුලඟ දස අත
නොයන්නට යළි පැමිණි මග දුර
ඔබයි නැව්යා දිරිය දුන් මව

තනින මිදුනල දෙසට නොනැමෙන
හොනිමි සුවදැති සඳුන් තුරක් විලසින
ගුණ සුවද විහිදුවන්නට මේදියන
ඔබයි පැළදුවේ රුහිරු කිරුල මා හිස

**සෙ/2සී00797 සංසෙ සිල්වා කේආර්**
**2රෙපි:ශ්‍රීලංසංබ(සෙව්) - වැලිකන්ද**

## නිමාවූ යුද්ධය

යුධ ගිනිදැල්ල නිමාවී ඇත
සිත්සතන් පහන් වී ඇත
වෙනදාට වඩා ඉක්මනින්
මම එන්නම් නුඹ බලන්නට
අම්මේ

සිවු දෙසින් ඇසුන
වෙඩි සද්ද
දැන් අම්මේ නැවතිලා
මිනිසුන්ගේ සිත් සතන්
සිනහවෙන් ඉතිරිලා
සෞභාග්‍යමත් කාලයක්
දැන් අපට එලඹිලා
සියළු අපි එක් රටක්
ඉමු එකට සැනසිලා

**සෙ/2සී00788 සංසෙ රත්නායක ඩීකේ**
**2රෙපි:ශ්‍රීලංසංබ(සෙව්)**



## මාගේ ආදර අම්මා

රන්මිණි මුතු දුන්නත් ඉස්තරම්
ඔබෙ සෙනෙහස තරම් වටිද
රත්තරං...
ගුණ ගයන්න ඔබේ නමින්
නොමැත මට වරම්
සසරපුරා නුඹයි අම්මේ මගේ
රත්තරං...

**සෙ/277549 ලා/කෝ රත්නායක ආර්එම්සිකේ**
**4 ශ්‍රීලංසංබ**



## ලක් මවගේ දරු කැල එකමුතු වේවා

පෙරහුරු ලෙසට ආ මව්බිම රකින්නට
නෑකම් කියයි ඔබ පෙර රජ පෙලපතට
ලේ කිරි පොවා ඔබ හැදූ මව්පියන් හට
තුති මල් පුදමු අපි දෑතට එකතු කොට

මුර දේවතාවුන් දිවයින රැක දුන්න
සෙන්පති සෙබළු සොයුරන් දිවි පුද දුන්න
ඉතිහාසයේ නවරන් පිටු ගෙන දුන්න
විරුවනි ඔබට ජාතිය ණය ගැති වෙන්න

අවි වැසි දෙකම එකලෙස විඳ දරාගෙන
යුධ මිර උගුල් පස් කඳු බිඳ දරාගෙන
මව් බිම රකින තිර අදිටන් දරාගෙන
ආ මග නිමවුනා ජය ධජ නගාගෙන

තල් අරණේ නව ජන පද ඉදි වේවා
එල වැසි සපිරි ගොවිපල යලි සරු වේවා
යාල් දෙවියනට නව සළු එල දේවා
ලක් මෑණියගෙ දරු කැල එකමුතු වේවා

**සෙ/2සී00803 සංසෙ පුෂ්ප කුමාර බීවම්**
**2රෙපි:ශ්‍රීලංසංබ(සෙව්)**






## ජයගත් යුද්ධය

නතර වටින් පෙල ගැසිලා එන වෙඩි සද්දේ
මිතුරු කැල පෙල ගැසිලා මහකැලයේ
සතුරා පරදා පෙරටම යන මැද්දේ
සිංහ පැටවු ලෙල දෙනවා මහකැලයේ

මාපිය සහෝදර බිරිඳ එකට බැඳී
ඔවුන්ගේ යුතු කම අප හා එකට හිමි
අවියත් වෙඩිත් සමගින් අපි වෙහෙසෙද්දි
ඔවුන්ගේ යුතුකමකි අපි දිරි කිරීමට

දහසක් කවි කීවොත් අප සිහිකරලා
සෙත් කවියක් වේවා අප එය සිහිකරලා
සටන් බිමේ අප ගැන ඔබ තනිකරලා
දෙවියොත් සිටි යුද වැදුමට අප සිහි කරලා

අව්ව වැස්ස රෑ දහවල් වෙහිසිලා
යුද්ධයේ අඳුරු බව අපහට දැනිලා
මොනව වුනත් ලක්මෑණිව රැකීමට
පෙරටම යනවා අප රට රැකීමට

සිංහ පැටවු මෙන් අප සැම එක්වීලා
යන්න උනා මහ වනයේ ඒක්වීලා
සතුරා මෙල්ල කරන්නට වනයේ එක්වීලා
දෙන්න උනා සතුරට වෙඩි තනිවීලා

මා පිය බිරිඳ දූ පුතුන් මදකට අමතක කරලා
යන්නේ පෙරට අඩිය රට රැකුමට කියලා
අනේ දෙවියනේ අප විඳිනා දුක ගැන සිතලා
දුන්නා මෙදා පාර ලක් මෑනිව නිදහස් කරලා

**සෙ/2සී00789 සංසෙ සිසිර කුමාර පිආර්**
**2රෙපි:ශ්‍රීලංසංබ(සෙව) - වැලිකන්ද**

## අම්මා

විසිතුරු මල් පිපෙනා තුරු වදුලක
සුවඳ මලකි අම්මා
ගණඳුර දුරුකර ලොවම එළිය කල
සුපුන් සඳයි අම්මා....

වියලි කතරකදී පවස නිවාලන
දිය බිඳුවත් අම්මා
කුරිරු ලෝකයක නොසිඳෙන සෙනෙහසේ
විමන ඔබයි අම්මා....

බුදු ගුණයට පමණක් දෙවෙනි වූ ඔබ
ගුණ මහිමය අම්මා
ලොවිතුරු සැප ඇත ඔබගේ තුරුලෙහි
මගෙ ආදර අම්මා....

දෙවැනි බුදුන් නොව ගෙදර බුදුන් ලෙස
පදවි ලැබූ අම්මා
පැතුම් පතමි උපදින හැම භවයේ
මගේම වෙන්නට අම්මා......

**කෝප්‍රල් මනෝහාරි එල්පීඑම්**
**හමුදා ලේකම් කාර්යාලය**
**යුධ හමුදා මූලස්ථානය**





## දුරස්ව වූ නුඹ

මතකයට මගේ නුඹ නැගෙන විට
දෙනෙත් පුරා එයි කඳුලැල්
නොසිතුව ලෙස
කුසුම් පවා ඔබේ පෙම් බැන්ද
සිහිවන විට අදටත් හඩයි මගේ
සිත

ජීවිතයට දුක දැනෙන ජීවිතයම
කාලකිරවන
ලෞකික ලෝකයට අතාවැසි වූ
අහිමි වූ නුඹේ පෙම ගැන
කෙලෙස නම් අමතක කරම්ද

**සෙ/00043 ලා/කෝ ගුණතිලක එම්එම්ඩබ්**
**තොතාව්**

## අම්මා

කිරි මුහුද කළඹාලූ
ලේ කිරට හැරවූ
මගේ කඳුලු පිසලූ
මගේ අම්මා

ගතට සවිය ගෙන්වූ
සිතට සවිය දුන්නු
දිවි මගට එළිය වූ
මගේ අම්මා

නොනිමෙන දිවි කතරේ
නොනිවෙන පහන් සිලක් සේ
මගෙ ලොවම පහන් කළ
මගේ ආදරණීය අම්මා

උප උපන් ජන්මයේ
මගේම මව් වී
මගෙ ලොවට පායන්න
මගේ ආදරණීය අම්මා

**සෙ/800165 සාසෙ බණ්ඩාරනායක ඒඑම්එන්එච්**
**තොතාව්**



## නුඹ

වස්සාන සිහිනයට
මුල් පුරන අවධියක
හෙමින් එබිකම් කළත්
නුඹ මගේ හදවතට
පුදනු බෑ සිත නුඹට
දුක දැනෙයි තුන් හිතට
පවුරු පදනම් වලට
බියයි මගේ පුංචි හිත

කොපුරු නුඹෙහි හිනා හඩ
දයාබර වදන් පෙළ
නුරුයි මගෙ සිතු වලට
පෙරභවයේ විදි ලෙසට

වෛර නොකරන් මෙමට
ආදරෙයි මම නුඹට
හිමි නැතත් නුඹ මෙමට
පතන්නම් යළි භවෙක

සෙ/800232 සාසෙ දිලුම් එච්එස්
තොතාළ්

## බලාපොරොත්තුව...

නිවාඩුවක් ලද විගස
නිවහනට පැමිණෙන්න
පැතුම් සිය දහසින්
අපේ සිත් පුරවන්න
පොල් අතු අපේ ගෙපැල
උළු ගෙයක් කරලන්න
ඔබ මැවූ එම සිහින
අද හිත තුලම බොඳවෙලා
සිදු වූ දෙය කිමද?
අදහන්න බැහැ අපට
නිවාඩුවටත් කලින්
මිතුරන්ගේ කරපිටින්
ගෙදරටත් නොදන්නා
ඔබ ගෙදර පැමිණිලා
බලාපොරොත්තු සිහින විලසින්
සතර රියනට යටවෙලා
නුඹේ නෑ සියළු දෙනෙතට
කදුල පමණක් හිමිවෙලා

සෙ/800421 සැරයන් ලංකානි සිල්වා [illegible]
පරිගණක අංශය
සංඥා පාසැල

## මිතු දම

සුව හසක් ජන කැලක
පවස නිවනට පැමිණි
සුනිල ජල දහරාව
සොයුරියේ මට නුඹය

ඝණ අඳුර නිශාවින්
වර්ණ ගන්වා සිරින
රන් පෑය දිදුලන
තාරකාවිය නුඹය

නිකලැල් වූ මහද තුළ
සෙනෙහසේ මිතුරු දම්
රනකුරෙන් වර්ණ කල
සිත්තරාවිය නුඹය

සෙ/800172 සාසෙ ප්‍රනාන්දු [illegible]
තොතාළ්

## මාවිල් ආරු සටන

එල්ටීටීඊයේ හැත්තම නිරුවත නටන
කේසර පැටව් අප හමුදාවේ සිටින
දියයුතු පහර දුන් හැටි මසුරන් වටින
සිහිකර බලමු මාවිල් ආරුවෙ සටන

සිංහල දෙමළ මුස්ලිම් යන පිරිස හැම
යල මහ කුඹුරු කළ රැක පණ විලස තම
මාවිල් ආරුවෙ බලගතු බලගන අමන මෙම
ගැන කවි පොදිබදිමි සඟරාවකට මම

අල්ලා මාස ගණනාවක් අන්කර
අසරණයින්ගෙ ජීවිත රැසක් සුන් කර
රැකුමට බලය ඒ මුළු පෙදෙස වෙන් කර
හැදුවා මුර අගල් සමගින්ම බංකර

තිඹිරි ගෙයි සිටම යුධ හරඹය දන්නා
උප හමුදාව උන් ගව් ගනනක් පන්නා
සකසා අමුණ යලි තිබු ලෙස පණ ගන්නා
නැගුවා සිහල කොඩි තම බලතල පෙන්නා

සෙ/66862 බකි 1 ආරියවංශ කේඩබ්බී
තොතාළ්

## සය වසරක කළුව

ජීවිතයේ අරුත
දෝතට ගෙන...
තේරුම් කලේ
නුඹයි...

වරදට දඩුවම
දස්කමට සෙනෙහස
කියා දුන්නේ නුඹයි...

ලෝ දහම් කියාදී
දෛවයට පැරදී
ඔබ ගියා
අම්මේ කදුළු දී

කෝප්‍රල් මනෝහාරි වල්පිටම
හමුදා ලේකම් කාර්යාලය
යුධ හමුදා මූලස්ථානය

## බංකරේ කවුළුවෙන්

නලලට කුංකුම තියලා
පාර්වතී හිනාවෙන්න
ඉමිටේෂන් ලොකු කරාබු
කණ් යුගලේ එසාගන්න
බිංකො සපත්තුවෙන් තවම
සල්ලේ දදා පාරෙ යන්න
ඇට මාලෙට මල් ගවුමට
කරුණාකර සමු නොදෙන්න

තාලෙළු මූහුණෙ සුදු පවඩින්
යාන්තමට තවරගන්න
කල්පැනහිය කඩන කුඩේ
එපා ඔයා බිම තියන්න
මරතොන්ඩුවෙ කහට ළඟ
ඔය නියපොතු රතු කරන
බංකරයේ ඉස්සරහින්
හැමදාමත් ඔයා යන්න

සෙ/66862 බකි 1 ආරියවංශ කේඩබ්බී
තොතාළ්



## සිඟිති දියණියේ ප්‍රාර්ථනා

අතරින් පතර ඇති
නුඹේ කිරිදත් දෙපල
ගෙන එන්නේ සිනාවයි
සත්තමයි හැම විටම
නුඹේ කෙළි කවටකම්
විඩාබර අපේ සිත්
සනසවයි නිරතුරුව
මඳ පවණක් විලස
සිසිලසින් හමායන

**සෙ/800421 සැරයන් ලංකානි සිල්වා එල්එච්ඩබ්ලියු**
**විර්ණක අංශය**
**සංඥා පාසැල**

## ආදර අම්මේ

ලේ කිරි කර පොවා
මා දැඩි කළ සේම
ඔබ මට ආදරය කළ තරම්
වෙනත් කෙනෙකුට නෑ

ඒ තරම් ආදරේ
එසේ නම් අම්මේ
උපදින හැම භවයක
මගේම අම්මා වී ඉපදෙන්න

**සෙ/800451 සාසෙ වික්‍රමරත්න ඒඩීටී**
**තොතාල්**

## මිය ගිය කෝටි කත

පුදුමාතලන් යුධනැතිබිම මුවාවෙලා
හුදු විලමිසා බොඳවෙනු දුටු සිහින බලා
මුදු ගති නැති කොටි නංගී මුවා වෙලා
සිහිවුනි බිලිවෙන්න උන්ඩෙට පපුව පලා

පෙර රෑනේ කිතුල් හැඩපලු ගෙතීලා
කිර එරෙනා ලැමට දෑඟිලි වැදීලා
සිරකාරියක් සේ ඇඟ කුණු පෙරීලා
දර ඉපලක් වගේ ගත සවි බිඳීලා

පාසැල් ගොසින් මිතුරියො හා සිරි දවස
සැඳවුම් ලැබුණි නිවුමට විලම් පවස
උලමා හැඬූ මුසල දිනකදි හවස
ගිනි අවි තුරුළු කරගත්තා උඹ විගස

නුඹ බිහිකල මවට ඇති දැඩි කල ගමට
ලැබ කර්කස පහස සවි දුන් පිය තුමට
නී හොඳ මගට යැවුමට වැඩකල ගුරුට
පිටුපා විලමට දත නියවුවෙ කුමට

මවක් මෙන් හැදූ ලංකා මවට මෙත්
අවැඩ කරනු රිසි ගිනි අවි දැරූ අත්
තවත් එක් ලඳක් විලම වැලඳ ගත්
සාපෙට පියාගත්තා සදහටම නෙත්

**සෙ/66862 බනි 1 ආර්යවංශ කේඩබ්ඩී**
**තොතාල්**



## නුඹ බෝ දුර ඇතයි

නිල අහස් තලය
කෙතරම් ලස්සන වුවත්
ලංවී දකින්නට බෑ
බෝදුර ඈතයි
ඒ අහසයි නුඹගෙයි අතරෙ
නෑ කිසිදු වෙනසක්

නිල් අහසට දෑස යොමු කලත්
මහ සාගරයට දෑස යොමු කාලත්
දෑත දිගු කලත්
ඔබ දකින්න ආසාව තිබුනත්
එයට වඩා අවාසානාව විශාල නම්
කුමක් කරම්ද මා

මෙසේ ලංවී සිටිනු හැර

**සෙ/800168 සාසෙ අත්තනායක කේඑම්යූකේඑස්**
**තොතාල්**

## මාගේ ආදර අම්මා



දස මස කුස දරා මා බිහිකල අම්මේ
ලේ කිරිකර පොවා මා දැඩි කල අම්මේ
නිම්මා නැති දුකක් මා වෙනුවෙන් විඳි අම්මේ
ඔබෙ පා යුග වදිමි ආදර සුදු අම්මේ

අසනීපයක් වූ විට මා වඩාගෙන
දොයි දොයි කියා හැලවුවා බලාගෙන
මහ දුක් ගොඩක් හද තුල සිර කරවගෙන
වදිනෙමි දෙපා බැතියෙන් හිස නමාගෙන

**සෙ/2ඩී00809 සංසෙ මධූරංග යූපී**
**2රෙපි:ශ්‍රීලංසංඛ(සෙව්)**






# මන්දාකිණිය

## බෞද්ධ දර්ශනයට අනුව නායකත්වයේ ගුණාංග 10 ක්

Liberal - (ත්‍යාගවන්ත) - අනුගාමිකයින් හට විවිධ ත්‍යාග ලබාදීමට ඇති කැමැත්ත සහ එසේ නොමසුරුව තිබෙන දේ සැපයීම.

Equal - (සාධාරණ) - අනුගාමිකයින් හට සාධාරණව සැලකීම: සමාන අවස්ථාවන් සහ සමාන වරප්‍රසාද දීම: ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සම තැනක් දීම.

Active - (සක්‍රීය) - අලස නොවී කඩිසර වීර්යයෙන් කටයුතු කිරීම: කුසීනව නිකරුනේ කාලය ගත නොකිරීම.

Dependable - (විශ්වාසදායී) - විශ්වාශය තැබිය හැකිවීම: යථාවාදී තථාකාරීවීම - ප්‍රකාශ කල දේ කිරීම සහ කරන දේ ප්‍රකාශ කිරීම.

Educated - (උගත්) - සිය වගකීම් පිළිබද මනා හැකියාවක් තිබීම: අදාල වගකීම් පිළිබදව දැන උගත්වීම.

Ready witted - (ස්ථානෝචිත ප්‍රඥාව) - අවස්ථාවට උචිත නිවැරදි තීරණයක් ගැනීම හෝ හැසිරීම.

Self Discipline - (ස්වයං විනය) - තමන් විසින්ම සිත, කය වචනය සංවර කර ගැනීම: ප්‍රතිපත්ති හා රීති පිළිගනිමින් සහ ඒවාට ගරු කරමින් ඒවා අනුගමනය කිරීම.

Humanly - (මානුෂිකව) - මිනිස්කමට ගරු කරමින් මනුෂ්‍ය දයාවෙන් කටයුතු කිරීම: කරුණාවෙන් සහ අනුකම්පාවෙන් අනුගාමිකයින්ට සැලකීම.

Intelligent - (බුද්ධිමත්ව) - කිලිටි හැගීම් වලින් තොර මල නොබැදුණු නුවණක් තිබීම: යම් ගැටලුවක එක් පැත්තක් නොව අදාල පැති සියල්ලන්ම දැක සතුටුදායක විසඳුමක් කරා පැමිණීම.

Pleasant - (ප්‍රියවාදී බවක් තිබීම) ප්‍රිය වචන භාවිතයෙන් සිය අනුගාමිකයින් දිසාභිමුඛ කිරීම.

සෙ/276577 සැරයන් ජයවර්ධන ඩබ්ඩී
4 ශ්‍රීලංසංබ

(බුදුමග දිවයින අතිරේකයෙන් උපුටාගෙන නව අදහස් ඇතුලත් කර යහපත් හෙට දිනක් වෙනුවෙන් මෙසේ සටහන් තබන ලදි.)

## The Ten Commandments of Success

1. **Work Hard**
   The best investment an Officer can make.
2. **Study Hard**
   Knowledge enables an Officer to work more intelligently, effectively and systematically.
3. **Have Initiative**
   Ruts often deepen into graves.
4. **Love Your Work**
   Then you'll find pleasure in mastering it.
5. **Be Exact**
   Slipshod methods bring slipshod results.
6. **Have the Spirit of Conquest**
   Thus you can successfully battle and overcome difficulties.
7. **Cultivate Personality**
   Personality is to a human what perfume is to a flower.
8. **Help and Share with Others**
   The real test of professional greatness lies in giving opportunity to others.
9. **Be Democratic**
   Unless you feel right towards your fellow men, you can never be a successful leader of men.
10. **Do Your Best**
    The man who has done his best has done everything.
    The man who has done less than his best has done nothing.

Compiled by
Major NPA Mendis psc SLSC

## එකම වරද දෙවරක් කරන තැනැත්තාට දෙවියන්ගේවත් සමාව නොලැබේ.

වැරදි වීම මිනිස් ගතියකි. සමාව දීම දේව ගතියකි යනුවෙන්ද ප්‍රසිද්ධ කියමනක් තිබේ. දෙවියන් වුවත් වැරැද්දකට සමාව දෙනු ලබන්නේ එක වතාවක් පමණයි යනුවෙන් මාක්ස් සිසෙරෝගේ කියමනෙන් පැහැදිලි වේ.

යම් පුද්ගලයෙක් අතින් සිදුවන වැරදි නිසා එක් අයෙක් හෝ පිරිසක් එහි අහිතකර ප්‍රතිඵලය විදිති. සමාජයක් යහපත් වන්නට නම් පුද්ගලයින් අතින් සිදුවන වැරදි අවම කර ගත යුතුය. පළමුවෙන්ම කිසියම් වරදක් කරන පුද්ගලයාට සමාව දිය හැක්කේ ඔහු ඒ පිළිබදව අනවබෝධයෙන් සිටින නිසාවෙනි. එම වරදම නැවත නැවත එම පුද්ගලයා තුලින් සිදුවනවා නම් එය ඔහුගේ දුර්වලතාවයකි. එයට හේතුව තමාගෙන් සිදුවන වැරදි අවබෝධ කර නොගැනීමයි. වැරැද්ද සිදුවන පළමු අවස්ථාවේද්ම එම වැරැද්ද තමාගේ ජිවිතයෙන් ඉවත් කිරීමට වගබලා ගැනිම හොදම උපක්‍රමයයි:

සෙ/279747 සංසෙ බංඩාර ටීපීඅයිකේ
9 ශ්‍රීලංසංබ






## තරහ උපදින්නේ මෝඩකම නිසාය. එය අවසාන වන්නේ පසුතැවිල්ලෙනි.

වර්තමාන සමාජය දෙස බලන විට නිතර නිතර තරහ යන අයගේ සංඛ්‍යාව වැඩිවී තිබේ. මෙම කෝපය ජිවිතය විනාශය දක්වා දිග්ගැස්සෙන අවස්ථා කොතෙකුත් මේ අතර දක්නට ලැබේ. කෝපවීම ඇත්තෙන්ම මෝඩකමකි. අප තුල ගොඩනැගෙන මේ දුර්වලතාවය අවබෝධ කර ගැනිම තුලින් වලක්වා ගත හැකිය. අප සෑම විටම කෝප වන්නේ තවත් කෙනෙකුගේ දුර්වලතාවයක් හේතුවෙනි. අනුන්ගේ දුර්වලතාවයන් වෙනුවෙන් තමන් දුක් විදීම අනුවණකමකි.

කෝපවීම තුලින් අන් අයගේ සිත් රිදීමට පුළුවන. එවිට තමා අන් අය අතර, අප්‍රසාදයට පත් වේ. මේ සියළු හේතූන් සලකා බලන විට කෝපවීම තුලිවන් තමා තුල ඉතුරු වන්නේ පසුතැවිල්ලයි.

සෙ/279747 සංසෙ බංඩාර ටීපීඅයිකේ
9 ශ්‍රීලංසංබ

## සන්නිවේදන කාර්යයක් සිදුවීමේදී සිදුවන ක්‍රියාවලිය.

- කිසියම් සිදුවීමක් ඇති වීම.

↓

- පුද්ගලයාගේ ඉන්ද්‍රියන් මගින් එය උත්තේජනය වීම.

↓

- එම උත්තේජනයේ ප්‍රතිඵලයක් වශයෙන් එම සංඥා මොළයට හා ශරීරයේ වෙනත් අංශ වලට ගොස් ආවේගයක් ඇති වීම.

↓

- ඔහු එම ආවේගය වචන වලට හැරවීමට සූදානමක් ඇති වීම.

↓

- ඔහුට පුරුදු භාෂාව උපයෝගී කරගෙන වචන වලට පරිවර්තනය කරමින් පිලිවෙලට හැඩ ගැසීම.

↓

- පණිවිඩය තමා සිතන පුද්ගලයාට ලබා දීම.

↓

- ග්‍රාහකයාට ඇසෙන පණිවිඩය පිළිබඳව විමසිලිවත් වීම.

↓

- ඔහුට පුරුදු භාෂාව මගින් එය වචන වලට හරවා ගැනීම.

↓

- පණිවිඩය මගින් පුද්ගලයාට ග්‍රාහකයා කතා කිරීම.

(පොත පත ඇසුරින් සකස් කලේ)
සෙ/275527 සැරයන් කුසුම්සිරි ඩී.ඒ.එස්.
සංඥා මූලික වැඩපල

## LEGAL & LOGICAL

After having failed his exam in "Logistics and Organization" , a student goes and confronts his lecturer about it.

**Student:** "Sir, do you really understand anything about the subject?"

**Professor:** "Surely I must. Otherwise I would not be a professor!"

**Student:** "Great, well then I would like to ask you a question. If you can give me the correct answer, I will accept my marks as it is. If you do not know the answer, i want you to give me an 'A' for the exam.

**Professor:** "Okay, it's a deal. So what is the question?"

**Student:** "What is legal but not logical, logical but not legal, and neither logical nor legal?"

Even after some long and hard consideration, the professor cannot give the answer, and therefore changes his exam marks into an "A", as agreed.

Afterwards, the professor calls on his best student and asks him the same question.

He immediately answers: "Sir, you are 63 years old and married to a 35 year old lady, which is **legal but not logical**. Your wife has a 25 year old lover, which is **logical but not legal**. The fact that you have given your wife's lover an "A", although he really should have failed, is **neither legal nor logical**."

-Lt Col VLK Jayarathne psc SLSC-

## SIM කාඩ් පත

ජංගම දුරකථනය එහෙමත් නැතිනම් සෙල් ෆෝන් එක අද දිනය වන විට ඉතාම සුලභ උපකරනයක් බවට පත් වෙලා. GSM ජංගම දුරකථන ජාලය හඳුන්වා දීමත් සමගම SIM කාඩ් පත් හඳුන්වා දෙනු ලැබුනි. SIM කාඩ් පත ගැන සරල අවබෝධයක් ලබා දීම මා මෙම ලිපිය මගින් අදහස් කරනවා.

ඇත්තටම SIM එක කියන්නේ PCB – කුඩා Printed Circuit Board එකක්. GSM සෙලියුලර් ෆෝන් වලට SIM කාඩ් පත නැතිව කිසිම අයුරකින්වත් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් නැහැ. Cell phone එකක Switch එක on කල විට එම අවස්ථාවේ Cell එක අයත් වන (BTS එක-මූලික ට්‍රාන්සිස්ටර් ස්ථානය සමග සඳහන් වේ. ඒ සඳහා SIM කාඩ් පත තුළ ගබඩා කොට ඇති දත්තයන් උපකාර වනවා. වෙනත් ජාලයන්ට සම්බන්ධ වීමට අවශ්‍ය වන (data) fus SIM කාඩ් පත තුලයි පවතින්නේ.



### SIM කාඩ් පතින් ඉටුවන කාර්යයන්

පාර්භෝගිකයින්ගේ දත්ත ගබඩාකර ගැනීම.
භාවිතා කරන පුද්ගලයාගේ වලංගු භාවය සුරැකීම.
ගුවන් විදුලි සම්ප්‍රේෂණයේ ආරක්‍ෂා බව සුරැකීම.

### SIM කාඩ් පත තුල අඩංගු උපකරණ

Microprocessor
Read only memory (ROM)
Random Acces Memory (RAM)
EP ROM

### SIM කාඩ් පත තුල අඩංගු දත්ත

තාවකාලික දත්ත
ස්ථිර දත්ත
අමතර දත්ත

තාවකාලික දත්ත වල ජංගම දුරකථනය පිහිටි ස්ථානය පිලිබඳ තොරතුරුද අමතර දත්ත වල, කෙටි පණිවුඩය දුරකථන අංකයෙන්/විවිධ සේවා/ගාස්තු පිළිබඳ තොරතුරු ද ඇතුලත් වේ. ස්ථිර දත්තයන් තුල දුරකථනය පාවිච්චි කරන්නාගේ ජාත්‍යන්තර හඳුනාගැනීමේ අංකයද (International Mobile Identity) වලංගු භාවය තහවුරු කිරීමට යොදාගනු ලබන ගනිත ක්‍රම හා ඒ සඳහා යොදාගන්නා සංඛේතද අඩංගු වේ.

SIM කාඩ් පතෙහි ඇතුලත් සියලුම දත්ත රහස් යතුරු සංඛේතයන් යොදා ආරක්‍ෂා කොට ඇති අතර එය SIM කාඩ් පතෙහි වඩාම වැදගත් ක්‍රියාවලියක් වේ. එම රහස් සංඛේතය PIN අංකය නමින් හඳුන්වනු ලබනවා. (Personal Identity Number)

සෙ/275534 කෝප්‍රල් ලලිත් ඩබ්.පී
සංඥා මූලික වැඩපල






## කෘමීන් පලවා හරින පරිපථයක්

මෙම පරිපථය අපහට ඉතා පහසුවෙන් සාදාගත හැකිය. අප හට නිවසේ හෝ කාර්යාලයේ අපට විශේෂයෙන් හානිකරන මීයන්, කැරපොත්තන්, මදුරුවන් වැනි කෘමීන් පලවා හැරිය හැකිය. එමගින් 40Khz පමණ වන අධි සංඛ්‍යාත තරංග මගින් ඔවුන්ට හානි සිදුවේ. එම නිසා ඉතා පහසුවෙන් කෘමීන් පලවා හැරිය හැකිය.








ඩනි II ජයසිංහ ජේ.ආර්.ඩබ්
සංඥා මූලික වැඩපල
පනාගොඩ


## බලශක්ති විනාශයට එරෙහිව ඉලෙක්ට්‍රොනික්.

අපගේ නිවෙස් වල බාහිරින් ඇති ඇතැම් විදුලි බුබුළු සැන්දෑවට දැල්වූ පසු යලි ඒවා නිවා දමන්නේ උදේටය. මෙය මතකයෙන් හා අතින් කල යුතු කාර්යයකි. ඇතැම් අවස්ථා වල සැන්දෑවේ දැල්වූ විදුලි පහන් උදෑසනින් නිවා දමන්නට අමතකව දහවලටද දැල්වෙනු ඇත. සුළු වුවද මෙය නිරපරාදේ බලශක්තිය වැයවීමකි.

ඉතිං මේ කාර්යය ස්වයංක්‍රීයව සිදුකල හැකි මුදල් නාස්තිය මෙන්ම රටේ බලශක්තියද යම් පමණකින් අඩු කර ගත හැකි ඉතා සරල අඩු වියදමකින් සාදාගත හැකි පරිපථයක් පහත දැක්වේ.

මෙයට හොඳ මතකයක් ඇත. රැය හා දවල් හොඳින් හඳුනන නිසා රාත්‍රියේදී විදුලි පහන් දල්වන්නටත් දහවලේදී විදුලි පහන් නිවා දමන්නටත් මෙයට පුළුවනි.



අවශ්‍ය උපකරණ :-

| | |
|---|---|
| 330k,33Ω,3.3k,360 Ω Resistor | |
| 10kPreset | - 01 |
| 1000mf Capacitor | - 01 |
| 1mf/250v Capacitor | - 01 |
| L.D.R(Light Defenden Resistor) | - 01 |
| 3v Relay | - 01 |
| D400 Transistor | - 01 |
| 4.7v Sencer Diode | - 01 |
| 3IN 4007 Diode | - 01 |




සෙ/279088 කෝප්‍රල් සුපිත් කුමාර එච්.ඒ
සංඥා මූලික වැඩපල

## A REVOLUTION OF NETWORKING

A computer network allows computers to communicate with many other and to share resources and information. Computer networks can also be classified according to the hardware and software technology that is used to interconnect the individual devices in the network.

Twisted-Pair Cable - This is the most widely used medium for telecommunication. Twisted-pair wires are ordinary telephone wires which consist of two insulated copper wires twisted into pairs and are used for both voice and data transmission. For the purpose of networking generally Category Cable 5E (CAT 5E) is used to connect computers. This cable has 8 wires twisted as 4 pairs as shown in diagram below.




| | | |
|---|---|---|
| 1 | **Conductor** | Class 1 solid copper |
| 2 | **Insulation** | HDPE (High Density Polyethylene |
| 3 | **Sheath** | PVC (Polyvinyl Chloride) |

<u>Alternative cable for net working</u>

School of Signals being the premier Signal training establishment in the Sri Lanka Army, provides a comprehensive training of signal communication. In this context, Computer Unit of the Institute plays a vital role in the provision of computer literacy to Student Officers and Other Ranks of the Armed Forces.




An immediate expansion of existing network became an essential requirement since there is a great demand for the subject referred, hither to , on the instructions and guidance of the Commandant school of signals a sophisticated cable, (Aerial Cable) was replaced to Cable 5E (CAT 5E) to enhance network facility. This cables consists of different types such as 10 pair,20 pair,30 pair etc,



Since we are use only 4 wires (2 pair) for Data transmission, there is a possibility of connecting more computers with one Aerial Cable. For instance, a 30 pair Aerial Cable can accommodate 15 computes in the network. Further, we could join aerial cable with network cable (CAT SE) and could use without any data Losses.



Another advantage of using aerial cable is, it could transmit DATA, VOICE and AUDIO Signals at the same cable (3 in one) by using different pairs. Introducing of Aerial Cables to the Network System is a tremendous achievement of the School of Signals Computer Laboratory and it has created revolutionary era of networking.

*LT JMD NUWAN*
*SCHOOL OF SIGNAL*

# 100 SHORT CUTS TO ENHANCE YOUR SPEED

## Microsoft Word shortcut keys

Below is a listing of all the major shortcut keys in Microsoft Word.

| | |
|---|---|
| Ctrl + A | Select all contents of the page. |
| Ctrl + B | Bold highlighted selection. |
| Ctrl + C | Copy selected text. |
| Ctrl + E | Aligns the line or selected text to the center of the screen. |
| Ctrl + F | Open find box. |
| Ctrl + I | Italic highlighted selection. |
| Ctrl + J | Aligns the selected text or line to justify the screen. |
| Ctrl + K | Insert link. |
| Ctrl + L | Aligns the line or selected text to the left of the screen. |
| Ctrl + M | Indent the paragraph. |
| Ctrl + P | Open the print window. |
| Ctrl + R | Aligns the line or selected text to the right of the screen. |
| Ctrl + T | Create a hanging indent. |
| Ctrl + U | Underline highlighted selection. |
| Ctrl + V | Paste. |
| Ctrl + X | Cut selected text. |
| Ctrl + Y | Redo the last action performed |
| Ctrl + Z | Undo last action. |
| Ctrl + Shift + F | Change the font. |
| Ctrl + Shift + > | Increase selected font +1pts up to 12pt and then increases font +2pts. |
| Ctrl + ] | Increase selected font +1pts. |
| Ctrl + Shift + < | Decrease selected font -1pts if 12pt or lower, if above 12 decreases font by +2pt. |
| Ctrl + [ | Decrease selected font -1pts. |
| Ctrl + Shift + * | View or hide non printing characters. |
| Ctrl + <left arrow> | Moves one word to the left. |
| Ctrl + <right arrow> | Moves one word to the right. |
| Ctrl + <up arrow> | Moves to the beginning of the line or paragraph. |
| Ctrl + <down arrow> | Moves to the end of the paragraph |
| Ctrl + Del | Deletes word to right of cursor. |
| Ctrl + Backspace | Deletes word to left of cursor. |
| Ctrl + End | Moves the cursor to the end of the document |
| Ctrl + Home | Moves the cursor to the beginning of the document. |
| Ctrl + Spacebar | Reset highlighted text to the default font. |
| Ctrl + 1 | Single-space lines. |
| Ctrl + 2 | Double-space lines. |
| Ctrl + 5 | 1.5-line spacing. |
| Ctrl + Alt + 1 | Changes text to heading 1. |
| Ctrl + Alt + 2 | Changes text to heading 2. |
| Ctrl + Alt + 3 | Changes text to heading 3. |
| Ctrl + F1 | Open the Task Pane. |

## Microsoft Excel shortcut keys

Below is a listing of all the major shortcut keys in Microsoft Excel. See our main shortcut page if you're looking for other shortcut keys used in other programs.

| Shortcut Keys | Description |
|---|---|
| F2 | Edit the selected cell. |
| F5 | Goto a specific cell. For example, C6. |
| F7 | Spell check selected text and/or document |
| F11 | Create chart. |
| Ctrl + Shift + ; | Enter the current time. |
| Ctrl + ; | Enter the current date. |
| Alt + Shift + F1 | Insert New Worksheet. |
| Shift + F3 | Open the Excel formula window. |
| Shift + F5 | Bring up search box. |
| Ctrl + A | Select all contents of the worksheet. |
| Ctrl + B | Bold highlighted selection. |
| Ctrl + I | Italic highlighted selection. |
| Ctrl + K | Insert link. |
| Ctrl + U | Underline highlighted selection. |
| Ctrl + 5 | Strikethrough highlighted selection. |
| Ctrl + P | Bring up the print dialog box to begin printing. |
| Ctrl + Z | Undo last action. |
| Ctrl + F9 | Minimize current window. |
| Ctrl + F10 | Maximize currently selected window. |
| Ctrl + F6 | Switch between open workbooks / windows. |
| Ctrl + Page up | Move between Excel work sheets in the same Excel document. |
| Ctrl + Page down | Move between Excel work sheets in the same Excel document. |
| Ctrl + Tab | Move between Two or more open Excel files. |
| Alt + = | Create a formula to sum all of the above cells |
| Ctrl + ' | Insert the value of the above cell into cell currently selected. |
| Ctrl + Shift + ! | Format number in comma format. |
| Ctrl + Shift + $ | Format number in currency format. |
| Ctrl + Shift + # | Format number in date format. |
| Ctrl + Shift + % | Format number in percentage format. |
| Ctrl + Shift + ^ | Format number in scientific format. |
| Ctrl + Shift + @ | Format number in time format. |
| Ctrl + Arrow key | Move to next section of text. |
| Ctrl + Space | Select entire column.Shift + Space Select entire row. |

## Basic PC shortcut keys

| | |
|---|---|
| F1 | Open Help. |
| Alt + Ctrl + F2 | Open new document. |
| Ctrl + F2 | Display the print preview. |
| Shift + F3 | Change the text in Microsoft Word from upper to lower case or a capital letter at the beginning of every word. |
| Shift + Insert | Paste. |
| F4 | Repeat the last action performed (Word 2000+) |
| F5 | Open the find, replace, and go to window in Microsoft Word. |
| Ctrl + Shift + F6 | Opens to another open Microsoft Word document. |
| F7 | Spell and grammar check selected text and/or document. |
| Shift + F7 | Runs a Thesaurus check on the word highlighted. |
| F12 | Save as. |
| Shift + F12 | Save. |
| Ctrl + Shift + F12 | Prints the document. |
| Alt + Shift + D | Insert the current date. |
| Alt + Shift + T | Insert the current time. |

In addition to the above shortcut keys users can also use their mouse as a method of quickly do something commonly performed. Below some are examples of mouse shortcuts.

| Mouse shortcuts | Description |
|---|---|
| Click, hold, and drag | Selects text from where you click and hold to the point you drag and let go. |
| Double-click | If double-click a word, selects the complete word. |
| Double-click | Double-clicking on the left, center, or right of a blank line will make the alignment of the text left, center, or right aligned. |
| Double-click | Double-clicking anywhere after text on a line will set a tab stop.Triple-click Selects the line or paragraph of the text the mouse triple-clicked. |
| Ctrl + Mouse wheel | Zooms in and out of document. |

S/800421 SGT LANKANI SILVA FHAU
IT SECTION
SCHOOL OF SIGNAL






# ශ්‍රී ලංකා යුධ හමුදා පරිගණක ජාලය

**හැඳින්වීම :-**

නව සහස්‍රකය ආරම්භ වූයේ ලොව මෙතෙක් පැවැති සියළුම තාක්‍ෂණයන් අභිභවමින් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය (ICT) ඉදිරියට පැමිණෙමිනි. එය මේ වන විට මිනිසාට අවශ්‍ය සියළුම නිපැයුම් හා සේවා යන ක්ෂේත්‍රයන්හි ප්‍රධානතම අධාරකය සේවාව බවට පත්වී හමාරය. ආරක්‍ෂක ක්ෂේත්‍රය සැලකුවද එය එසේ වන අතර ආරක්‍ෂක ක්ෂේත්‍රය හා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය අතර යම් සමීප සැබැඳියාවක් ද පවතී. වී අන්තර්ජාල සංකල්පයේ මුල් අවදිය පසුබිම් වූයේ ඇමරිකා එක්සත් ජනපද හමුදාවල පරිගණක ජාලයයි. ඒ අනුව ගත් කළ ආරක්‍ෂක අංශ වලට තොරතුරු තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය අත්‍යවශ්‍ය අංගයක් ලෙස හැඳින්විය හැක.

**දීප ව්‍යාප්ත ජාලයක අවශ්‍යතාවය**

පසුගිය වසර කිහිපයේදී ඉතා සීග්‍රයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව ව්‍යාප්ත වූ අතර ආරක්‍ෂක සේනා, සේනාංක, බලසේනා, බළඇණි අලුතින් එකතුවිය. මේවා අතර, අණ හා පාලන හා පරිපාලන කටයුතු ඉටු කිරීමේදී කාර්‍යක්‍ෂමව හා ඵලදායිතාවකින් යුතුව ඉටකිරීමේ ඉතා භාරදූර වගකීමක් අප ඉදිරියේ පවතී.

විශේෂයෙන් සෙබළුන්ගේ වැටුප් හා ලේඛණ සම්බන්ධ කාර්‍යයේදී හා භඩ කාර්‍ය සම්පාදනයේදී ඉතා ඉක්මනින් හා නිවැරදිව අදාළ දත්ත ලබාගෙන එය විශ්ලේෂණය කර අවශ්‍යතාවය අනුව තොරතුරු ලබාදීම යම් ස්ථානයකට සීමාවී ඇති නිසා එම සේවය ලබාගැනීම සඳහා යම්කිසි කාලයක් ගතවේ. එමගින් සෙබළුන්ගේ හා සමස්ථයක් වශයෙන් ගත හොත් ශ්‍රීලංකා යුධ හමුදාවේ කාර්‍යක්‍ෂමතාවය හා ඵලදායිතාව අඩුවන බව නිරීක්‍ෂණය වේ. එම නිසා යම් ස්ථානයක් මත මධ්‍ය ගතව ඇති තොරතුරු තාක්‍ෂණික සේවාවන් දීප ව්‍යාප්ත කිරීමේ අවශ්‍යතාවයක් පැනනගී.

**යෝජිත නව පරිගණක ජාලය**

යුධ හමුදා අණ පාලන හා පරිපාලන කටයුතු ඉතාමත් කාර්‍යක්‍ෂමව හා ඵලදායිතාවයකින් ඉටුකිරීම සඳහා මෙම නව යෝජිත පරිඝණක ජාලය භාවිතා කිරීමට හැකි අතර, එමගින් අනවශ්‍ය ලෙස වැය වන ලිපිද්‍රව්‍ය, ඉන්ධන හා වඩා වැදගත් වන මානව ශ්‍රමය ඉතිරි කර ගත හැකි වන අතර, ඒවා නැවත ඵලදායි කාර්‍යයන් සඳහා භාවිතා කළ හැක. එම පරිඝණක ජාලය ස්ථාපනය කිරීම අධියර 05 කින් සිදු කෙරෙන අතර, එම අධියරයන් පහත සඳහන් පරිදි දැක්විය හැක.

**පළමු අධියරය**

**දිවයින ආවරණය වන පරිදි ප්‍රධාන ජාලය ස්ථාපනය කිරීම**

මෙම අධියරයේදී රේඩියෝ රිලේ (RR) ජාලයට සමගාමී ප්‍රධාන ජාලය ස්ථාපනය කරන අතර, බෙදා හැරීමේ ස්ථාන (Distribution Point) සහ නිම කිරීමේ ස්ථාන (Terminate Point) එයට ඇතුළත් වේ.

**දෙවන අධියරය**

ආසේමු, සේමු, බසේමු, යන මූලස්ථාන තුළ පරිගණක ජාල පිහිටුවීම මෙම අධියරයේදී එක් එක් ආයතන තුළ නව පරිගණක ජාලයන් ස්ථාපනය කිරීමත් තිබෙන පරිගණක ජාලය යාවත්කාලීන කිරීමත් සිදුකරනු ලබයි.

**තෙවන අධියරය**

ඉහත සඳහන් යුධ හමුදා මූලස්ථාන වල පවතින පරිගණක ජාල ප්‍රධාන පරිගණක ජාලය හා සම්බන්ධ කිරීම.

මෙම අධියරයේදී ප්‍රධාන ජාලයේ ඇති බෙදාහැරීම් ස්ථාන මගින් අදාළ මූලස්ථාන වන ස්ථාපිත කර ඇති පරිගණක ජාලය හා සම්බන්ධ කරන අතර, මූලස්ථාන එකිනෙක සම්බන්ධ වීමේ හැකියාවක් ඇති කරයි.

**සිව්වන අධියරය**

දත්ත සම්ප්‍රේෂණයට අමතරව තවත් සේවාවන් සඳහා ජාලය සඳහා භාවිතා කිරීම.

මෙම ජලයේ ප්‍රධාන අරමුණු දත්ත සම්ප්‍රේෂණය වුවද එයට අමතරව වීඩියෝ සම්මන්ත්‍රණ නිරීක්‍ෂණ කැමරා දුරකථන සංවාද සඳහාද භාවිතා කිරීම.

**පස්වන අධියරය**

**දත්ත මධ්‍යස්ථානයක් පවත්වාගැනීම**

ලෝකයේ පවතින නව සංකල්පයක් වන දත්ත මධ්‍යස්ථාන (Date Center) පිහිටුවා යුධ හමුදාවේ මෙහෙයුම් හා පුහුණු, භකාස, පාලන කටයුතු වල වැදගත් හා අත්‍යවශ්‍ය දත්ත මෙහිදී ගබඩා කර තබනු ඇත. මෙසේ දත්ත ආරක්‍ෂා කිරීම ගබඩා කර තැබීමෙන් අවශ්‍ය වූ විට එම දත්ත විශ්ලේෂණය කර අවශ්‍ය ආකාරයට අවශ්‍ය පුද්ගලයාට ලබාදිය හැකි වේ.

**සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්.**

**මෘදුකාංග නිර්මාණය කිරීම හා දියුණු කිරීම.**

යුධ හමුදාවේ යම් යම් ශාඛා වලට හා අධ්‍යක්‍ෂ මණ්ඩල වලට අවශ්‍ය කරන පරිගණක වැඩසටහන් මේ වන විටත් යුධ හමුදා පරිගණක ඉන්ජිනේරුවන් විසින් ඉදිකරන අතර, බොහෝමයක් පරිගණක වැඩසටහන් මේ වන විටත් අදාළ ශාඛාවල සාර්ථකව ක්‍රියා කරමින් පවතී.

**පරිගණක ජාල සේවාවන්**

ප්‍රධාන පරිගණක ජාලය හා මූලස්ථාන තුළ පවතින පරිගණක ජාලයන්ද යුධ හමුදාවේ පරිගණක ඉන්ජිනේරුවන් විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන අතර, පරිගණක ජාලයේ නඩත්තුව හා පුහුණු කිරීමේ කටයුතුද ඔවුන් විසින් සිදුකරනු ලබයි.

**වීඩියෝ සම්මන්ත්‍රණ සේවාවන්**

ලොව ප්‍රකට මයික්‍රෝසොෆ්ට් සමාගමේ මෘදුකාංගයක් මේ සඳහා භාවිතා කරනු ලබන අතර, යුද හමුදාව ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථායට අනුයුක්තව රාජකරි කරනු ලබන මෘදුකාංග ඉන්ජිනේරුවන් එය යුධ හමුදා ක්‍රියාපිළිවෙතට අනුව ගැලපෙන ආකාරයෙන් සකස් කර ඇත.

ආචාර්ය ටී ද සිල්වා BIT(Hons), MIT(Mgt), PhD, MCP, MACS
ලුතිතන් කර්නල්
තොරතුරු තාක්‍ෂණ ප්‍රධානි

# මංගල සීනු



ඕ/65941 කපිතාන් එච්වස්වස් මුතුගල
2009.03.13 දින එන්එම් මනෝජා
සුදර්ශනී විජේමාන්න මෙනෙවිය සමඟ
අතිනතගත් දිනයේ



ලුතිතන් එන්ඩී සංජීව 2009.01.22
දින තරංගා බොතේජු මෙනෙවිය
සමඟ අතිනතගත් දිනයේ



මේජර් එම්ආර්එම්ආර්එල්බී
මීගස්තැන්න 2009.09.07 දින රම්‍ය
දිසානයක මෙනෙවිය සමඟ
අතිනතගත් දිනයේ



කපිතාන් ආර්එම්ඒඑස් අකලංක
2009.09.28 දින ජනිතා මෙනෙවිය
සමඟ අතිනතගත් දිනයේ




කපිතාන් ඩබ්ආර්එන් මුනිරත්න
2009.05.21 දින අමාලි මෙනෙවිය
සමඟ අතිනතගත් දිනයේ




සෙ/800077 ලාකෝ තිලකරත්න
ටීඑස්එස්කේ
2009.06.05 දින චාන්දනි මෙනෙවිය
සමඟ අතිනතගත් දිනයේ



සෙ/800144 ලාකෝ විතාන
එස්ජේපී
2009.05.14 දින එම් පිවනී
කරුණාරත්න මෙනෙවිය සමඟ
අතිනතගත් දිනයේ



ලාකෝ අධිකාරි ඒඑම්පීකේ
2009.01.05 දින පී. දිලානි
නිසංසලා මෙනෙවිය සමඟ
අතිනතගත් දිනයේ



ලාන්ස් කෝප්‍රල් ගුණරත්න ඩීඑම්
2009.06.04 වන දින එස් ශාන්තී
හෙළගෙදරගේ මෙනවිය සමඟ
අතිනතගත් දිනයේ

# Power Behind the GREEN




SIGNALLER

